ෆ්‍රෙඩරික් බැස්ටියාට් - **FRÉDÉRIC BASTIAT**

1850 දී ලියන ලද

# නීතිය



සිංහල පරිවර්තනය අරුණි ශපීරෝ වෙතින්

නීතිය විපර්යාස කර ඇත! ඒ සමඟින් පොලිස් බලය ද විපර්යාස කර ඇත! මා කියන්නේ, නීතිය, එහි නිසි අරමුණ ඉටුකිරීම වෙනුවට හාත්පසින්ම ඊට පටහැනි අරමුණ වෙනුවෙන් යොදාගෙන ඇතැයි කියාය! සෑම කෑදරකමක් සඳහාම මුල්වෙන අවිය බවට පත්ව ඇත්තේ නීතියයි! අපරාධ විමසීම වෙනුවට, එය විසින් දඬුවම් දිය යුතු වූ දුෂ්ටත්වයට දැන් එය වරදකරුවාවී ඇත! මෙය සත්‍යයක් නම්, එය අතිශය වැදගත් වූවකි, මගේ සෙසු පුරවැසියන්ව මේ ගැන දැනුවත් කිරීම මගේ ආචාර ධාර්මික වගකීමයි.

ක්ලෝඩ් ෆ්‍රෙඩරික් බැස්ටියාට් (1801-1850) ප්‍රංශ ජාතිකයෙකි. හෙතෙම සම්භව්‍ය ලිබරල් න්‍යායවාදියෙක්, දේශපාලන අර්ථශාස්ත්‍රඥයෙක්, සහ ප්‍රංශ රාජ්‍ය සම්මේලනයේ සාමාජිකයෙක් ද වූයේය. ආවස්ථික පිරිවැය නම් ආර්ථික සංකල්පය සහ කැඩුණු ජනේලයේ උපමාව යන සත්‍යය ඔහු විසින් දායාද කරන ලද්දේය.

නීතිය ගැන ලියා ඇති මේ පොත් පිංච ඔහුගේ කෘති අතර වැඩියෙන්ම සුප්‍රසිද්ධ වූවයි. එහි ප්‍රස්තුතය ලොව සදාතනික සත්‍යයක් නිසා, මෙය කියැවීම සෑම පුරවැසියෙක් විසින්ම කළ යුතුවූ කාර්යයකි.

දකින දැයත් නොදකින දැයත් (ඔහුගේ ලිපියක ශීර්ෂය එයයි) සියල්ල සලකා බැලීම අර්ථශාස්ත්‍රයේ කාර්යය වේ යැයි ඔහු කියා සිටියේය. එය අර්ථශාස්ත්‍රයට පමණක් නොව ජීවිතය ජයගන්නටද උපකාර වෙන සදාතනික සත්‍යයකි.

# ජීවය දෙවියන්ගෙන් ලැබුන තෑග්ගකි

දෙවියන්ගෙන් අපට ලැබී තිබෙන තෑග්ගේ අනිත් සියලුම තෑගි අඩංගුයි. අපට ලැබී තිබෙන මේ තෑග්ග නම් කායික, බුද්ධිමය හා ආචාර ධාර්මික -ජීවිතයයි.

ජීවයක් ලැබුණ පමණින් ජීවත්විය නොහැක. ඒ නිසා ජීවයේ නිර්මාතෘවරයා අපට එය ආරක්ෂා කරගැනීමට, වර්ධනයට, සර්ව සම්පූර්ණ කරගැනීමට වගකීමක් පවරා ඇත. ඒ සඳහා අපූර්ව වූ හැකියාවන් ගණනාවක් ද අපට දායද කර ඇත. අපිව අනේක වූ ස්වභාවික සම්පත් අතර උපදවා ඇත. අපේ අපූර්ව වූ හැකියාවන් මේ අනේක වූ ස්වභාවික සම්පත් උදෙසා භාවිතා කළ විට අපිට ඒවායෙන් නිෂ්පාදන බිහිකර අපේ යහපත පිණිස පාවිච්චියට ගත හැකිය.

උපන්දා සිට මිය යනතෙක් මිනිසා නිරත වෙන්නේ මෙම ක්‍රියාවලියේය.

ජීවිතය, හැකියාවන්, නිෂ්පාදන - තවත් විදියකින් කියනවා නම්, ඒකීය පුද්ගලයා, නිදහස, දේපල- යනු මිනිසාය. උදාර චේතනා ගැන පාරට්ටු බාන වාග් කෞශල්‍යයෙන් යුතු වූ දේශපාලනඥයන් මොනවා කිව්වත්, දෙවියන්ගෙන් ලැබී ඇති මේ ත්‍යාග තුන අභිබවා වෙනස් මගක යන්නට කිසිම මිනිස් ව්‍යවස්ථාදායෙකුට නොහැකිය. මන්ද ජීවිතය, නිදහස, දේපල පවතින්නේ මිනිසා නීති හදන ලද නිසා නෙමෙයි. මුලින් ජීවිතය, නිදහස, හා දේපල පැවති නිසා මුල්ම නීති සම්පාදනය කිරීමට මිනිසාට හැකිවිය.

# නීතිය යනු කුමක්ද?

එහෙනම්, එවිට නීතිය යනු කුමක්ද? එය, ඒකීය පුද්ගලයෙකුගේ අයිතිය නීතිමය ලෙසින් ආරක්ෂා කරන සාමූහික සංවිධානයකි.

අපි සෑම කෙනෙකුටම දෙවියන්ගෙන් ලැබෙන ලද ස්වභාවික වූ අයිතිය නම් ඒකීය පුද්ගලත්වය, පෞද්ගලික නිදහස, සහ පෞද්ගලික දේපල ආරක්ෂා කරගන්නට ඇති අයිතියයි. මේවා ජීවිතයේ මූලික

අවශ්‍යකතා 3 යි. ඒවායෙන් එකක පැවැත්ම සම්පූර්ණයෙන්ම රඳන්නේ අනික් දෙකෙහි පැවැත්ම මතයි. අපේ ඉන්ද්‍රියයන් වනුයේ අපේ ඒකීය පුද්ගලිකත්වයේ ව්‍යාප්තියක් මිස වෙන කුමක්ද? අපේ දේපල නම් අපේ ඉන්ද්‍රියයන්හි ව්‍යාප්තියක් මිස වෙන කුමක්ද?

හැම අයෙකුටම තමාව, තම නිදහස, තම දේපල ආරක්ෂා කරගැනීමට අයිතියක් ඇත්නම් - තම බලය පාවිච්චියෙන් වුවද- එහෙම නම් එයින් කියැවෙන්නේ මිනිස් කණ්ඩායමකට මේ අයිතීන් නිතිපතා ආරක්ෂා කරගැනීමට සංවිධානය වීමට සහ එම සංවිධානය පවත්වාගෙන යෑමට අයිතියක්ද ඇතැයි කියාය. මේ අනුව සාමූහික අයිතියක සිද්ධාන්තය බිහිවේද්දී -එහි පැවැත්මට හේතුව නම් එහි නීත්‍යානුකූල බවයි- සාමූහික අයිතියක පදනම වෙන්නේ ඒකීය පුද්ගල අයිතියයි.

සාමූහික බලයකින් මේ සාමූහික අයිතිය ආරක්ෂා කරන කල, එහි අරමුණ වෙනුවෙන් කියා හෝ වෙනත් මෙහෙයක් වෙනුවෙන් කියා හෝ හිලව්වට වෙනත් කිසිම දෙයක් තර්කානුකූලව ආදේශ කරගත නොහැකිය.

ඉතින්, අයෙකු විසින් තවත් පුද්ගලයෙකුට, ඒ පුද්ගලයාගේ නිදහසට, එයාගේ පෞද්ගලික දේපලට, එරෙහිව බලය පාවිච්චි කිරීමට නීතිමය අවසරයක් නැති හෙයින්, එවිට -එම හේතුව නිසාවෙන්ම- නීතිමය වශයෙන් සාමූහික බලයක් පාවිච්චි කර ඒකීය පුද්ගලයෙක්ව, පුද්ගලයෙකුගේ නිදහස, පුද්ගලයෙකුගේ දේපල විනාශ කරන්නට යම් පුද්ගලයන්ට හෝ පුද්ගල කණ්ඩායමකට නොහැකියි.

ඉහත අවස්ථා දෙකේම, බලය පාවිච්චියෙන් ඊට පටහැනි වූව කරන්නට නීත්‍යානුකූල බවක් පිහිටුවා ගන්නේද එය බලය දූෂ්‍ය ලෙසින් යොදාගැනීමක් වෙයි. එවිට එය අපගේ ප්‍රස්තුතයට පටහැනි වූවකි. බලය අපට ලැබී ඇත්තේ අපගේ ඒකීය අයිතීන් ආරක්ෂා කරගැනීම සඳහාය. අපේ සහෝදරයන්ටද ලැබී ඇති ඒ අයිතීන්ම විනාශ කරන්නට අපට බලය ලැබී ඇතැයි සාහසික වෙන්නේ කවුරුන්ද? ඉතින් අනිත් අයගේ අයිතීන් විනාශ කර දමන්නට නීතිමය බලයක් ඇතිව, අප අතරෙන් වෙන්ව කටයුතු කරන්නා වූවෙකුට

නොහැකි නම්, එයින් තර්කානුකූලව කියැවෙන්නේ එම සිද්ධාන්තයම සාමූහික වූ බලයටත් බලපාන බව නොවේද? එය ඒකීය බලය සාමූහික වූ ලෙසින් සංවිධානයව ඇතැයි කියා පමණක් නොවේද?

මෙය සත්‍යයක් නම්, ඊළඟට කියන්නට වඩා පැහැදිලි වූ වෙනත් දෙයක් නැත: නීතිය යනු ස්වභාවික අයිතියකට නීතිමය ආරක්ෂාව සපයන සංවිධානයකි. ඒකීය ශක්තිය වෙනුවට සාමූහික ශක්තිය පමණක් යොදා ගැනෙන්නකි. මේ සාමූහික බලය කළ යුත්තේ එකම එක දැයකි. එනම් සාමූහික බලයෙන් වූ අය විසින් කළ යුත්තේ ද ස්වභාවයෙන් හා නීතිමය වශයෙන් අයිතිය ඇති ඒකීය බලයෙන් යුතු වූවන් ආරක්ෂා කරන දෑ පමණක් ආරක්ෂා කිරීමයි. එනම් පුද්ගලයන්ට, පුද්ගලික නිදහසට, පුද්ගලික දේපලට ආරක්ෂාව සැලසීමයි. ඔවුනොවුන්ගේ අයිතීන් පවත්වාගෙන යෑමට උදව් වීමයි. අප සියල්ලන්වම යුක්තියෙන් පාලනය කිරීමයි.

# යුක්ති සහගත සහ චිරස්ථායී ආණ්ඩුවක්

යම් රටක් මේ පදනම අනුව පිහිටුවා ඇත්නම්, මට පෙනෙන විදියට එම රටේ ජනතාව අතර දකින්නට ලැබෙන සිතුවිලි තුල මෙන්ම ක්‍රියාකාරකම් තුල ද සාමය රැකෙනු ඇත. මට පෙනෙන විදියට, මෙය ආරක්ෂා කරන රටකට ඉතාමත් සරල වූ, පහසුවෙන් පිළිගත හැකි වූ, අරපිරිමැස්මෙන් යුතු වූ, සීමිත වූ, පීඩනයක් නොමැති වූ, යුක්ති සහගත වූ, අයෙකුට හිතාගත නොහැකි තරම් චිරස්ථායී වූ ආණ්ඩුවක් ලැබෙනු ඇත. එහි දේශපාලන රාමුව කුමක්දැයි එවිට වැදගම්මකින් යුතු නොවූවකි.

එවැනි පාලනයක් යටතේ, සෑම පුද්ගලයෙක්ම වටහා ගන්නේ තම පැවැත්ම නිසා තමාට බාරවෙන සියලු වරප්‍රසාද සහ සියලු වගකීම් තමාගේ බවයි.

එවිට කිසිවෙකුට ආණ්ඩුව හා වාද කරන්නට අවශ්‍යතාවයක් නැත.

මන්ද, එවැනි පාලනයක දී පුද්ගලයාට ගෞරවයක් ලැබෙයි. ඔහුගේ ශ්‍රමය කැමති සේ පාවිච්චියට ගන්නට ඔහුට නිදහස ලැබෙයි. ඔහුගේ ශ්‍රමයෙන් ඔහු එකතු කරන ඵලය ඔහු කැමති අන්දමින් පාවිච්චි කරන අයිතියට ඉඩක් නොදී බලාත්කාරකමක් කරන අයගෙන් රජය පුද්ගලයෙක්ව ආරක්ෂා කරයි.

ශ්‍රමිකයා සාර්ථක වෙද්දී ආණ්ඩුවට පින් දෙන්නට අවශ්‍යතාවයක් නැත.

ශ්‍රමිකයා අසාර්ථක වෙද්දී, ඔහුගේ අභාග්‍ය හමුවේ ආණ්ඩුවට බනින්නට අවශ්‍යතාවයක් ද නැත.

ඉඩෝරයක් ආවත්, ගංවතුරක් ආවත්, ගොවියා ආණ්ඩුවට බනින හැදියාව එවිට නවතිනු ඇත.

අගය කළ නොහැකි ලෙසකින්, මෙසේ අපේ ශ්‍රමයට ඇති අපේ අයිතිය මේ සංකල්පය අනුව ආරක්ෂා කරදීමේ දී පමණක්, රජයක් පවතින බව අපි දැනගනිමු.

තව දුරටත් පැහැදිලි කරනවා නම්, පෞද්ගලික කටයුතුවලට ආණ්ඩුව ඇඟිලි ගහන්නේ නැතිවිට, උවමනාවන් සහ ඒවා සපුරා ගැනීම තාර්කික වූ ආකාරයකින් ඉටුවීම මිනිසා අතින් ස්වභාවික ලෙසින් සිද්ධ වේ.

එවිට දුප්පත් පවුල් බඩ පුරවා ගන්නට පෙර සාහිත්‍ය ඉගෙන ගන්නට වෑයම් කරන ආකාරය අපි දකින්නේ නැත. දුෂ්කර පළාත් හිළව්වට තබමින් නගරබද පළාත් දියුණුවෙනවා දකින්නේ නැත. නීති සම්පාදකයන්ගේ අනුවණ සැලසුම් නිසා මූලධනය, ශ්‍රමය, සහ ජනගහණය විස්ථාපනය වී තිබෙනවා දකින්නේ නැත.

අපේ පැවැත්මට අවශ්‍ය පදනම, රාජ්‍ය ඇඟිලි ගැසීම් නිසා ඇතිවෙන විස්ථාපනයෙන්, අවිනිශ්චිත බවටත් අවදානම් බවටත් පත්කරවයි.

මේ ක්‍රියාකාරකම් නිසා ආණ්ඩුවේ වගකීම් මහත් ලෙසින් වැඩිවී ආණ්ඩුවට ඉසිලිය නොහැකි තරමට කරදර වැඩිවේ.

# නීතිය සහමුලින් අයුතු ලෙසින් යොදා ගැනෙන සේ විපර්යාස වීම

නමුත්, අවාසනාවට, නීතිය යනු කිසිසේත්ම එහි නිසි කාර්යයට පමණක් සීමිත වූවක් නොවේ. ඉතින් එය එහි නිසි කාර්යය ඉක්මවා යද්දී, එය කිසිත් වැදගැම්මක් නැතිවූ හෝ වාද කරත හැකි ආකාරයකින් පමණකින් සිද්ධ නොවන්නේය. නීතිය සහමුලින් අයුතු ලෙසින් යොදා ගැනෙන සේ විපර්යාසයට පත්කරද්දී එය ඊට වඩා ඈතකට ගෙන ගොස් ඇත.

නීතියේ අරමුණම විනාශ කරන්නට එවිට නීතිය භාවිතා කරගෙන ඇත: නීතිය විසින් පවත්වාගෙන යා යුතු යුක්තිය සහමුලින් නැති කරන්නට එවිට නීතිය යොදාගෙන ඇත. නීතියේ ප්‍රධාන ඉලක්කය වූ, නීතිය විසින් ගෞරව කළ යුතු වූ අයිතීන් එවිට නීතිය විසින්ම සීමිත කර විනාශ කර දමා ඇත.

එවිට, නීතිය විසින් සාමූහික බලය පවරා ඇත්තේ පුද්ගලයන්, පුද්ගලයන්ගේ නිදහස, පුද්ගලයන්ගේ දේපල සූරාකන්නට ඉදිරියට එන තමනට රිසිසේ හැසිරෙන, කරන ක්‍රියාවන්ට කිසිත් දඬුවමක් නොලබන, හෘදය සාක්ෂියක් නැති අයටයි.

එවිට, නීතිය විසින්ම කොල්ලකෑම ආරක්ෂා කරන්නට කොල්ලකෑම අයිතියක් සේ තහවුරු කර තිබේ. එහි දී නීතිය නීත්‍යානුකූල ආරක්ෂාවට දඬුවම් දීම සඳහා නීත්‍යානුකූල ආරක්ෂාව අපරාධයක් බවට හරවා ඇත.

කෙසේද නීතිය මෙසේ විපර්යාසයට පත්කර ඇත්තේ? එහි ප්‍රතිඵල මොනවාද?

නීතිය විපර්යාසයකට පත්කර ඇත්තේ සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ වූ හේතු දෙකක බලපෑම නිසාය: අමන ගිජුබව සහ ව්‍යාජ පරාර්ථකාමයයි.

අපි පළමුවැන්න ගැන මුලින් කතා කරමු.

# මිනිස් ස්වභාවයේ මාරක දෝෂයක්

ආත්මාරක්ෂාව සහ ස්ව-සංවර්ධනය යන දෙකටම ඇති ඇල්ම සියලු මිනිසුන් අතර දකින්නට ඇති ප්‍රවණතාවයකි. සියලු දෙනාම, තමන්ට ඇති ඉන්ද්‍රියයන් කිසිත් සීමාවක් නොමැතිව භාවිතයට ගන්නටත්, තම ශ්‍රමයෙන් ලබාගන්න ඵලය තමනට රිසිසේ පාවිච්චියට නිදහසත් භුක්ති විඳින්නේ නම් එවිට සමාජයේ ප්‍රගතිය නොනැවතී, නොකැඩී, අසාර්ථක නොවී සැලසෙනු ඇත.

එහෙත් මිනිසුන් අතර දකින්නට හැකි තවත් ප්‍රවණතාවයක් ඇත. එනම්, හැකි වූ විටෙක ඔවුන් උත්සාහ කරන්නේ අනික් අය පාවිච්චියට ගනිමින් තමන් ජීවත්වෙන්නට සහ තම සෞභාග්‍යය උදාකරගන්නටයි.

මෙය සිතා නොබලා කරන හදිසි දෝෂාරෝපණයක් නොවේ. එසේම එය එන්නේ දොම්නසින් ඉන්න, දානමාන යනාදියට අකමැති අයෙක් වෙතින් ද නොවේ. මෙහි සත්‍යතාවයට ඉතිහාසය සාක්ෂි පෙන්වයි. නිරතුරුව වෙන යුද්ධ, මහත් ජන සංඛ්‍යාවක් සංක්‍රමණයවීම, ආගමික දඬුවම් පැනවීම, විශ්ව වහල්ක්‍රමය, වෙළඳාමේ ඇති කපටි සූත්තර සහ මොනොපොලි මෙයට උදාහරණ ලෙසින් දැක්විය හැකියි.

ඉහත ආශාවේ සම්භවය මිනිසත්බවේ ස්වභාවික ලක්ෂණයකි.

# දේපල සහ කොල්ලකෑම

සිය බුද්ධිමය සහ ශාරීරික ඉන්ද්‍රියයන් ස්වභාවික සම්පත් සඳහා නොනැවතී යෙදවීමෙන්, නැතහොත් නොනැවතී වෙහෙසන ශ්‍රමයෙන්

තම උවමනාවන් සපුරාගැනීමට සහ ජීවත්වීමට මිනිසාට හැකියි. දේපල බිහිවෙන්නට හේතු වූයේ මේ ක්‍රියාවලියයි.

එහෙත්, මිනිසෙකුට ජීවත්වෙන්නට සහ තම උවමනාවන් සපුරාගන්නට අනුන්ගේ ශ්‍රමයෙන් බිහිවූ නිෂ්පාදන උදුරා ගැනීමෙන් සහ ඒවා පාවිච්චියෙන් හැකි බවත් එවැනිම සත්‍යයකි. කොල්ලකෑම බිහිවෙන්නට හේතු වූයේ මේ ක්‍රියාවලියයි.

ඉතින්, දැන් මිනිසා යනු ස්වභාවයෙන්ම වේදනාව මගහරින හැදියාවෙන් යුතු වූවෙකි. ශ්‍රමය වෙහෙසීම යනු එහි අන්තර්ගත ස්වභාවයෙන්ම වේදනාකාරී වූවකි. ඒ නිසා කොල්ලකෑම, ශ්‍රමය වෙහෙසීමට වඩා පහසුවෙද්දී, මිනිසා නිරන්තරයෙන්ම කොල්ලකෑමට ඉදිරිපත් වෙනු ඇත. ඉතිහාසය මෙය මනාව පැහැදිලි කර ඇත. මේ කොන්දේසි යටතේ, ආගමකට හෝ සදාචාරයකට එය නතර කරනු නොහැකියි.

එහෙනම් ඉතින් කොල්ලකෑම නතර වෙන්නේ කොතැනකදීද?

එය නතර වෙන්නේ, ශ්‍රමය වෙහෙසනවාට වඩා ශ්‍රමය කොල්ලකෑම වැඩියෙන් වේදනාකාරී සහ වැඩියෙන් අනතුරුදායක වෙද්දීය.

එහෙනම්, එහි සාමූහික වූ ශක්තියෙන් නීතියේ බලය පාවිච්චිකර මෙම කොල්ලකෑමේ මාරක ප්‍රවණතාවය නතර කිරීම නීතියේ නිසි අරමුණ බව ප්‍රත්‍යක්ෂ වෙයි. නීතියේ බලය පාවිච්චි කළ යුත්තේ ශ්‍රමය කැමති පරිදි වෙහෙසීම නතර කිරීමට නොවේ. නීතියේ සෑම නිර්දේශයක්ම කළ යුතු වන්නේ දේපල ආරක්ෂා කරමින් කොල්ලකෑමට එරෙහිව දඬුවම් දීමටයි.

එහෙත්, සාමාන්‍යයෙන් නීතිය සම්පාදනය වෙන්නේ එක් මිනිසෙකු හෝ මිනිස් පංතියක් වෙතිනි. ප්‍රමුඛත්වය ගන්නා බලයක අවසරය සහ අනුබලය නොමැතිව නීතියට කටයුතු කළ නොහැකියි. ඒ නිසා මේ බලය පැවරෙන්නේ නීති සම්පාදනය කරන අයටයි.

මේ සාධකය සමඟින් අඩුම වෙහෙසකින් තම උවමනාවන් පිරිමසා ගන්නට ඇති මාරක ප්‍රවණතාවය මිනිසාගේ හදවතේ ඇති නිසා, ලෝක මට්ටමෙන් නීතිය විපර්යාසයට පත්වෙන ආකාරය පැහැදිලි වෙයි. එහෙයින් නීතිය විසින් අයුක්තිය විමසා බලනවා වෙනුවට එය අයුක්තියේ පරාජය කළ නොහැකි වූ අවියක් වෙන ආකාරය පහදාගත හැකියි. එසේම, ව්‍යවස්ථාදායකයා විසින් නොයෙකුත් මට්ටම්වලින් නීතිය උල්ලංඝනය කරමින් නිවහල්ව තම පෞද්ගලික ස්වාධීනත්වය තහවුරු කරගන්නටත්, ප්‍රජා පීඩනයෙන් තමන්ගේ නිදහස ආරක්ෂා කරගන්නටත්, කොල්ලකමින් තමන්ගේ දේපල වැඩි කරගන්නටත් කටයුතු කරයි. එමෙන්ම ඔහු නීතියේ බල මහිමය සෙසු ජනතාව අතර විනාශ මුඛයට යවන්නට යොදාගන්නා ආකාරයත් දැකිය හැකිය. මෙය සිද්ධ වෙන්නේ ව්‍යවස්ථාදායකයාගේ වාසිය පිණිසය. එය සිද්ධ වෙන්නේ ව්‍යවස්ථාදායකයා සතු බලයේ අඩුවැඩි බව අනුවය.

# නීත්‍යානුකූල කොල්ලකෑමේ උපහටයන්

තමන් උපහටයෙක් [victim] වෙද්දී එහි අයුක්තිය ගැන මිනිසා ස්වභාවයෙන්ම විරෝධතාවය දක්වයි. ඉතින් ව්‍යවස්ථාදායකයන්ගේ ලාබය පිණිස කොල්ලකෑම නීත්‍යානුකූල ලෙසින් සංවිධානය වෙද්දී, කොල්ලකෑමට ලක්වෙන සියලු වැසියන් මොනයම් හෝ මාර්ගයකින් -සාමකාමීව හෝ විප්ලවකාරීව- නීති සම්පාදන බලය අත්කර ගන්නට උත්සාහ කරති. ඔවුන්ගේ බුද්ධි මට්ටම් අනුව මෙසේ කොල්ලකෑමට ලක්වෙන ජනතාව විසින් දේශපාලන බලය අල්ලාගැනීම සඳහා අරමුණු එකක් හෝ දෙකක් යෝජනා කරනු ඇත.

එක්කෝ, ඔවුන් නීත්‍යානුකූල වූ කොල්ලකෑම නවත්තන්න යැයි යෝජනා කරනු ඇත.

නැත්නම්, තමන්ද එහි ලාභීන්වන්නට ඕනෑ යැයි යෝජනා කරනු ඇත.

නීත්‍යානුකූල කොල්ලකෑමට හසුවන බහුතර උපහටයන් අතර මේ දෙවැනි අරමුණ ඇති කොටස, තමන්ගේ වාරය ලැබී ව්‍යවස්ථාදායක බලය අල්ලගත්තාම, ඒ රටට උදාවෙන්නේ අහෝ, ඛේදයකි!

එය සිද්ධවෙන තෙක්, සුළු පිරිසක් විසින් බහුතරය නීත්‍යානුකූල ලෙසින් කොල්ලකති. එය ව්‍යවස්ථාදායකය සඳහා කිහිප දෙනෙකුට පමණක් වරම් ලැබී තිබෙන පරිසරයක දී දකින්නට ලැබෙන සාමාන්‍ය හැදියාවකි. එහෙත් සියල්ලන්ටම නීති සම්පාදනයේ යෙදෙන්නට අවස්ථාව ලැබෙද්දී, මිනිසුන් තම තමන්ගේ විසදෘශ වූ උවමනාවන් සපුරාගන්නට සොයන්නේ සියල්ලන්වම කොල්ලකන ආකාරයකි. සමාජයේ ඇති අයුක්ති මොනවාදැයි ගවේෂණයෙන් ඒවා මුලිනුපුටා දමන්නේ නැතිව, ඔවුන් මේ අයුක්ති සියල්ලටම සිද්ධවෙන අයුක්තියක් බවට පත්කරති. කොල්ලකෑමට හසුවූ පංතිය දේශපාලන බලය අල්ලාගත් සැනින් ඔවුන් නව නීති ගෙනෙති.

අලුතින් බලයට පත්වෙන අය ගෙනෙන අලුත් නීති යනු එතෙක් පැවති නීති වලින් තමන්ව කොල්ල කෑ අයගෙන් පළිගැනීම සඳහා වූ නීති බවට පත්වෙති. ඔවුන් නීත්‍යානුකූල කොල්ලකෑම ආලෝපනය [abolish] නොකරති. (මේ අරමුණ ඔවුනට නොමැති වූ බුද්ධියක් ඔවුන් වෙතින් ඉල්ලා සිටින්නකි.) ඉතින් ඒ වෙනුවට, සිය ස්වාර්ථයට පටහැනි වූවද, ඔවුන් උත්සාහ කරන්නේද තමනට කළින් සිටි ව්‍යවස්ථාදායකයන් සිද්ධ කළ නීත්‍යානුකූල කොල්ලකෑමේම යෙදෙන්නටය.

ඉතින් එසේනම්, යුක්ති සහගත පාලනයක් පැමිණෙන්නට පෙරතුව මෙසේ සියල්ලන්ම කෲර වූ පළිගැනීම් වලින් ගැහැට විඳ තිබීම - සමහරුන්ට තමන් තුල ඇති දුදන ගති ස්වභාවය නිසා, අනිකුත් අයට වෙන්නේ කුමක්දැයි පහදාගත නොහැකියාව නිසා- සිද්ධ වෙන්නටම අත්‍යාවශ්‍ය වූවක් ලෙසින් අයෙකුට පෙනී යන්නට හැකියි.

# නීත්‍යානුකූල කොල්ලකෑමේ විපාකය

කොල්ලකෑම ආයුධයක් කරගත් නීති පද්ධතියකට වඩා දරුණු වූ වෙනසක් සහ ඊට වඩා සාහික වූ විපාකයක් සමාජයකට හඳුන්වා දෙන්නට කිසිසේත් නොහැකිය.

මෙවැනි දූෂණයක් පසුපස එන විපාක මොනවාද? ඒවා විස්තර කරන්නට වෙළුම් ගණනාවක් ලියන්නට සිද්ධ වෙනු ඇත. ඉතින් අපිට වඩාත්ම වැදගත් කිහිපය ගැන පමණක් පෙන්වා දීමෙන් සැනසෙන්නට සිද්ධ වේ.

පළමුවෙන්ම, එයින්, යුක්තිය සහ අයුක්තිය අතර පැහැදිලි වූ වෙනස සියලු දෙනාගේම හෘදය සාක්ෂියෙන් මකා දමයි.

යම් තරමකට හෝ නීති පිළිපදින්නේ නැති සමාජයකට පවතින්නට නොහැකියි. නීතිවලට ගෞරවයක් දක්වන්නට නම් නීති ගෞරවාන්විත ඒවා විය යුතු කිරීම වඩාත් පහසු වූවයි.

නීතිය හා ආචාර ධර්ම එකිනෙකට පරස්පර වෙද්දී, පුරවැසියා මුහුණ දෙන්නේ කෘෘර වූ විකල්ප වලටයි. එක්කෝ ඔහු තම ආචාරධාර්මික හැදියාව පාවා දෙයි. නැත්නම් ඔහු නීතියට ඇති ගෞරවය බැහැරලයි. මේ දුෂ්ට අන්ත දෙක එක හා සමාන විපාක වලින් යුතුය. ඒවායෙන් වඩා බරපතල කුමක්දැයි තෝරාගන්නට අයෙකුට අපහසු වනු ඇත.

නීතියේ ස්වභාවය වන්නේ යුක්තිය නඩත්තු කිරීමයි. මෙය කොතරම් තදින් මිනිසුන්ගේ සිත්වල සනිටුහන්වී ඇත්දැයි කිවහොත්, බහුතරයක් හිතන්නේ නීතිය සහ යුක්තිය යනු එකම එක දෙයක් යැයි කියායි.

නීත්‍යානුකූල වූ ඕනෑම දෙයක් යුක්ති සහගත යැයි කියා ඒ නිසා අප සියල්ලන් තුල දැඩි හුරුවක් පැළපදියම්ව ඇත. මේ විශ්වාසය කොතරම් සමාජය පුරා පැතිර ඇත්දැයි කිවහොත්, බොහෝ අය දෝෂ සහගතව පිළිගෙන සිටින්නේ යම් යම් දෑ ‘යුක්ති සහගත’ වෙන්නේ ඒවා නීති මඟින් එසේ කරන ලද නිසා කියායි. එවිට ඉතින්, කොල්ලකෑම යුක්ති සහගත සේ පෙන්වා දෙන්නට නම්, එය බහුතර හෘදය සාක්ෂියට පූජනීය වූවක් කරවන්නට නම්, එවිට අවශ්‍ය වෙන්නේ නීතියක් ප්‍රකාශයට පත්කර ඊට අවසරය දීම පමණකි. වහල් ක්‍රමය, සම්බාධක, මොනොපොලි සඳහා පෙනී සිටිනවුන් ඒවායෙන් ලාබ ලබන අය පමණක්ම නොවෙති. ඔවුන් ඒවායෙන් දුක් විඳින අයත් වෙති.

# අනනුකූලයන්ගේ (non-conformists) ඉරණම

මෙම උත්සාහවල ඇති ආචාර ධර්ම ගැන ඔබ සැකයක් ඉදිරිපත් කරන්නේ නම්, එහි දී "ඔබ අනතුරුදායක නවෝත්පාදකයෙක්, මනෝරාජ්‍යයක වාසය කරන්නෙක්, න්‍යායවාදියෙක්, කඩාකප්පල්කාරයෙක්; සමාජයේ අත්තිවාරම බිඳදමන්නට හදන අයෙක්," යැයි ප්‍රගල්භ ලෙසින් ඔබ ගැන කියනවා ඔබට ඇසෙනු ඇත.

ඔබ ආචාර ධර්ම ගැන හෝ දේශපාලනය ගැන දේශනයක් කරන්නේ නම්, මේ ආකාරයේ සිතුවිලි වලින්, නොයෙකුත් නිලතල ඇති සංවිධාන විසින් ආණ්ඩුවට පෙත්සම් යවනු ඇත: "මෙතෙක් කාලයක් කළා මෙන් නිදහස් වෙළඳාම (නිදහස, දේපල, යුක්තිය) පිළිබඳ දැක්මෙන් යුතුව පමණක් විද්‍යාව ඉගැන්විය යුතු නොවේ. අනාගතයේ දී ප්‍රංශ කර්මාන්ත නියාමනය කරන නීති සහ පරිසිද්ධි (නිදහසට, දේපලට හා යුක්තියට පටහැනි වූ පරිසිද්ධි සහ නීති) ගැන දැක්මෙන් යුතුව පමණක්ද විද්‍යාව ඉගැන්විය යුතුය. ආණ්ඩුව විසින් පිරිනමන ලද ගුරු තනතුරුවල දී යාන්තමෙන් හෝ දැනට පවතින නීතිවලට අගෞරවයක් සිද්ධ කරන, එය අන්තරායට පමුණුවන ඉගැන්වීමෙන් දැඩිසේ වැළකිය යුතුය." -කෘෂිකාර්මික සහ වානිජ්‍ය නිෂ්පාදකයන්ගේ මහා සභාව, 1850 මැයි 6 වැනිදා.

එසේ පරිදි, යම් ආකාරයකින් කෙරෙන වහල් ක්‍රමයකට සහ මොනොපොලියකට, ප්‍රජා පීඩනයකට සහ සොරකමකට අවසර දෙන නීතියක් පැවතියේ නම්, ඒ ගැන සඳහන් කිරීමෙන් පවා වැළකිය යුතුයි. මන්ද, එවිට එය විසින් උපදවන ගෞරවයට හානියක් නොකර ඒ ගැන සඳහන් කරන්නේ කෙසේද? තවත් දුරට යද්දී, අචාර ධර්ම හා දේශපාලන ආර්ථිකය ඉගැන්විය යුත්තේ නීතියේ දැක්ම අනුවය. එය නීතියක් වූ පමණින් එය යුක්ති සහගත වූ නීතියක් වෙන්නේ යැයි කීම සිද්ධ වෙන්නේ දැක්ම අනුව පමණි.

මෙසේ නීතිය විපර්යාසයට පත්වීමේ තවත් ඛේදනීය විපාකයක් නම් එයින් පොදුවේ දේශපාලනයටත්, දේශපාලන කාමයට හා අර්බුද වලටත් අතිශයෝක්තියෙන් පිරි වැදගත්කමක් ලැබීමයි.

තිරසාරව කරන මේ ප්‍රකාශ දහස් ආකාරයකින් ඔප්පු කරන්නට මට හැකියි. එහෙත් පෙන්වා දීමක් හැටියට මම මෑතක දී හැමෝගේම සිත් තුල රජයන ලද විෂයයක් උදාහරණයට ගන්නම්. එය සර්වජන චන්දයයි.

# කවුද විනිශ්චය කරන්නේ?

රූසෝගේ චින්තනය අනුගමනය කරන්නෝ -ඔවුන් හිතන්නේ ඔවුන් ඉතා ඉදිරියෙන් ඉන්නවා කියායි. එහෙත් මම ඔවුන්ව සලකන්නේ අදටත් වඩා ශතක විස්සක් පසුපසින් ඔවුන් ඉන්නවා කියායි- මේ ගැන ඔවුන් මා සමඟ එකඟ නොවනු ඇත. එහෙත් සර්වජන චන්දය -වචනයේ පරිසමාප්ත අර්ථයෙන් භාවිතයේ දී- පූජනීය ආධානග්‍රාහයක් නොවේ.

එය විචාරයට භාජනය කිරීම නිසා, සැකයට ලක් කිරීම නිසා, අපරාධයක් නොවන්නකි. ඇත්ත වශයෙන්ම, සර්වජන චන්දය ගැන දැඩි විරෝධතාවයන් දැක්විය හැකියි.

මුලින්ම සර්වජන චන්දය යන වචනය බරපතල දුර්මතයක් සඟවන්නකි. උදාහරණයක් ලෙසින් ප්‍රංශයේ මිලියන 36 ක ජනතාවක් වාසය කරති. ඉතින් චන්දය සර්වජන වෙන්නට නම් එහි දී මිලියන 36 ක චන්ද හිමියන් සිටිය යුතුයි. එහෙත් චන්දය ප්‍රකාශ කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති වැඩිම සංඛ්‍යාව මිලියන 9 ක් පමණි. හතරෙන් තුන් දෙනෙකුට එය අහිමියි. මීටත් වඩා සංඛ්‍යාවක් හතරවැන්නා විසින් පැත්තකට දමා ඇත. ඒ හතරවැන්නා විසින් අනිකුත් අයට වරම් නොදෙන හේතුව ඔවුන්ගේ අයෝග්‍යතාවය යැයි සිද්ධාන්තයක් ඉදිරිපත් කරන හෙයිනි.

සර්වජන චන්දය යැයි කියන්නේ, එසේ නම්, යෝග්‍ය වූවන්ට පමණක් ලැබෙන සර්වජන චන්දයකි. ඉතින් මේ ගැන ගැටළුවක් ඇත. කවුද යෝග්‍ය වූවන්? අයෝග්‍ය අය යැයි විනිශ්චයක් ලැබී ඇත්තේ බාලයන්,

ස්ත්‍රීන්, උන්මත්තකයන්, බරපතල අපරාධ කරන ලද්දවුන්, යනාදීන්ට පමණක්ද?

# චන්දයට සීමා පැනවී ඇති හේතුව කුමක්ද?

මේ විෂය ගැන වඩාත් සුපරීක්ෂාකාරීව සොයා බලද්දී අපිට පෙනී යන්නේ, චන්දයට ඇති අයිතිය පදනම්ව ඇත්තේ අයෝග්‍යතාවය නම්වූ අභ්‍යුපගතය මත බවයි. චන්ද හිමියාගේ අභිප්‍රාය වනාහී මේ අයිතිය තමන් වෙනුවෙන් පමණක් පාවිච්චි කරන අයිතියක් නොවන්නේය, එය සියල්ලන් වෙනුවෙන් පාවිච්චි කරන්නා වූ අයිතියක් වන්නේය හැටියට එහිදී සැලකේ.

වැඩිම ජනගහණයකට චන්ද හිමිකම දෙන ක්‍රමය සහ අඩුම පිරිසකට චන්ද හිමිකම දෙන සැලැස්ම මේ ආකාරයෙන් බලද්දී එක ආකාරයේම ඒවා වෙති. ඒවා වෙනස් වෙන්නේ අයෝග්‍ය වූවන් කවුදැයි කියා තීරණය කරන ක්‍රමය අනුව පමණි. එය මූල දර්ශය ගැන ඇති වෙනසක් නොව කොතරම් ප්‍රමාණයකටදැයි අනුව වෙනස් වෙන්නක් පමණි.

අද සිටින අපේ ග්‍රීක සහ රෝම චින්තනයේ ජනරජවාදීන් මවා පාන ආකාරය අනුව සර්වජන චන්දය නම් උප්පත්තියේ දී ම ලැබෙන්නක් නම්, එහෙනම් එවිට, වැඩිහිටි කාන්තාවන්ට හා දරුවන්ට චන්දය අහිමි කිරීම අයුක්තියකි. ඇයි ඔවුන්ට චන්දය අහිමි කර ඇත්තේ? ඒ ඔවුන් අයෝග්‍ය යැයි උපකල්පනය කර ඇති නිසායි. ඇයි අයෝග්‍ය බව එය නොලැබීමට හේතුවක් වෙන්නේ? මන්ද එවිට, එහි විපාක වලින් පීඩාවට පත්වෙන්නේ චන්ද හිමියා පමණක් තනිවම නොවෙයි. ඒ හැම චන්දයක්ම එම ප්‍රජාවේ සිටින සෑම අයෙකුගේම ජීවිතයට බලපෑමක් කරන නිසයි. මන්ද, යම් ප්‍රජාවක සිටින සෑම අයෙකුටම තම සුබ සාධනය හා පැවැත්ම ගැන ගන්න තීරණ වලට ආරක්ෂාව ඉල්ලා සිටීමට අයිතියක් ඇති හෙයිනි.

# විසඳුම නීතිය සීමා කිරීමයි

මෙයට පිළිතුරු වශයෙන් කියනු ඇත්තේ මොනවාදැයි මම දනිමි. විරෝධතාවයන් වනු ඇත්තේ මොනවාදැයි මම දනිමි. එහෙත් මෙතැන මතවාදයක් විමර්ශනයට සුදුසු තැන නොවේ. මම මෙහි දී සිදුකළේ ආණ්ඩු පෙරළන, උද්ඝෝෂණ ඇති කරන, කලබල ගෙනෙන, සර්වජන චන්දය ගැන (අනෙක් දේශපාලන ප්‍රශ්න සේ ම) පැන නැඟී ඇති මතවාදය තුලදී, නීතිය හැමදාම ක්‍රියා කළ ආකාරයෙන් ක්‍රියාවට නැඟෙන්නේ නම් එවිට එහි අන්තර්ගත මුළු මහත් වැදගත්කම නැතිවී යන බව පෙන්වීම පමණයි.

ඇත්ත වශයෙන්ම, නීතිය සෑම පුද්ගලයෙක්වම ආරක්ෂා කරන්නට, සියලු නිදහස, සියලු දේපල රකින්නට සීමා වෙන්නේ නම්, නීතිය යනු ඒකීය පුද්ගලයන් තම ස්වයං ආරක්ෂාව සලසා ගන්නවාට වඩා වැඩියෙන් ඉක්මවා නොයන්නක් පමණක් වෙන්නේ නම්, නීතිය යනු කොල්ලකෑමට සහ පීඩනයට බාධකයක් ලෙසින් පවතින්නක් නම්, එය සිද්ධ වෙනවාදැයි සොයා බලන්නක් නම්, ඊට එරෙහිව දඬුවම් පමුණුවන්නක් නම්, එසේ නම් එවිට එහි සීමාවන් ගැන පුරවැසියන් වන අපි මෙතරම් දිගින් දිගට වාද කරනු ඇත්ද?

මේ තත්වය යටතේ, චන්දයට ඇති අයිතිය කාට පමණක් ලැබෙන්නේදැයි තීරණය කරන්නට යෑම නිසා උපරිම හොඳ තත්වය වන සාමය අවදානමකට ඇද වැටෙයිද?

චන්දය අහිමිවූ පංතිවල අය තමන්ට චන්දයක් හිමිවන තුරා සාමකාමීව බලා සිටිනු ඇත්ද? චන්දය හිමිවූ අය තම වරප්‍රසාදය කුඩුකේඩු ලෙසකින් ආරක්ෂා කරන්නට ඉදිරිපත්වෙනු ඇත්ද?

නීතිය එහි නිසි කාර්යය වෙනුවෙන් සීමා කරන්නේ නම්, එවිට නීතිය ගැන සැමගේම උනන්දුව එක හා සමාන වෙනු ඇත. ඒ නිසා මෙවැනි තත්වයක් යටතේ, චන්දය ප්‍රකාශ කළ අය චන්දය ප්‍රකාශ නොකළ අයව අපහසුතාවයට පත් නොකරාවි යැයි පැහැදිලිවම කියත හැකිද?

# නීත්‍යානුකූල කොල්ලකෑම නැමති මාරක අදහස

එහෙත් තවත් පැත්තකින් විමසද්දී, කල්පනා කර බලන්න, මේ මාරක මූල ධර්මය හඳුන්වා දී ඇත්තේ සංවිධානාත්මක යැයි කියාපෑමෙන්, රෙගුලාසිකරණය, ආරක්ෂාව, දිරිගැන්වීම යටතේ කියා, එවිට නීතිය විසින් අයෙකුගේ දේපල ගෙන තවකෙකුට පිරිනමනවාය කියා, නීතිය විසින් සියල්ලන්ගේම ධනය අරගෙන සුළු පිරිසකට -ගොවියන්, කර්මාන්තකරුවන්, නැව් හිමියන්, කලාකරුවන්, විකටයන් වැනි- අයට පමණක් දෙනවාය කියා. ඒ තත්වය යටතේ එහෙනම්, හැම පංතියක්ම එවිට නීතිය කුමක්දැයි කියා වටහාගන්නට වෙහෙසෙනු ඇතැයි කීම තර්කානුකූලය.

අහිමි වූ පංති කෝපාවිෂ්ටව එවිට චන්දය ප්‍රකාශයට හිමිකම ඉල්ලා සිටිනු ඇත. එය නැතිව ජීවත්වෙනවාට වඩා සමාජය පෙරළා දමනු ඇත. හිඟන්නන් සහ රස්තියාදුකාරයන්ද එවිට චන්ද ප්‍රකාශ අයිතිය සඳහා අයිතියක් ඇතැයි ඔප්පු කරන්නට ක්‍රියා කරනු ඇත. ඔවුන් ඔබට මෙසේ කියනු ඇත: “අපිට බද්ද නොගෙවා වයින්, දුම්කොළ හෝ ලුණු මිල දී ගන්නට බැහැ. අපි ගෙවන බද්ද -වරප්‍රසාද සහ සහනාධාර යටතේ- අපිට වැඩියෙන් ධනවත් වූ මිනිසුන් වෙනුවෙන් නීතියෙන් ස්ථාපිත කරන ලද්දක්. අනිත් අය නීතිය පාවිච්චි කරමින් පාන්ගෙඩියේ, මස්වල, යකඩ නැත්නම් ඇඳුම්වල මිල වැඩි කරගන්නවා. ඉතින් අනිත් හැම කෙනෙක්ම තමන්ගේ වාසියට නීතිය පාවිච්චි කරද්දී, අපිත් කැමතියි අපේ ලාබය වෙනුවෙන් නීතිය පාවිච්චි කරන්නට. අපි නීතියෙන් ඉල්ලා සිටිනවා අපිට සහනාධාර අයිතියක්.

ඒක තමයි දුප්පත් මිනිසාගේ කොල්ලකෑම. මේ අයිතිය ලබාගැනීම පිණිස, අපිත් චන්ද හිමියන්, නීති සම්පාදකයන් විය යුතුයි. එවිට අපිට ප්‍රථුල ලෙසකින් හිඟනකම අපේ පංතිය වෙනුවෙන් සැලසුම් කරන්නට පුළුවනි. හරියට ඔබේ පංතිය වෙනුවෙන්, දැවැන්ත ආකාරයෙන් ඔබේ ආරක්ෂාව ඔබ සැලසුම් කර ඇති අන්දමටම. දැන් මේ හිඟන්නන් වූ අපිට කියන්න එපා ඔබ අපි වෙනුවෙන් වෙහෙසෙනවා කියල. ඊට පස්සේ මිමරෙල් මහතා කියූ පරිදි අපිව නිහඬ කරන්න අපිට ෆ්‍රෑන්ක් ලක්ෂ හයක් දීලා පැත්තකට විසිකරලා

දාන්න එපා. ඒක හරියට අපිට ලෑට් ගාන්නට මස් කටුවක් දෙනව වගේ. අපිට වෙනත් අයිතිවාසිකම් තියනව. කෙසේ වුවත් අපි කැමති අනිත් පංති ඔවුන් වෙනුවෙන් කේවල් කල ලෙසින් අපි වෙනුවෙන් අපි කේවල් කරන්නට!"

ඉතින් එවැනි තර්කයට පිළිතුරක් ලෙසින් ඔබ කියන්නේ කුමක්ද!

# විපර්යාසයට පත්වූ නීතිය ගැටුම් ඇති කරයි

නීතිය එහි සත්‍ය වූ අරමුණෙන් වෙනතක ගෙන යන බව පිළිගන්නේ නම් -දේපල ආරක්ෂාව වෙනුවට දේපලට හානි කරත හැකි යැයි කීම- එහෙනම් එවිට, නීති සම්පාදනයට සහභාගීවීමට සියල්ලන්ටම උවමනා වෙනු ඇත. එක්කෝ තමන්ව කොල්ලකෑමෙන් ආරක්ෂා කරගන්නට, නැත්නම් එය කොල්ලකෑම පිණිස යොදාගන්නට. දේශපාලන ප්‍රශ්න හැම විටම අගතිගාමී වනු ඇත. ඒවා වඩා වැදගත් බවකින් නිතර කතාබහට ලක්වනු ඇත. ව්‍යවස්ථාදායක මාලිගාවේ දොරටුව අසල සටන් හටගනු ඇත. එහි ඇතුලත හටගන්නා සටන් ඊට නොදෙවෙනි වනු ඇත. මෙය දැනගන්නට නම්, ප්‍රංශ සහ ඉංග්‍රීසි ව්‍යවස්ථාදායකයේ විමර්ශනයට භාජනය වෙන්නේ මොනවාදැයි සොයා බැලීමට අවශ්‍යතාවයක් ඇති නොවේ. වාද විෂය පථයන් වටහා ගැනීම පමණකින් උත්තරය දැන ගැනීමට හැකිවනු ඇත.

නීතයට කරන ලද මේ නින්දිත විපර්යාසය නිසා ද්වේෂයන්, අසමගියන් නිරතුරුවම රජයන බවටත්, ඒ නිසා සමාජයක් විනාශයට යන බවටත් සාධක ඉදිරිපත් කරන්නට අවශ්‍යතාවයක් ඇත්ද?

එවැනි සාධක අවශ්‍ය නම් බලන්න [1850 වසර] එක්සත් ජනපදය දිහා. නීතිය එහි නිසි විෂය පථය යටතේ සීමාකර තබන; සෑම පුද්ගලයෙකුගේම නිදහස සහ දේපල ආරක්ෂා කරන රටක් ලෝකයේ වෙන නැත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාජ ක්‍රමය දැඩි ස්ථාවර පදනමක තිබෙන බව පෙනේ. එහෙත් එක්සත් ජනපදයේ වුවත් වාද විෂයන් එහි මහජන සාමය අවදානමට ගෙනෙන්නට සූදානමින් ඇත.

# වහල් ක්‍රමය සහ තීරු බදු යනු කොල්ලකෑමයි

මේ වාද විෂයන් මොනවාද? ඒවා නම් වහල් ක්‍රමය සහ තීරු බදු වෙති. එක්සත් ජනපදයේ සාමාන්‍ය ජවයට පටහැනි වූ නීතිය විසින් කොල්ලකෑමේ යෙදෙන විෂයයන් දෙක මේවා වෙති.

වහල් ක්‍රමය නම් නීතිය අනුව නිදහස උල්ලංඝනයකි. තීරු බදු නම් නීතිය අනුව දේපල උල්ලංඝනයකි.

මේ නීතිමය අපරාධ ද්විත්වය -පරණ ලෝකයෙන් ආ දුක්බර උරුමය- යුනියනයේ පරිහානිය ඇති කරවන එකම වාද විෂයයන් වනු ඇත. නීතිය අයුක්තියේ ආයුධයක් බවට පත්ව තිබීම, එය සමාජයේ හදවත මැද්දේ මෙසේ හිරවී තිබීම තරම් විස්මයට පත්කරවන වෙනකක් නැත. ඉතින් එක්සත් ජනපදයට දරුණු විපාක ගෙනෙන්නට ඇත්තේ වහල් ක්‍රමය සහ තීරු බදු පමණක් නම්, එහෙම නම්, නීතිය විපර්යාසයට පත් කිරීම මූල ධර්මයක් වූ, සැලසුම් පද්ධතියක් වූ, යුරෝපයට ඇති විපාක මොනවා වෙයිද?

# දෙයාකාරයකින් කෙරෙන කොල්ලකෑම

ද මොන්ටේලම්බර්ට් මහතා (දේශපාලනඥයා සහ රචකයා) විසින් කාලියෙර් මහතා දැක්වූ සුප්‍රසිද්ධ සිතුවිල්ලක් සැලකිල්ලට ගනිමින් මෙසේ කියා ඇත: “අපි සමාජවාදයට එරෙහිව යුද්ධ ප්‍රකාශ කළ යුතුයි.” චාල්ස් ඩූපින් මහතා විසින් සමාජවාදය නිර්වචනය කර ඇති ආකාරය අනුව, මෙයින් ඔහු කියන්නේ “අපි කොල්ලකෑමට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළ යුතුයි,” කියායි.

ඉතින් ඔහු කියන කොල්ලකෑම කුමක්ද? කොල්ලකෑම නීතිමය සහ නීති විරෝධී වූ යන දෙයාකාරයකින් සිද්ධ වේ.

සොරකම, වංචාව -නීති පනත විසින් නීති විරෝධී යැයි සලකා දඬුවම් කරන- යන නීති විරෝධී වූ කොල්ලකෑම සමාජවාදය යැයි කියත

හැකි යැයි මා සිතන්නේ නැත. සමාජ පදනමට විධිමත් ලෙසින් අනතුරු ගෙනෙන්නේ මෙයාකාරයෙන් සිද්ධ වන කොල්ලකෑමෙන් නොවේ. කෙසේ වෙතත් එවැනි කොල්ලකෑමට එරෙහි යුද්ධ, මේ මහත්වරු විසින් නීති මඟින් ගෙනෙන තෙක් පුරවැසියන් බලාගෙන සිටියක් ද නොවේ. ලෝකයේ ආරම්භයේ පටන්ම නීති විරෝධී වූ කොල්ලකෑමට එරෙහි සටන් මෙහෙයවී ඇත. 1848 පෙබරවාරි අරගලයට ඉතා දිගු කලකට පෙර -සමාජවාදය යැයි අදහස් වූවක් හිස ඔසවන්නටත් පෙර කාලයක- ප්‍රංශය විසින් පොලීසිය, විනිසුරුවන්, පොලිස් භටයන්, සිරගෙවල්, ඇඳිරිගෙවල්, දඬුකඳ යනාදිය මේ නීති විරෝධී කොල්ලකෑමට එරෙහිව සටන් වදිනු සඳහා ස්ථාපිත කර තිබිණ. මේ යුද්ධය ගෙනයන්නේ නීතිය විසින්මයි. නීතිය සෑම විටම කොල්ලකෑමට එරෙහිව මේ ගත් ස්වභාවය පවත්වාගෙන යා යුතු යැයි මගේ මතය සහ පැතුම වෙයි.

## කොල්ලකෑම නීතිය විසින් ආරක්ෂා කරන කල

එහෙත් නීතිය හැමවිටම එසේ නොකරයි. සමහරවිට නීතිය කොල්ලකෑම ආරක්ෂා කරමින් සහ එහි නියැළෙමින් සිටියි. එයින් එසේ කොල්ලකන අයට ඇතිවන ලැජ්ජාවෙන්, අනතුරුවලින්, හෘද සාක්ෂියට මුහුණ දිය යුතු බවෙන් ඔවුන්ව නිදහස් කරනු ලබයි.

සමහරවිට නීතිය විසින් කොල්ලකරුවන්ට පොලීසිය, විනිසුරුවන්, සිරගෙවල් යනාදියේ සහාය ද ලබාදෙයි. තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරන උපහටයාව එවිට නීතිය විසින් අපරාධකරුවෙක් ලෙසට සලකයි.

කෙටියෙන් කියතොත්, නීතිමය කොල්ලකෑමක් යැයි කියා දෙයක් ඇත. ද මොනෙටිලම්බර්ට් මහතා කතා කරනුයේ මේ ගැන බවට කිසිදු සැකයක් නැත. නීත්‍යානුකූල කොල්ලකෑම ජනතාවගේ නීති සම්පාදක වෑයම්වල එකලී වූ පැල්ලමක් පමණක් විය හැකිය.

එහෙම නම් අවම ලෙසකින් කතා සහ ප්‍රකට චෝදනා පවත්වා -එයින් වාසි ලබන අයගේ විරෝධය නොතකා- එය මකා දැමීම කළ යුතුය.

# නීතිමය කොල්ලකෑම හඳුනාගන්නේ කෙසේද?

එහෙත් ඉතින් නීත්‍යානුකූල කොල්ලකෑම හඳුනාගන්නේ කෙසේද? ඉතා පහසුයි. බලන්න යම් නීතියක් අනුව යම් පිරිසකගෙන් ඔවුනට හිමිවූවක් අරගෙන එයට හිමිකමක් නැති තවත් පිරිසකට දෙනවාද කියා. බලන්න එය එක් පුරවැසියෙකුගේ වියදමෙන් තවත් පුරවැසියෙකුට (අපරාධයක නිරතවීමෙන් ලබාගත නොහැකි) වාසියක් ගෙනෙනවාද කියා.

එය දුටුවාම ඒ නීතිය කල් නොයවා ආලෝපනය කරන්න. මන්ද එය ස්වභාවයෙන්ම දුෂ්ට වූවක් පමණක් නොව, එය විසින් තවත් දුෂ්ට වූ නීති කැඳවාගන්නට සරු පසක් හදන්නකි. එවැනි නීතියක් -එය එකලී වූවක් විය හැකියි- ක්ෂණිකව ආලෝපනය නොකළ හොත්, එය පැතිර යනු ඇත. වැඩි වර්ධනය වෙනු ඇත. සැලසුම් පද්ධතියක් බවට හැරෙනු ඇත.

තමන් විසින් ලබාගත් අයිතීන් ආරක්ෂා කරගැනීම සඳහා මේ නීතියෙන් ලාබ ලබන්නා විසින් දැඩි පැමිණිලි ගෙනෙනු ඇත. තමාගේ විශේෂ කර්මාන්තයේ ආරක්ෂාව සහ දිරිය සපයන්නට රජය බැඳී සිටිනවා යැයි කියනු ඇත. දුප්පත් වැඩකරන ජනතාවට වැඩියෙන් පඩි ගෙවන්නට හැකියාව ලැබෙන නිසා මේ ක්‍රමයෙන් රජයටද වාසිදායක බව වැඩිවේ යැයි කියනු ඇත.

මේ ආකාරයෙන් ලාබ සොයන අයගේ වාග්කෞශල්‍යයට රැවටෙන්න එපා. මේ තර්ක පිළිගැනීම නිසා නීතිමය කොල්ලකෑමට ඉඩක් සම්පූර්ණ සමාජයේම විවෘත වෙනු ඇත. ඇත්ත වශයෙන්ම මෙය දැනටමත් පටන්ගෙන ඇත. අද පවතින මුලාව නම් සියල්ලන්ගේම වියදමෙන් සියල්ලන්වම වැඩියෙන් පෝෂිත කරන්නට හැකි යැයිද, ව්‍යවස්ථාදායකයන් ගන්නේ එයට උත්සාහයක් යැයිද කීමයි. එය සංවිධානය කරනවා යැයි ප්‍රෝඩාවකින් අද ඇත්තේ කොල්ලකෑම සර්ව නීතියක් කිරීමට ඇති උත්සාහයයි.

දැන්, මේ නිර්වචනය අනුව, සමාජවාදය නම් මතවාදයට එරෙහිව ගෙනෙන්නට හැකිවනුයේ එය යුධවාදී මතවාදයක් කියා මිසෙක වෙන කුමක්ද?

ඔබ මේ සමාජවාදී මතය වැරදි යැයි, හාස්‍යජනක යැයි, දුෂ්ට යැයි, කියා දකින්නේ නම්, සමාජවාදය ප්‍රතික්ෂේප කරන්න. වඩා වැරදි වෙද්දී, වඩා හාස්‍යජනක වෙද්දී, වඩා දුෂ්ට වෙද්දී, එය නිශ්ප්‍රභා කිරීම පහසු වෙනු ඇත. සියල්ලටම කලින්, ඔබ ශක්තිමත් වන්නට කැමැත්තේ නම්, ඔබේ ව්‍යවස්ථාදායකයට රිංගාගෙන ඇති සමාජවාදයේ සෑම අංශුවක්ම සොයා උදුරා දමන්න. මේක පහසු කාර්යයක් නොවනු ඇත.

# සමාජවාදය නම් නීත්‍යානුකූල කොල්ලකෑමයි

ද මොන්ටේලම්බර්ට් මහතාට දෝෂාරෝපණ එල්ලවී ඇත්තේ ඔහු සමාජවාදයට එරෙහිව සටන්වදින්නට ප්‍රචණ්ඩත්වය පාවිච්චි කරන්නට කැමැත්තේය කියායි. ඔහුව ඒ අවලාදයෙන් මුදවා හැරිය යුතුයි. මන්ද, ඔහු පැහැදිලිවම කියා ඇත්තේ මෙයයි: “සමාජවාදයට එරෙහිව වදින අපේ සටන, නීතිය, ගෞරවය සහ යුක්තිය සමඟ සුංසවාදයකින් සිද්ධ විය යුතුයි.”

එහෙත් ඇයි, ද මොන්ටේලම්බර්ට් මහතා තමන්ව විෂම චක්‍රයක ස්ථානගත කරගෙන ඇති බව නොදකින්නේ? ඔහු සමාජවාදය පරදවන්නට නීතිය පාවිච්චි කරගන්නට අදහස් කරමින් සිටියි. එහෙත් සමාජවාදය එහි පැවැත්ම සඳහා යොදාගෙන ඇත්තේද නීතියයි. සමාජවාදීන් කැමති නීත්‍යානුකූල කොල්ලකෑමටයි. නීති විරෝධී කොල්ලකෑමට නොවේ. සමාජවාදීන්, අනිකුත් සියලු මොනොපොලි රිසිවූවන් සේ ම, නීතිය තම අවිය කරගැනීමට කැමතියි. ඉතින් එවිට නීතිය තම සමාජවාදී පැත්තේ වූ විට, එවිට කෙසේද එය සමාජවාදයට එරෙහිව යොදාගන්නේ? කොල්ලකෑම සඳහා නීත්‍යානුකූල සහාය ලැබෙද්දී, එවිට ඔබේ උසාවියට බිය වෙන්නේ නැත. ඔබේ පොලිස් භටයාට බිය වෙන්නේ නැත. ඔබේ සිරගෙවල්වලට බිය වෙන්නේ නැත. එවිට සිද්ධ වෙන්නේ නීතිය ඒවායේ සහාය කැඳවීමයි.

මෙය වළක්වාගන්නට නම්, ඔබ සමාජවාදයට ව්‍යවස්ථාදායකයට ඇතුල්වෙන්නට නොහැකි අන්දමින් බාධා ගෙනෙනවාද? සමාජවාදීන්ට ව්‍යවස්ථාදායක මාලිගාවට ඇතුල්වෙන්නට ඉඩ නොදෙනවාද? ද මොන්ටේලම්බර්ට් මහතා, ඔබ සාර්ථක වනුයේ නැතැයි මම අනාවැකි කියන්නම්. ව්‍යවස්ථාදායකයේ ප්‍රධාන කාර්යය හැටියට නීත්‍යානුකූල කොල්ලකෑම පවතින තුරා සමාජවාදය තුරන් කිරීමට ඔබට ඉඩක් ලැබෙන්නේ නැත. එය එසේ සිදුනොවේ යැයි ඔබ සිතනවා නම් එය තර්කානුකූල නැත -එය සත්‍යයෙන්ම හාස්‍යජනකය-.

# අප ඉදිරියේ ඇති තෝරාගැනීම

නීත්‍යානුකූල කොල්ලකෑම පිළිබඳ ගැටළුව සදහටම නිරාකරණය කරගත යුත්තකි. එය නිරාකරණයට හැකි ආකාර ඇත්තේ 3 ක් පමණි:

1. සුළු කොටසක් විසින් බහුතරයක් කොල්ලකෑම
2. සියල්ලන් විසින් සියල්ලන් කොල්ලකෑම
3. කිසිවෙක් කිසිවෙක්ව කොල්ලකෑමෙන් වැළකීම

සීමිත කොල්ලකෑම, සර්ව කොල්ලකෑම සහ කිසිත් කොල්ලකෑමක් සිදුනොවීම යන තෝරාගැනීම් අප ඉදිරියේ ඇත. ඔබට නීතිමය ආරක්ෂාව දෙන්නට පුළුවන් මෙයින් එකක දී පමණි.

සීමිත නීත්‍යානුකූල කොල්ලකෑම: චන්දය හිමිකම සීමිත කරද්දී මේ ක්‍රමය පණාබේරා ගති. සමාජවාදයෙන් සිද්ධවෙන ආක්‍රමණයෙන් ගැලවෙන්නට අයෙක් නැවත මේ ක්‍රමයට පිවිසෙනු ඇත.

සර්ව නීත්‍යානුකූල කොල්ලකෑම: සර්වජන චන්ද වරම හිමිවූ දිනයේ පටන් අපිට මේ ක්‍රමයෙන් අනතුරු ඇඟවීම සිදුවෙයි. චන්දය සීමිත වූ කාලයේ දී තමන්ගේ පීඩකයන් විසින් කරන ලද්දා වූ නීතිමය කොල්ලකෑමේ යෙදෙන්නට අද පාලන බලය අල්ලාගෙන ඇති අලුත් බහුතරය නීති සම්පාදනය කරමින් සිටිති.

නීත්‍යානුකූල කොල්ලකෑමක් නොමැතිවීම: මෙය තමයි යුක්තියේ, සාමයේ, සමාදානයේ, චිරස්ථායී බවේ, සුසංවාදයේ හා තර්කයේ මූල ධර්මය වනුයේ. මගෙ මරණය සිද්ධ වෙන දිනය දක්වා, මම මේ මූල ධර්මය, මට හැකි තරම් මගේ පෙනහළුවල ශක්තියෙන් හඬ ගා කියන්නෙමි (අහෝ! එය ප්‍රමාණවත් නොවේ.) **මෙය ලියද්දී ෆෙඩරික් බැස්ටියාට් තමා ක්ෂය රෝගයෙන් පෙළෙන බව දැන සිටියේය. එම වසර තුලදී ඔහු මිය යන ලදි.

# නීතියේ නිසි කාර්ය භාරය

ඉතින් සියලු අවංක බැවින් විමසිල්ලට ගනිද්දී, නීත්‍යානුකූල කොල්ලකෑමෙන් ඉවත් වන්නට වඩා වැඩි යමක් නීතියෙන් ඉල්ලා සිටිය හැකිද?

නීතියට -බලය පාවිච්චි කරන්නට අවසර තිබීම අත්‍යාවශ්‍ය වූවක් වෙද්දී- හැකියාව ඇත්ද සියල්ලන්ගේම අයිතීන් ආරක්ෂා කරනවාට වඩා යමක් සිද්ධ කරන්නට?

මම අභියෝග කරනවා ඕනෑම අයෙකුට ඉහත අභිප්‍රායට ඔබ්බෙන් නීතිය ගෙන ගිහින් එය බලයක් බවට පත්ව අයිතීන් අහිමි කරන්නක් නොවන හැකියාවෙන් යුතු වූවක් යැයි කියා මට පෙන්වන්නට.

අයෙකුට සිතිය හැකිවූ වඩාත්ම අතාර්කික වූ ද, වඩාත්ම මාරාන්තික වූ ද, සමාජ විපර්යාසය නම් මෙයයි. එයට සත්‍ය විසඳුම නම් -සමාජ සබඳතා අතරින් සොයා ගන්නා ලද්ද- මේ සරල වදන් තුල අඩංගුව තිබෙන්න යැයි පිළිගත යුතුය: නීතිය යනු සංවිධානය කරන ලද යුක්තියයි.

දැන් මෙය කියන්නට අවශ්‍යයය. යුක්තිය යනු නීතිය විසින් සංවිධානය කරන ලද්දක් වෙද්දී -බලය යොදාගෙන- මෙහි දී නීතිය (බලය) කිසිම මිනිස් ක්‍රියාවලියක්, එනම් ශ්‍රමය, පුණ්‍ය කටයුතු, කෘෂිකර්මය, වානිජ්‍ය, කාර්මික, අධ්‍යාපනය, කලා කටයුතු හෝ ආගම් යනාදී

කිසිවක් සංවිධානය පිණිස යොදාගන්නේ නැතැයි කියා ගම්‍ය විය යුතුයි.

නීතිමය ලෙසකින් මේ කුමන කටයුත්තක් හෝ සංවිධානය වෙද්දී, එවිට අනිවාර්යයෙන්ම නීති පද්ධතියේ සාරය වූ යුක්තිය විනාශ මුඛයට යන්නේය. ඉතින් සත්‍යයෙන්ම, පුරවැසියන්ගේ නිදහසට පටහැනිව බලය යොදා ගැනීම යුක්තිය සලසන අභිප්‍රායට පටහැනි වූවක් නොවන ආකාරයෙන් කරන ලෙසක් අපිට කෙසේ සිතාගත හැකිද?

# සමාජවාදයේ චිත්තාකර්ෂණය

මෙහි මා ඉදිරියේ ඇත්තේ අපේ කාලයේ වඩාත්ම ජනප්‍රිය වූ දුර්මතයයි. නීති යුක්ත සහගත වීම පමණක් ප්‍රමාණවත් නැතැයි යන්න මේ දුර්මතයයි. නීතිය පරාර්ථකාමී විය යුතු යැයිද ඉල්ලා සිටියි. සෑම පුරවැසියෙකුටම නිදහස් බැවින් සහ අනුන්ට බාධා නොවන ලෙසින් තම ඉන්ද්‍රියයන්, කායික, බුද්ධිමය හා ආචාර ධාර්මික ස්ව-සංවර්ධනය පිණිස හසුරවන්නට ආරක්ෂාව සහතික කිරීම සඳහා පමණක් නීතිය ප්‍රමාණවත් නැතැයි යන්න මේ දුර්මතයයි. ඉතින් ඒ නිසා, නීතියෙන් ඉල්ලා සිටිනුයේ, සුබ සාධනය, අධ්‍යාපනය, ජාතියේ සදාචාරය පැතිරවීම සඳහාද එය ප්‍රසාරණය කරවීම අවශ්‍ය යැයි කියාය.

මෙය සමාජවාදයේ චිත්තාකර්ෂණයයි. මම නැවත කියමි: නීතියේ මේ භාවිතයන් දෙක එකිනෙක හා සහමුලින්ම පරස්පර විරෝධී වෙති. අපි ඒ දෙක අතරින් එකක් තෝරාගැනීම කළ යුතුයි.

පුරවැසියෙක්ට එකම අවස්ථාවේ දී නිදහස් බැවින් ඉන්නටත් වහල් බැවින් ඉන්නටත් නොහැකියි.

බලහත්කාරයෙන් ස්ථාපිත කරන සහෝදරත්වය නිදහස විනාශ කර දමයි.

ද මොන්ටේලම්බර්ට් මහතා මට වරක් මෙසේ ලියා එවීය: “ඔබේ දර්ශනය මගේ සැලසුමේ එක් කොටසක් පමණි. ඔබ නිදහස අසල නැවතී සිටියි. මා සහෝදරත්වය කරා යන්නට අදහස් කරමි.” ඉතින් මම මෙසේ පිළිතුරු ලියා යැව්වෙමි: “ඔබේ සැලසුමේ දෙවැනි කොටස යනු පළමු කොටස විනාශකර දමන්නකි.”

සත්‍යයෙන්ම, මට සහෝදරත්වය යන වචනය ස්වේච්ඡාව යන වචනයෙන් වෙන්කළ නොහැකියි. නිදහස යන්න නීත්‍යානුකූලව විනාශ මුඛයට පත් නොකර, යුක්තිය නීත්‍යානුකූල ලෙසින් පයට පෑගෙන්නට නොදී, නීත්‍යානුකූලව සහෝදරත්වය ස්ථාපිත කරනුයේ කෙසේද කියා මට කිසි ආකාරයකින් පහදාගත නොහැකියි.

නීත්‍යානුකූල කොල්ලකෑමේ ප්‍රභව දෙකකි. මම කළින් පැහැදිලි කර ඇති ආකාරයෙන්, එයින් එකක් ඇත්තේ මිනිසාගේ කෑදරකම තුළය. අනෙක ව්‍යාජ පරාර්ථකමය තුළ තිබෙන්නකි.

මේ අවස්ථාවේ දී මවිසින් කොල්ලකෑම යන වචනයෙන් අදහස් කරන්නේ කුමක්දැයි විස්තර කළ යුතු වේ යයි මම සිතමි.
**බැස්ටියාට් ඊට යොදන ප්‍රංශ වචනය spoliation යැයි සඳහන් අතර මෙහි ඉංග්‍රීසි පරිවර්තනයේ ඇත්තේ plunder යන්නයි.

# හිමිකම කඩාකප්පල් කරන්නේ කොල්ලකෑමයි

බොහොමයක් කරන ආකාරයෙන්, මම මේ වචනය අපැහැදිලි, අවිනිශ්චිත, සමීප හෝ ඖපචාරික අන්දමකින් යොදාගන්නේ නැත. මම එය භාවිතා කරන්නේ එහි විද්‍යාත්මක පිළිගැනීම අනුවයි. එනම්, දේපලට (වේතන, ඉඩකඩම්, මුදල් යනාදී ඕනෑම දෙයකට) එරෙහි වූ විරුද්ධ වචනය හැටියටයි.

අයිතිය ඇති පුද්ගලයාගේ වස්තුවෙන් කොටසක් -ඔහුගේ කැමැත්ත නැතිව සහ ඊට හිලව්වට යමක් නොදී, බලහත්කාරයෙන් හෝ ප්‍රෝඩාවකින්- අරගෙන එයට අයිතියක් නොකියන වෙන ඕනෑම

කෙනෙකුට දෙන්නේ නම්, එහි දී මම කියන්නේ දේපල කඩාකප්පල්කර ඇතැයි කියාය. කොල්ලකෑමක් සිද්ධවී ඇතැයි කියාය.

සෑම විටම, සෑම තැනක දී ම, නීතිය විසින් යටපත් කළ යුතු වූ, නිශ්චිතවම නිවැරදි ක්‍රියාව නම් කොල්ලකෑමට ඉඩ නොදීමයි. තමන් යටපත් කළ යුතු දැයෙහි නීතිය විසින් නියැළීම, මම කියන්නේ කොල්ලකෑමක් කියාය. එයට මා තවත් එකතු කරමින් මෙසේ කියමි, එසේ කිරීම සමාජයේ පොදු යහපත නාමයෙන් යැයි කියාගත්තාට එයින් ඵලක් නැති බවයි.

මන්ද, එහි දී අයිතීන් කොල්ලකෑම නිසා එය ඊට වඩා දරුණු වරදක් වෙයි. මේ නීතිමය කොල්ලකෑමේ දී, ලාබය ලබන පුද්ගලයා කොල්ලකන ක්‍රියාවේ වගකීම නොගනියි. නීත්‍යානුකූල කොල්ලකෑමේ වගකීම බාරවෙන්නේ නීතියටයි. සමාජයටයි. දේශපාලන අනතුරුදායක බව ඇත්තේ අන්න එතැනයි.

කොල්ලකෑම යන වචනය පිළිකුල් වූවක් වීම කණගාටුදායක කරුණකි. ඊට වඩා අප්‍රසන්න බැවින් අඩු වචනයක් සොයාගන්නට මම අපොහොසත් වීමි. විශේෂයෙන් දැන් මෙවැනි නොරිස්සුම් සහගත වචනයක් අපේ අසංමතිය ප්‍රකාශයට එකතුව ඇත. එහෙයින් ඔබ මාව විශ්වාස කළ ද, නොකළ ද, මා ප්‍රකාශ කර සිටින්නේ, සියල්ලන්ගේම ආචාර ධර්මයන්ට පහර දෙන්නට මට අරමුණක් නැතැයි කියායි. මම පහර දෙන්නේ අදහසකටයි. දෝෂ සහගත යැයි මම විශ්වාස කරන අදහසකටයි. අයුක්ති සහගත යැයි මම දකින ක්‍රමවේදයකටයි. මේ අයුක්ති සහගත වූ තත්වය කොතරම් ඒකීය පුද්ගල අරමුණුවලින් ස්වාධීනව පවතින්නේ දැයි කිවහොත් අපි සෑම කෙනෙක්ම එයින් ලාබ ලබන්නේ එයින් ලාබ ලබන කැමැත්ත ඇති නිසා නොවේ. අපි සෑම දෙනෙක්ම එයින් දුක් විඳින්නේ, දුකට හේතුව නොදැනයි.

# කොල්ලකන ක්‍රමවේද තුන

ආරක්ෂාවදය, සමාජවාදය, කොමියුනිස්ට්වාදය වෙනුවෙන් පෙනී සිටින අයගේ අවංක බව මෙහිදී ප්‍රශ්න කෙරෙන්නේ නැත. යම් රචකයෙක් එය කරන්නට යන්නේ නම් ඔහු දේශපාලන ජවයක් හෝ දේශපාලන බියකින් බලපෑමට ලක්ව ඇත්තෙකි. කෙසේ වුවද පෙන්වා දිය යුත්තක් නම්, ආරක්ෂාවාදය, සමාජවාදය, කොමියුනිස්ට්වාදය යනු හැදී වැඩෙන අවස්ථා තුනක වූ එකම පැලයක් බවයි.

නීත්‍යානුකූල කොල්ලකෑම සමාජවාදයේ දී පැහැදිලිවම දැකිය හැකි වනුයේ එය සම්පූර්ණ කොල්ලකෑමක් බැවිනි. ආරක්ෂාවාදයේ දී සිදුවන නීත්‍යානුකූල කොල්ලකෑම සමහර පිරිසකගෙන් පමණක් හා සමහර කර්මාන්ත කොටසකින් පමණක් කරන කොල්ලකෑමට සීමාවී තිබෙන්නකි.* එයින් කියැවෙන්නේ, මේ ක්‍රමවේද තුනෙන් සමාජවාදය තමයි ඉතාම අපැහැදිලි වූව. වඩාත්ම අවිනිශ්ත වූව.

ඉතින් ඒ නිසා එය තමයි වඩාත්ම අවංක ලෙසින් වැඩිවර්ධනය වන අවස්ථාව.

* තරඟයට එරෙහිව රජයේ ආරක්ෂාවදය ලැබීම විශේෂ වරප්‍රසාදයක් නම්, -මොනොපොලිය- ප්‍රංශයේ එක් කල්ලියකට පමණක් ලබාදෙන්නේ නම්, ඔවුන් යකඩ කර්මාන්තකරුවන් යැයි උදාහරණයකට කියමු, එවිට මේ ක්‍රියාව ඉතා පැහැදිලි ලෙසින් නීත්‍යානුකූල කොල්ලකෑම පිළිබිඹු කරන නිසා එවිට එයට වැඩි කාලයක් පවතින්නට හැකියාවක් ලැබෙන්නේ නැත. ඉතින් මේ හේතුව නිසා, අපි දකින්නේ ආරක්ෂාවාදය ලැබෙන සියලු කර්මාන්ත එකට එකතුකර පොදු වෑයමක් ලෙසින් ඉදිරිපත් කර ඇති ආකාරයයි. ඔවුන් එයාකාරයෙන් තමන්ව සංවිධානය කරගෙන ඇත්තේ සියලු ශ්‍රමිකයන් නියෝජනය වෙන බව පෙන්නුම් කරන්නටයි. සහජ වූ ලෙසකින් ඔවුන්ට දැනෙන්නේ එය සාමාන්‍යකරණය කරද්දී නීත්‍යානුකූල කොල්ලකෑම සැඟවී ඇතැයි කියායි.

අවංක වූවා හෝ නොවූවාට, පුද්ගලයාගේ අභිප්‍රාය මෙහි දී ප්‍රශ්න කෙරෙනුයේ නැත. මා දැනටමත් කියා ඇත්තේ, පරාර්ථකාමය යනු, එය

බොරු පරාර්ථකාමය වුවද, එය නීත්‍යානුකූල කොල්ලකෑමේ එක් පදනමක් බවයි.

ඉතින් මේ පැහැදිලි කිරීම් අනුව, අපි මේ ජනප්‍රිය වූ අදහසේ, පොදු ජනතාවගේ හිතසුව සලසනු පිණිස නීතිමය කොල්ලකෑම අගය කිරීමේ -සම්භවය සහ ප්‍රවණතාවය- විභාග කරමු.

# නීතිය යනු බලයකි

නීතියෙන් සංවිධානය වෙන්නේ යුක්තිය නිසා, සමාජවාදීන් අසන්නේ ශ්‍රමය, අධ්‍යාපනය, සහ ආගම සංවිධානය පිණිසත් නීතිය යොදාගන්නේ නැත්තේ ඇයි කියායි.

ඇයි මේ අරමුණු සාක්ෂාත් කරගනු පිණිස නීතිය යොදාගත නොයුත්තේ?

ඒ, යුක්තිය විනාශ මුඛයට යා නොදී නීතියට ඒවා සංවිධානය කළ නොහැකි නිසයි.

අපි මතකයේ තබාගත යුත්තේ නීතිය යනු බලයක් බවයි. ඉතින් එහි ප්‍රතිඵලයක් හැටියට, නීතියේ නිසි ක්‍රියාකාරීත්වය එහි නිසි ක්‍රියාකාරීත්වයට ඔබ්බෙන් යා නොහැකි බවයි.

නීතිය සහ බලය පුද්ගලයෙක්ව යුක්තියේ සීමාව ඇතුලත රඳවද්දී, ඔවුන් නියම කරන්නේ නොකළ යුතු වූ නිශේධන පමණි. නීතිය එවිට ඉල්ලා සිටින්නේ අනුන්ට උවදුරු කරන්නට එපා කියා පමණි. නීතිය එවිට පුද්ගලයාගේ පෞරුෂයට, ඔහුගේ නිදහසට, ඔහුගේ දේපලවලට කිසිත් කඩාකප්පල් ක්‍රියාවක් ගෙනැවිත් නැත. නීතිය ඒ සියල්ලට ආරක්ෂාව ලබා දී ඇත. නීතිය යුක්ති සහගත වෙද්දී, එය සියල්ලන්ව එක හා සමාන ලෙසින් සලකා ඔවුන්ගේ අයිතීන් සියල්ල ආරක්ෂා කර දෙයි.

# නීතිය යනු ඍණාත්මක සංකල්පයකි

නීතිය සහ නීතිමය ආරක්ෂාව සපයන අවිහිංසාවාදී වූ කර්තව්‍යය ස්වයං ප්‍රත්‍යක්ෂ වෙන්නකි. එහි ප්‍රයෝජනවත් බව පැහැදිලිය. එහි නීත්‍යානුකූල බව ප්‍රතික්ෂේප කළ නොහැකිය.

මගේ මිත්‍රයෙක් වරක් කීවේ මේ නීතිය යනු ඍණාත්මක සංකල්පයකි යන්න කොතරම් සත්‍යයක්දැයි කියතොත්, නීතියේ අරමුණ යුක්තියට රජයන්නට ඉඩදීම යැයි කියද්දී, එය දැඩි සේ නිරවද්‍ය වූ වාක්‍යයක් නොවන්නේ යැයි කියාය. අපි කිව යුත්තේ, නීතියේ අරමුණ නම් අයුක්තියට රජයන්නට ඉඩක් නොදීම යැයි කියායි. සත්‍ය වශයෙන්ම, අයුක්තියයි, යුක්තියට වඩා, එහිම වූ පැවැත්මක් තිබෙන්නක් වනුයේ. යුක්තියට පවතින හැකියාව ලැබෙන්නේ අයුක්තිය නොමැති කල පමණකි.

එහෙත් නීතිය, එහි අත්‍යාවශ්‍ය වූ ඒජන්තවරයා වූ, බලය සමඟින්, මිනිස් ශ්‍රමයට රෙගුලාසි ගෙනෙද්දී, අධ්‍යාපන විෂයයකට හෝ ක්‍රමවේදයකට රෙගුලාසි ගෙනෙද්දී, ආගමික භක්තියකට හෝ අදහසකට රෙගුලාසි ගෙනෙද්දී, -එවිට නීතිය තව දුරටත් ඍණාත්මක නොවන්නේය. එය ධනාත්මක ලෙසින් ජනතාවට බලපායි. එය ජනතා අභිප්‍රාය වෙනුවට රෙගුලාසිකරුවාගේ අභිප්‍රාය ස්ථාපිත කරවයි.

ස්ව උත්සාහය වෙනුවට රෙගුලාසිකරුවාගේ උත්සාහය ස්ථාපිත කරවයි. මෙය සිද්ධ වෙද්දී, ජනතාවට තව දුරටත් කතාබහට, සැසඳීමට, කල් ඇතිව සැලසුම් කිරීමට, උවමනාවක් ඇති නොවේ. නීතිය විසින් මේ සියල්ලම ඉෂ්ට කරදෙනු ලබයි. බුද්ධිය යනු ජනතාවට අවශ්‍ය නොවන වේදිකාවට අනවශ්‍ය වූ පසුබිම් සැරසිල්ලක් පමණක් බවට පත්වෙයි. ඔවුන් මිනිසුන් වීම නැවතේ. ඔවුනට පෞරුෂය අහිමිවී යයි. ඔවුන්ට නිදහස අහිමිවී යයි. ඔවුන්ට දේපල අහිමිවී යයි.

නිදහස උල්ලංඝනය නොකර ශ්‍රමයට ගෙනෙන රෙගුලාසියක් ගැන සිතන්න හැකිදැයි උත්සාහයක් ගෙන බලන්න. දේපල උල්ලංඝනය

නොකර බලය පාවිච්චි කරමින් අයෙකුගේ වස්තුවක් වෙනත් අයෙකුට දෙන්න හැකියාව ඇත්දැයි සිතන්න. මේ පරස්පර විරෝධ ඔබට සමාධානය කළ නොහැකි නම්, එවිට ඔබ තීන්දු කළ යුත්තේ අයුක්තිය පැතිරෙන සේ සංවිධානය නොකර නීතියට ශ්‍රමය සහ කර්මාන්ත රෙගුලාසි කළ නොහැකි යැයි කියායි.

# දේශපාලන ප්‍රවේශය

දේශපාලනඥයෙක් තනිවම තම කාර්යාලයේ හිඳගෙන සමාජය දිහා බලද්දී, එහි දැඩි සේ පැතිර ඇති අසමානතා දැක ඔහු පුදුමයට පත්වෙයි. අපේ සහෝදරයන්ට නොමැති බොහෝ දේවල් දැක ඔහු එය හෙළා දකියි. වස්තු සහ සුඛෝපභෝගී භාණ්ඩ සමඟ සසඳන කල සමාජයේ දකින්නට ඇති විහීනතාවය සිතේ කණගාටුව තවත් වැඩි කරයි.

සමහර විට දේශපාලනඥයා තමාගෙන්ම විමසිය යුත්තේ මෙයයි, මෙවැනි තත්වයක් හටගෙන ඇත්තේ මන්ද කියායි. එය ආදී කාලේ කරපු කොල්ලකෑම සහ ආක්‍රමණ නිසා නොවේද කියාය. මෑත කාලේ කරන නීතිමය කොල්ලකෑම නිසා නොවේද කියාය. සමහර විට ඔහු මේ යෝජනාව සලකා බැලිය යුතුයි: සෑම පුද්ගලයෙක්ම යහපත සහ පරිපූර්ණත්වය බලාපොරොත්තු වෙන නිසා, ප්‍රගතියට වඩාත් දැඩිම වූ උත්සාහය ගන්නට යුක්තිය නැමති කොන්දේසය පමණක් ප්‍රමාණවත් නොවේද?

මෙය ඒකීය පුද්ගල වගකීම සමඟ එකට යන්නා වූ, දෙවියන් විසින් මිනිසාට හොඳ හා නරක අතරින් කැමැත්තක් තෝරාගන්නට දී ඇති හැකියාව අනුව යන, ශුභඵලය සහ දඬුවම අනුව වූවක් නොවේද?

එහෙත් දේශපාලනඥයෙක් කිසිවිටෙක මේ ගැන නොසිතයි. ඔහුගේ මනස දුවන්නේ -නීත්‍යානුකුල සහ නීත්‍යානුකුල සේ පෙන්නා වූ සංවිධානය පිණිසයි. සංකරණ පිණිසයි. විධි විධාන සැකසීමටයි. දුෂ්ට බවට පිළියම් පිණිස ඔහු ගෙනෙන්නේ මුලින්ම දුෂ්ට බව ගෙනෙන ලද්දා වූ දැයමයි. එනම් නීත්‍යානුකුල කොල්ලකෑමයි. යුක්තිය යනු

සෘණාත්මක සංකල්පයක් බව මේ වෙද්දී අපි දුටුවෙමු. ඉතින් එහෙනම් කොල්ලකෑමේ මූලධර්මය අඩංගු නොවෙන ධනාත්මක නීතිමය ක්‍රියා එකක් හෝ තියෙනවාද?

# නීතිය සහ පුණ්‍යාධාර

"මුදල් නැති මිනිස්සු ඉන්නවා," යැයි ඔබ කියනු ඇත. ඉතින් ඔබ එයට නීතිය ගෙනෙනවා. එහෙත් නීතිය යනු පියයුරක් කිරිවලින් පුරවන්නක් නොවේ. සමාජයෙන් බැහැරක ඉන්න අය විසින් ඒ කිරි නහර නීතියෙන් කියූ නිසා පුරවා එවන්නක් නොවේ. එවැනි පුණ්‍යාධාරයකට නීතියක් ගෙනෙද්දී, එක පංතියක එක පුරවැසියෙකුගේ යහපත පිණිස අනික් පංතිවල අනික් පුරවැසියන්ගෙන් බලහත්කාරයෙන් උදුරා නොගත්තොත්, මහජන භාණ්ඩාගාරයට කිසිවක් ඇතුල්වෙන්නේ නැත.

සෑම පුරවැසියෙකුම තමන් ඊට දාපු ප්‍රමාණය භාණ්ඩාගාරයෙන් ගත්තොත්, ඔව්, එවිට නීතිය විසින් කිසිවෙක් කොල්ල කා නැත්තේය. එහෙත් මේ ප්‍රතිපත්තිය මුදල් කිසිත් නැති මිනිසෙකුට කිසිම යහපතක් ඉටු නොකරයි. එයින් ආදායම් සමානාත්මතාවයක් ඉෂ්ට නොවේ. නීතියට සමානාත්මතාවයේ අවියක් විය හැකියාව ඇත්තේ පිරිසක වෙතින් අරගෙන තවත් පිරිසකට බෙදාදීමෙන් පමණකි. එහෙත් නීතිය එය කරද්දී එය කොල්ලකෑමේ අවියක් වෙයි.

මෙය මතකයේ තබාගෙන, ආරක්ෂිත තීරු බදු, සහානාධාර, සහතික ලාබ, සහතික රැකියා, සුබසාධන සේවා සැලසුම්, මහජන අධ්‍යාපනය, ප්‍රගතිශීලී බදු, ණය හා මහජන පහසුකම් ගැන කල්පනා කර බලන්න. සෑම විටෙකම ඒවායෙන් ඔබට දැකිය හැක්කේ ඒවා පදනම්ව ඇත්තේ නීත්‍යානුකූල කොල්ලකෑම මත බවයි. එය සංවිධානය කරන ලද අයුක්තියකි.

# නීතිය සහ අධ්‍යාපනය

“අධ්‍යාපනයක් නැති මිනිස්සු ඉන්නවා,” යැයි ඔබ කියනු ඇත. ඉතින් ඔබ එයට නීති ගෙනෙනවා. නමුත් නීතිය යනු ඉගෙනීමේ එළිය ලෝකයට පෙන්වන පන්දමක් නොවන්නේය. නීතිය යනු සමාජයේ ඥානය ඇති අය සහ නැති අය දෙගොල්ලන්ම වෙනුවෙන් පෙනී සිටිය යුත්තකි. සමහර පුරවැසියන්ට ඉගෙනීමක් ලබන්නට අවශ්‍ය වූවාම අනිත් පුරවැසියන්ට ඔවුනට උගන්වන හැකිය. මෙවැනි අධ්‍යාපන ක්‍රමයක දී නීතියට ඇත්තේ විකල්ප දෙකක් පමණි. එයට මේ ගණුදෙනුවට -ඉගැන්වීමට හා ඉගෙන ගැනීමට- නිදහසේ සහ බලය පාවිච්චියෙන් තොරව කෙරෙන්නට ඉඩ දිය හැකිය. නැතහොත්, මිනිස් අධිෂ්ඨානයට බලපෑම් ඇති කරමින් සමහර පිරිසකගෙන් අරගෙන ආණ්ඩුව විසින් තනතුරු දුන් ගුරුවරුන්ට වේතන ගෙවා ඔවුන් ලවා කිසිත් ගෙවීමක් නොමැතිව තවත් කොටසකට ඉගෙන ගන්නට අවස්ථාව ලබාදෙන්නට නීතියට පුළුවනි. මේ දෙවැනි කටයුත්තේ දී නීතිය අතින් සිද්ධ වෙන්නේ නිදහස සහ දේපල කඩාකප්පල් කරමින් සිදුවෙන නීත්‍යානුකූල කොල්ලකෑමයි.

# නීතිය සහ සද්ගුණය

“මෙන්න ඉන්නවා සද්ගුණයක් නැති ආගමක් නැති මිනිස්සු,” යැයි ඔබ කියනු ඇත. ඉතින් ඔබ එයට නීතිය ගෙනෙනවා. එහෙත් නීතිය යනු බලය පාවිච්චියයි. සද්ගුණය හා ආගම වෙනුවෙන් බලය පාවිච්චි වෙද්දී ඇතිවන ප්‍රචණ්ඩත්වය හා නිෂ්ඵලත්වය ගැන මම කියන්නටවත් යා යුතුද?

කෙසේවුවද අපිට පෙනෙන්නේ සමාජවාදීන්ට, ඔවුන් කොතරම් සෑහීමකට පත්වී සිටියත්, එවැනි වෑයම් වලින් සහ එවැනි සැලසුම් වලින් ඇතිවූ මේ කුරිරු වූ නීත්‍යානුකූල කොල්ලයේ ඵල විපාක දැකීම මගහරින්නට නොහැකියි කියායි. ඒත් ඒ ගැන ඔවුන් කරන්නේ කුමක්ද? ඔවුන් ඒ නීත්‍යානුකූල කොල්ලය අනුන් වෙතින් සඟවන්නට -තමන් වෙතින්ද සඟවා තබන්නට- දක්ෂ කූටෝපායන්හි යෙදෙති. ඊට ඔවුන් යොදාගන්නා චිත්තාකර්ෂණීය ආකාරයන් වනුයේ ඒවා සහෝදරත්වයේ නාමයෙන්, එක්සත්බවේ නාමයෙන්, සංවිධානාත්මක

බවේ නාමයෙන්, එකිනෙකා හා සම්බන්ධතා පැවැත්වීමේ නාමයෙන් සිද්ධවෙනවා කියා ගැනීමයි.

අපි නීතියෙන් සිද්ධවිය යුතුයි කියා කොතරම් අල්පයක් ඉල්ලා සිටින්නේදැයි කිවහොත් -යුක්තිය පමණයි- ඉතින් සමාජවාදීන් කියන්නේ අපි සහෝදරත්වය, එක්සත්බව, සංවිධානය, සමාජ සබඳතා සියල්ලම ප්‍රතික්ෂේප කරනවා කියාය. එහිදී සමාජවාදීන් අපිව හංවඩු ගසන්නේ අපි ඒකීය පුද්ගලයන් යැයි කියන නාමයෙනි.

නමුත් අපි සමාජවාදීන්ට තරයේම කියා සිටින්නේ අපි ප්‍රතික්ෂේප කරන්නේ බලය පාවිච්චියෙන් කරන සංවිධානය බවයි. එහෙම නැතිව ස්වභාවික සංවිධානය නොවේ. බලහත්කාරයෙන් අපි වෙනුවෙන් කරන සංවිධානය ප්‍රතික්ෂේප කරද්දී අපි නිදහස් ඇසුරුකම් පැවැත්වීම ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. අපි ප්‍රතික්ෂේප කරන්නේ බලහත්කාරයෙන් පමුණුවන සහෝදරත්වයයි. නැතිව සත්‍ය සහෝදරත්වය නෙමෙයි. අපි ප්‍රතික්ෂේප කරන්නේ ඒකීය පුද්ගලයාගේ වගකීම් අහිමි කරන කෘතිම එක්සත්බවයි. ස්වභාව ධර්මය විසින් ප්‍රදානය කර ඇති ස්වභාවික එක්සත්බව අපි ප්‍රතික්ෂේප කරන්නේ නැහැ.

# ව්‍යාකූල කරන ලද පද වහර

සමාජවාදය, එය බිහිවෙන ලද එහි පුරාතන අදහස සේ ම, ආණ්ඩුව සහ සමාජය අතර වෙනස ව්‍යාකූල කර දමයි.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ආණ්ඩුව විසින් කරන්නට යන කටයුත්තකට අපි විරෝධය පාන හැම අවස්ථාවක දී ම, සමාජවාදීන් නිශ්චය කරන්නේ අපි එම කටයුත්ත සිද්ධ වෙනවාට කිසිසේත්ම අකමැති යැයි කියාය.

අපි රජය විසින් අධ්‍යාපනය සපයනවාට විරුද්ධයි. එවිට සමාජවාදීන් කියන්නේ අපි අධ්‍යාපනයට විරුද්ධ යැයි කියාය. අපි රජය විසින් ආගමට ඇඟිලි ගැසීමට විරුද්ධයි. එවිට සමාජවාදීන් කියන්නේ අපි

ආගම ඕනෑ නැතැයි කියනවා කියාය. අපි රජය විසින් සමානාත්මතාවය ස්ථාපිතය කරන්න හදන වෑයමට විරුද්ධයි. එවිට සමාජවාදීන් කියන්නේ අපි සමානාත්මතාවයට එරෙහි යැයි කියාය. ඉතින් මෙසේ දිගින් දිගට කියත හැකිය. එය හරියට රජය විසින් ධාන්‍ය වගා කරනවාට අපි අකමැති වෙද්දී අපි මිනිසුන්ට කන්නට ලැබෙනවාට අකැමති වෙනවා යැයි සමාජවාදීන් කියන්නා සේ ය.

# සමාජවාදී රචකයන්ගේ බලපෑම

ඊට අයත් නොවූවක් -වස්තුව, විද්‍යාව, ආගම, ධනාත්මක ලෙසින් දේපල යන්නට අයිති වන කොටස- නිෂ්පාදනය කරන්නට නීතියට හැකියාව ඇතැයි කියන මේ අභූත අදහස දේශපාලනඥයන් විශ්වාස කරන්නට පටන් ගත්තේ කෙසේදස මහජන කටයුතු සම්බන්ධයෙන් අදහස් ලියන අපේ වර්තමාන රචකයන් නිසාද?

වර්තමාන රචකයන් -සමාජවාදී නැඹුරුවේ අය විශේෂයෙන්ම- ඔවුන්ගේ අනේක වූ න්‍යායයන් එකම ප්‍රස්තුතයක් මත පදනම් කරගනිති: ඔවුන් මනුෂ්‍ය සංහතිය දෙකොට්ඨාශයකට බෙදති. සාමාන්‍ය මහජනතාව -මෙහි දී රචකයා සාමාන්‍ය ජනතාවට අයිති නැත- එක කොට්ඨාශයකි. රචකයා පමණක් දෙවැනි නොහොත් වඩාත්ම වැදගත්වූ කොට්ඨාශය වෙයි. සහතිකයෙන්ම, මිනිස් මොළයක පහළ වූ වඩාත්ම උඩඟු සහ වඩාත්ම අභූත සංකල්පනය මෙය විය යුතුය!

මහජන කටයුතු ගැන ලියන මෙම රචකයන් පටන් ගන්නේ මිනිසුන් වනාහී තමන් තුල වටහා ගැනීමේ ශක්තියක් නැති, ක්‍රියාවක් සඳහා අභිප්‍රායයක් නැති මිනිසුන් සේ සලකාය. රචකයා අභ්‍යූපගමනය කරන්නේ ජනතාව හෝන්දු මාන්දු පදාර්ථයන් ලෙසිනි. අකර්මන්‍ය අංශු, නිශ්චල පරමාණු, තම පැවැත්ම ගැන තැකීමක් නැති යම් වෘක්ෂලතාදිය වැනි තමනට සම්පූර්ණයෙන්ම වෙනස් ලෙසකින් සෑදී ඇතැයි කියාය. ඔවුන් අභ්‍යූපගමනය කරන්නේ මේ ජනතාව වෙනත් අයෙකුගේ අභිමතය අනුව අනේක වූ ආකාරයන්ට සමමිතික බැවින්

අඩුව, කලාත්මක ලෙසින් අනා තනා පරිපූර්ණ කරන්නට හැකියාව ඇති වස්තූන් ලෙසටයි.

ඉතින්, රාජ්‍ය පරිපාලන කටයුතු ගැන ලියන මේ රචකයන් අතර කිසිම කෙනෙක් මඳක් නැවතී, මෙසේ හැම අත විසිරී ඇති භෞතික වස්තු යැයි සලකන පුරවැසියන්ව තමන් බලාපොරොත්තු වෙන සමාජයට සරිලන පිණිස අනා තනා හැඩගසා ඉදිරිපත් කරන්නට යන සංවිධායකයා, නවෝත්පාදකයා, නීති සම්පාදකයා, නිර්මාතෘවරයා යනාදී නම් වලින් පෙනී සිටින තමන්ම නේද යැයි සිතන්නට කාලයක් මිඩංගු කරන්නේ නැත.

මේ සමාජවාදී රචකයන් ජනතාව දිහා බලන්නේ උයන්පල්ලා තම ගස් දිහා බලන ආකාරයෙනි. තම ගස් පිරමීඩ, කුඩ, සනක, මල්පෝච්චි, අවාන් සහ වෙනත් හැඩ වලින් පෙනෙන්නට කපා කොටා හදන ලෙසින් සමාජවාදී රචකයා ද අණගුණ නැති ආකාරයකින් මිනිස් සත්වයන්ව කාණ්ඩ, ශ්‍රේණි, මධ්‍යස්ථාන, උප මධ්‍යස්ථාන, මී මැසි බෙන, ශ්‍රම හමුදා සහ වෙනත් කොටස්වලට බෙදයි. උයන්පල්ලාට කැත්තක්, පොරවක්, කියතක් අවශ්‍ය වෙනවා සේ සමාජවාදී රචකයා මිනිසුන් හැඩගස්සන්නට පාවිච්චියට ගන්නේ නීතියයි.

ඒ අරමුණ සාක්ෂාත් කරගන්නට ඔහු තීරු බදු නීති ගෙනෙයි. බදු නීති ගෙනෙයි. සහනාධාර නීති ගෙනෙයි. පාසැල් සඳහා නීති ගෙනෙයි.

# සමාජවාදීන් දෙවියන්ගේ කාර්ය භාරය තමනට පවරාගන්නට කැමැත්තෝය

සමාජ සංකරණ සඳහා යොදාගත හැකි අමුද්‍රව්‍ය ලෙසින් සමාජවාදියා ජනතාව දිහා බලයි. යම් විදියකින් මේ තමන් හදන්නට යන සංකරණය ගැන විචිකිච්ඡාවක් හටගත්තේ ද, අත්හදා බැලීමක් කරන්නට යම් කුඩා පිරිසක් ඔහු පර්යේෂණය පිණිස පැත්තකින් තියයි. හැම සැලසුමක්ම අත්හදා බලන හැදියාව ජනප්‍රිය වූවකි. එක සමාජවාදී නායකයෙක් ව්‍යවස්ථා සභාවෙන් ඉල්ලා සිටියේ තම සමාජ

පර්යේෂණ අත්හදා බලන්නට කුඩා දිස්ත්‍රික්කයක් හා එහි වැසියන් සියල්ලන්වමය.

නවෝත්පාදකයෙක් යම් මැෂින් එකක් හදන්නට පෙර එහි ආකෘතියක් හදා බලන ලෙසින්, රසඥයෙක් රසායන අත්හදා බලා ටිකක් නාස්ති කරන ලෙසින්, ගොවියෙක් ඉඩමක බීජ අත්හදා නාස්ති කරන ලෙසින් මොහු ද කරන්නේ අදහසක් අත්හදා බැලීමයි.

එහෙත් උයන්පල්ලා හා ඔහුගේ ගස් අතර, නවෝත්පාදකයා සහ ඔහුගේ මැෂිම අතර, රසඥයා සහ ඔහුගේ රසායන අතර, ගොවියා හා ඔහුගේ බීජ අතර යනාදියට වඩා මේ උත්සාහයේ බරපතල වෙනසක් ඇත! එහෙත් සිය අවංක සිතින් සමාජවාදියා සිතන්නේ ඔහු හා මිනිස් සංහතිය අතර ඇත්තේද ඉහත සඳහන් කරන අය අතර ඇති වෙනසම වේයැයි කියාය!

19 වැනි සියවසේ රචකයන් සමාජය දිහා බලන්නේ රෙගුලාසි හදන අයගේ නිර්මාණශීලී බුද්ධියෙන් වූ කෘතිම නිර්මාණයක් දිහා බලන හැටියටය. මේ අදහස -සම්භව්‍ය අධ්‍යාපනයේ ප්‍රතිඵලයකි- අද අප රටේ සියලුම විද්වතුන් සහ සියලුම ප්‍රසිද්ධ රචකයන් විසින් දරන මතයක්වී තිබේ. ඉතින් මේ විද්වතුන්ට සහ මේ රචකයන්ට අනුව ජනතාව හා නීති සම්පාදකයන් අතර ඇති සබඳතාවය පෙනෙන්නේ මැටි ගොඩක් සහ කුඹල්කරුවා අතර ඇති සබඳතාවය හා සමාන ලෙසකිනි.

ඔවුන් විසින් මිනිසෙකුගේ හදවතකින් පැන නැගෙන ක්‍රියාවක මූල ධර්මයක් දුටු කළ වුවද, සහ -මිනිසෙකුගේ මොළයක ඇති සියුම් නුවණක මූල ධර්මයක් දැක්කද,- ඒවා දෙවියන් ගෙන් ලැබී ඇති මරාන්තික වූ තෑගි ලෙසින් දකිති. මේ තෑගි දෙක නිසා, පුද්ගලයා තමාව පරිහානිය කරා ගෙන යනු ඇතැයි ඔවුන් විශ්වාස කරති. තම සිතැඟි පසුපස හඹා යන්නට නිදහසක් නීති සම්පාදකයන් විසින් දුන්නොත් එවිට ආගම වෙනුවට අදේවවාදයට යනු ඇතැයි සිතති. ඥානය වෙනුවට නුගත්කම තෝරාගනු ඇතැයි සිතති. නිෂ්පාදනය සහ හුවමාරුව වෙනුවට දරිද්‍රතාවය තෝරාගනු ඇතැයි සිතති.

# සමාජවාදීන් මනුෂ්‍ය සංහතිය පිළිකුල් කරන්නෝ වෙති

මේ සමහර රචකයන්ට අනුව, සමහර අය වෙත -ආණ්ඩුකාරයන් හා ව්‍යවස්ථාදායකයන්- දෙවියන් විසින් ඔවුන් ඉහත සඳහන් කරන ලද සාමාන්‍ය මිනිසාගේ සිතැඟියාවන් වලට සම්පූර්ණයෙන්ම පටහැනි වූ සිතැඟියාවන් ප්‍රදානය කර ඇත. එනම් තම ඕනෑ එපාකම් වලට නොව පොදු ජනතාවගේ හිතසුව පිණිස කටයුතු කිරීමේ සිතැඟියාවන් ප්‍රදානය කර ඇත. මිනිස් සංහතිය දුෂ්ට බව කරා යද්දී ව්‍යවස්ථාදායකයන් යහපත සොයා යති.

මනුෂ්‍ය සංහතිය මෝහන්ධකාරය වෙත යද්දී ව්‍යවස්ථාදායකයන් ගමන් කරන්නේ ආලෝකනය වෙතටයි. මිනිස් සංහතිය දුසිරිත වෙතට ඇදී යද්දී ව්‍යවස්ථාදායකයන් ඇදී යන්නේ සද්ගුණය වෙතටයි. ඉතින් මේ තත්වය සත්‍ය තත්වය යැයි ඔවුන් තීරණය කර ඇති නිසා ඔවුන් ඉල්ලා සිටිනුයේ තම සිතැඟියාවන් මිනිස් සංහතියේ සිතැඟියාවන් බවට හරවන බලය පාවිච්චියට නීතිමය අවසර දෙන්න කියායි.

දර්ශනය, දේශපාලනය, ඉතිහාසය යනාදී ඕනෑම පොතක් හැර බලන්න. මේ අදහස එහි පතුලේ කිඳා බැස ඇති බව අපේ රටේ පොත්වලින් ඔබට පැහැදිලි වනු ඇත. සම්භාව්‍ය අධ්‍යයනයේ දරුවා අද සමාජවාදයේ මවක් බවට පත්ව සිටියි. ඒ සියල්ලෙන්ම ඔබට පෙනී යනු ඇත්තේ මිනිස් සංහතිය යනු නිශ්ක්‍රීය වූ අංශු බවයි. රටේ බලය සතු වූවන් වෙතින් ජීවය, සංවිධානය, සද්ගුණය සහ සමෘද්ධිය ලබාගන්නා බවක් සැලකෙන බවයි. ඊටත් වඩා දරුණු සඳහනක් ද ඒවායේ දකින්නට ලැබේ. එනම් මිනිස් සංහතිය පරිහානිය කරා ගමන් ගන්නා සිතැඟියාවෙන් යුතු බවයි. ඔවුන් ඒ පහළට වැටීමෙන් නැවතෙන එකම වෑයම මේ ව්‍යවස්ථාදායකයන්ගේ අදිසි හස්තයෙන් කෙරෙන්නා වූ කටයුතු නිසා සිදුවන බවයි. පාරම්පරික සම්භාව්‍ය චින්තනය හැම තැනක දී ම කියන්නේ අකර්මණ්‍ය සමාජයක සැඟවුණු බලය නම් නීතිය සහ ව්‍යවස්ථාදායකයන් (නැතහොත් තවත් නමකින් හෝ පද වහරකින් නමක් නැති පුද්ගලයෙකුගේ තර්ක කළ නොහැකි වැදගත්කමක් ගැන හා බලයක් ගැන කියැවෙනු ඇත) විසින්

හසුරවමින්, පාලනය කරමින්, යහපත සලසමින් මිනිස් සංහතිය වැඩි දියුණු කරනවාය කියාය.

# අනිවාර්ය ශ්‍රම වෙහෙසීම උදෙසා

දහසය වැනි ලුවී රජුගේ ගුරුවරයා වූ බොසූට් කියූවක් මෙසේය: "ඊජිප්තු වැසියන්ගේ මනස් තුල වඩාත් තදින් රඳවන (කවුරු විසින්ද?) ලද්දක් නම් දේශප්‍රේමීත්වයයි ... ඒ රටේ කිසිවෙකුට රටට ප්‍රයෝජනවත් නොවන ලෙසින් නිකමෙක් සේ ඉන්නට ඉඩක් නොලැබුණි. නීතියෙන් හැම පුද්ගලයෙකුටම කාර්ය භාරයක් පැවරිණ. එය තාත්තාගෙන් පුතාට ලැබිණ. කිසිම අයෙකුට වෘත්තීන් දෙකක් කරන්නට අවසර නොලැබුණි. අයෙකුට වෘත්තීය වෙනස් කිරීමට ද අවසර නොලැබුණි... එහෙත් සැවොම විසින් අනුගමනය කළ යුතු වූ එක් කටයුත්තක් විය: ඒ නීති සහ ප්‍රඥාව අධ්‍යයනයයි. ආගම ගැන නොදන්නාකමෙන් හෝ රටේ දේශපාලන රෙගුලාසි ගැන නොදන්නාකමෙන් පසුවන්නට කිසිම අයෙකුට කිසිම තත්වයක් යටතේ අවසරයක් ලැබුනේ නැත. තවත් කියතොත්, හැම රස්සාවක්ම යම් දිස්ත්‍රික්කයකට නියමිත (කවුරු විසින්ද?) කරන ලද්දකි ... යහපත් නීති අතරින් ප්‍රධාන වූවක් නම් සෑම පුද්ගලයෙක්ම පුහුණුවක් (කවුරු විසින්ද?) ලබා තිබුණේ නියෝග පිළිපදින්නටය. මෙහි ප්‍රතිඵලයක් හැටියට ඊජිප්තුව අපූරු නවෝත්පාදන වලින් පිරී තිබුණි. ජීවිතය පහසු කරවන සහ සාමකාමී කරවන කිසිවක් නොසලකා හැර තිබුණේ නැත." [වහරන් තුල ඇත්තේ බැස්ටියාට් ලියූ සටහන්]

ඉතින් බොසූට් කියන පරිදි මිනිසුන් තමන් වෙනුවෙන් කියා කිසිත් ලබා නොගනිති. දේශප්‍රේමය, සමෘද්ධිය, නවෝත්පාදන, සත්ව කර්මාන්තය, විද්‍යාව යනාදී සියල්ලම නීතිය මඟින් පාලකයන් විසින් ජනතාවට ලබාදෙන ඒවා වෙති. ජනතාව විසින් කළ යුතු එකම දේ නායකත්වයට කඳ නවා ආචාර කිරීම පමණකි.

# පීතෘක ආණ්ඩුවක් උදෙසා

බොසූට් විසින් මේ රාජ්‍ය පාලනය සියලු ප්‍රගතියන්හි මූලය යැයි කියන අදහස ඉදිරියට ගෙනයමින් පාලකයන් විසින් මල්ලවපොර හා සංගීතය තහනම් කිරීමට එරෙහිව එල්ල වූ චෝදනාව ගැන මෙසේ කියයි: "එහෙම කළා යැයි කියන්නේ කොහොමද? මේ කලා සොයා ගැනුණේ ට්‍රිස්මෙගිටස් (ඊජිප්තු දෙවියන් ඔරිසිස්ගේ ගුරු උපදේශකයා) විසින්."

පර්සියානුවන් අතරද සියල්ලම ඉහළ අයගෙන් පහළ අයට ලැබුණාය යන්න බොසූට් විසින් පහදයි: "කුමාරයාගේ පළමු වගකීමක් වූයේ කෘෂිකර්මය දිරිමත් කිරීමයි... හමුදාව රෙගුලාසි කරන්නට කාර්යාල තිබුණා සේ ම, ගොවිපොල කටයුතු නියාමනය කරන්නටද කාර්යාල තිබුණා... පර්සියානු ජනතාව තුල සිය රාජ්‍ය අධිකාරිය ගැන වූයේ නිම්හිම් නොමැති ගෞරවයක්."

ඉතින් බොසූට් කියන පරිදි, ග්‍රීක ජනතාව අති මහත් ප්‍රාඥයන් වුවද, ඔවුන් පෞද්ගලික වගකීම ගැන හැඟීමකින් නොයුතු වූහ. බල්ලන් අශ්වයන් සේ ඔවුනට තමන් වෙනුවෙන් ඉතා සරල ක්‍රීඩාවක් හෝ උත්පාදනය කරගත නොහැකි විය. "ස්වභාවයෙන්ම බුද්ධිමත් හා නිර්භීත වූ ග්‍රීක් වැසියන් යනු ඊජිප්තුවෙන් ආ රජවරුන් සහ පදිංචිකරුවන් විසින් ඉතා ඈත අතීතයක දී ශිෂ්ඨාචාර කරන ලද්දවුන්ය. මේ ඊජිප්තු පාලකයන් වෙතින් ග්‍රීක ජනතාව ශාරීරික ක්‍රියාකාරකම් ගැන උගත්හ. දිවීමේ තරඟ, අශ්ව සහ අශ්ව කරත්ත තරඟ... ඒත් ඊජිප්තු අය ග්‍රීක් අයට ඉගැන්වූ වඩාත්ම අනගි දැය නම් හීලෑ බවයි. පොදු ජනතාවගේ හිතසුව පිණිස කරන නීති සම්පාදනයෙන් තමන් ආණ්ඩු වන්නට ඉඩදීමයි."

# අකර්මණ්‍ය මිනිස් සංහතිය පිළිබඳ සංකල්පය

මේ සම්භව්‍ය න්‍යාය (අභිනව ගුරුවරු, රචකයන්, නීති සම්පාදකයන්, අර්ථශාස්ත්‍රඥයන්, සහ දාර්ශනිකයන් විසින් ගෙනෙන ලද) සියල්ල කියා පෑවේ ජනතාවට සියල්ල ලැබුණේ තමන්ට පිටතින් වූ මූලාශ්‍රයකින් කියාය. තවත් උදාහරණයක් දක්වන්නේ නම්, ෆෙනලන්

(බර්ගන්ඩියේ ඩ්‍යුක්වරයාට උපදේශකයෙක් වූ, කතුවරයෙක් හා බිෂොප්වරයෙකි) සලකා බලන්න.

ඔහු දහසය වැනි ලුවී රජුගේ බලය අත්දැකි අයෙක් වූයේය. එය සහ සම්භාව්‍ය අධ්‍යයනයෙන් පෝෂිත වූ අධ්‍යාපනයක් සමඟින් යුතු වූ ෆෙනලන් සැලකුවේ මිනිස් සංහතිය අකර්මණ්‍ය වූවක් කියායි. සමෘද්ධිය සහ අභාග්‍ය -සද්ගුණය හා දුසිරිත- යනු ව්‍යවස්ථාදායකයන් හා නීතිය විසින් ඔවුන්ට බාහිරව ගැනෙන තීරණ නිසා සිද්ධ වෙන්නා වූ ගුණාංගයන් කියාය. ඉතින් ඔහුගේ සැලෙන්ටම් නම් උතෝපියාවේ ඔහු විසින් සියලු මිනිසුන්ව ඔවුන්ගේ ආශයන්, බලාපොරොත්තු, ඉන්ද්‍රියයන්, වස්තු සියල්ලම පිටින් ව්‍යවස්ථාදායකයේ සම්පූර්ණ කැමැත්ත අනුව  පරිහරණය වෙන්නට ඉඩ ලබාදී ඇත.

කුමක් සිද්ධ වුවත් පුද්ගලයෙක් තමන් වෙනුවෙන් තීරණයක් ගන්නේ නැත. ඔහු වෙනුවෙන් තීරණය කරන්නේ කුමාරයා විසිනි. රටක් සම්පූර්ණ කරන කිසිත් හැඩයක් නොමැති මහත් ජන සෙනගේ ස්ප්‍රීතුව ලෙසින් කුමාරයා හැඳින්වේ. සිතුවිලි, අනාගත දැක්ම, සියලු ප්‍රගතිය, සහ සංවිධාන මූල ධර්ම සියල්ල කුමාරයා සතු දේ වෙති. ඒ නිසා සියලු වගකීම ද ඔහු සතු වූවයි.

ෆෙනලන්ගේ ටෙලිමාකස් නැමති 10 වැනි පොත ඉහත කතාව ඔප්පු කරන්නකි. පාඨකයාව මම ඒ පොත වෙත යොමු කරවමි. ඒ ජන ප්‍රසාදයට පාත්‍ර වූ පොතේ, මේ හැරෙන්නට එහි අනික් කරුණු ගැන මා තුල ප්‍රසාදයක් පවතී. එයින් මම අහඹු ලෙසින් තෝරා ගන්නා ලද කොටසක් උපුටා දක්වමි.

# සමාජවාදීන් විසින් විචාර බුද්ධිය හා පරිසිද්ධීන් නොතැකීම

සම්භාව්‍ය ශාස්ත්‍රඥයන් තුල දැකිය හැකි ඉක්මණින් යමක් පිළිගැනීමේ අපූරු හැදියාව තුල, ෆෙනලන් ඊජිප්තු වැසියන් තුල පැතිර ඇති සතුට ගැන කියද්දී ඔහු ඔවුන්ගේ බුද්ධියට නොව රජවරුන්ගේ ප්‍රඥාවට ඒ

සඳහා ස්තුති කරද්දී, ඔහු නොසලකා හරින්නේ විචාර බුද්ධියේ සහ පරිසිද්ධීන් වල අධිකාරියයි.

"අපිට සෑම වෙරළකින්ම පෙනුනේ ධනවත් නගර. ඉතා මනරම් ලෙසින් ඉදිකරන ලද ගම්බද මාලිගා. නිකම් බිම් කෙටූ ඉඩම් නෙමෙයි, හැම වසරකම රත්තරන් අස්වැන්නක් ලබාදෙන ඉඩම්, මිටියාවත් පුරා පැතිර සිටි සත්ව පට්ටි, මහ පොළව විසින් දායද කරන ඵලදාවේ බරින් නැවීගත් ශ්‍රමිකයන්, තමන්ගේ නලා වලින් සුමුදු නාද ගයනා එඬේරන්. "සතුටින්", මෙන්ටර් කියයි, "ඉන්නේ ප්‍රඥාවත් රජෙකු අතින් පාලනය වන මිනිසුන්"..."

පසුව, මෙන්ටර් මගෙන් ඉල්ලා සිටියේ ඊජිප්තුව පුරා පැතිර ඇති සතුට සහ සමෘද්ධිය නරඹන්නට කියාය. එහි නගර දෙදහස් දෙසීයයක් ගණන් කරනු හැකිය. ඔහු නගරවල පැවති හොඳ පොලිස් රෙගුලාසි අගය කළේය. ධනවතුන්ට එරෙහිව දුප්පතුන් වෙනුවෙන් යුක්තිය සැලසෙන ලෙස නීතිය හදා තිබිණ. දරුවන්ට ලබාදුන් සම්පූර්ණ අධ්‍යාපනය තුල උලුප්පා උගන්වන ලද්දේ කීකරු බව, ශ්‍රමය වෙහෙසීමේ අගය, මත්පැන්වලින් ඈත්වී සිටීම, කලා හා අකුරුකරණයට ලැදියාවකින් යුතුවීම යනාදියයි. සියලුම ආගමික වතාවත් සිද්ධ කරන ලද්දේ එකම ආකාරයකටයි. පරාර්ථකාමය ඉහළින්ම අගය කෙරුණි. මිනිසාට පක්ෂපාතී වෙමින් දෙවියන්ට බියවී සිටින්න යැයි හැම පියෙක්ම තම දරුවාට ඉගැන්වීය. ඔහු රට අගය කිරීම නැවතුවේ නැත. "සතුටින්, ඔහු කීය, "ඉන්නේ ප්‍රඥාවත් රජෙකු අතින් පාලනය වන මිනිසුන්."

# සමාජවාදීන්ට ඕනෑ ජනතාව රෙජිමේන්තු කරන්නටයි

ක්‍රීට ගම්මානයක විනය ගැන ෆෙනලන් ලියන ලද කවිය මීටත් වඩා සිත් ගන්නා සුලු වූවකි. මෙන්ටර් ලවා ඔහු මෙසේ කියවයි: "මේ දිවයිනේ ඔබට දැකිය හැකි සියලුම සුන්දර වූ දේවල් ලැබුණේ මීනෝගේ නීති වලින්. දරුවන් වෙනුවෙන් ඔහු පිහිටුවනන ලද නීති

නිසා දරුවන්ට හැඩිදැඩි සහ ශක්තිමත් ශරීර ලැබුණි. මුල පටන්ම දරුවෙකුගේ ජීවිතය අරපිරිමැස්මට සහ ශ්‍රමයට හුරු කරවන ලදි. මන්ද අයෙක් අභ්‍යුපගමනය කරනවා ඉන්ද්‍රියයන් පිනවන දෑ සියල්ල ශරීරය හා මනස යන දෙකම දුර්වල කරන බව. ඒ නිසා සද්ගුණයෙන් පරිපූර්ණ වෙනවා හැරෙන්නට ඔවුන්ට වෙනත් කිසිම ඉන්ද්‍රියයන් පිනවන කාර්යයට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. අනිත් ජනතාව අතර දඬුවම් නොලබා මඟහැරෙන දුසිරිත් තුනක් සඳහා මෙහිදී දඬුවම් ලැබෙනවා. ගුණමකුකම, කුහකකම, සහ කෑදරකම ඒ තුනයි. විලාසිතා කිරීමෙන් සහ දුරාචාරයේ හැසිරීම ගැන ක්‍රීටයේ අයට දඬුවම් කරන්නට අවශ්‍යතාවයක් නැහැ. මොකද ඒවා දකින්නට නැති නිසා. මිලෙන් අධික බඩු මුට්ටු නැහැ, මහේශාක්‍ය වූ වස්ත්‍ර නැහැ, රසවත් ආහාර උත්සව නැහැ, රත්තරන් ගාපු මාලිගා තහනම්.”

ඉතින් මෙන්ටර් මෙසේ තම සිසුවා අනා තනා හදන්නේ -ඉතා හොඳ උදාර වූ චේතනාවක් බවට කිසිදු සැකයක් නැත- ඉතකාවේ ජනතාව නියාමනය කරන්නටයි. මේ අදහස්වල ඇති ප්‍රඥාව ගැන සිසුවා තුල පැහැදීමක් ඇති කරන්නට ඔහු සැලෙන්ටම් ගැන උදාහරණ පෙන්වයි.

මෙවැනි දර්ශනයෙන් තමයි අපි අපේ මුල් දේශපාලන අදහස් ලබාගන්නේ! අපි පුද්ගලයන්ට සැලකිය යුත්තේ කෘෂිකාර්මික ගුරුවරයෙක් ගොවියන්ට පොළව සකස්කර වගා කරන්නට කියා දෙනවා හා සමාන ලෙසකිනි.

# සුප්‍රසිද්ධ නමක් සහ කුරුරි අදහසක්

දැන් අහන්න, ශ්‍රේෂ්ඨ මොන්ටෙස්කියු මේ විෂය ගැන කියූ අදහසක්: “වානිජ්‍යයේ ජවය පවත්වා ගන්නට නීතිය එයට පක්ෂපාතී විය යුතුයි. මේ නීති, වානිජ්‍යයෙන් බිහිවන දේපල සමානුපාතිකව බෙදා දීමෙන් සෑම දුප්පත් පුරවැසියෙකුටම අනික් අය වගේ ශ්‍රමය වෙහෙසන්නට ප්‍රමාණවත් තරමට ඉඩකඩ පාදා දෙයි. මේ නීති, සෑම ධනවත් පුරවැසියෙකුවම දුප්පත් තත්වයකට ගෙන එමින් ඔහුට ලාබයක් සොයන්නට නම් ශ්‍රමය වෙහෙසන්නට සිද්ධ වෙන ලෙසින් ඉඩ සකසා ඇත.”

ඉතින් සියලු නීති සම්පාදනය වී ඇත්තේ සියලු වස්තු අහිමි කරන්නටයි!

සත්‍ය සමානාත්මතාවය යනු ප්‍රජාතන්ත්‍රවාදී රජයේ ජීවය වුවත්, එය සම්පූර්ණ පරිපූර්ණ බවකින් සලසා ගැනීමට හැකියාව තිබෙන්නක්දැයි සොයා බැලුවොත් එය එතරම් රිසි වූවක්දැයි ගැටළුවක් පැන නගියි. ධනය ඇත්තවුන් හා නැත්තවුන් අතර පරතරය යම් තරමකට අඩු කරගැනීමට ගෙනෙන වැඩ සටහන් කමක් නැතැයි කිව්වද, එයින් පසුව සමානාත්මතාවයන් ඇති කිරීමට ධනවතුන්ට කරදර පමුණුවා දුප්පතුන්ට සහනය දීම විශේෂ නීති වලින් කළ යුත්තක්ද?

ඉතින් මෙහි දී ද අපි දකින්නේ වස්තු සමානාත්මතාවයෙන් තබන්නට ගන්නා උත්සාහය නීතියෙන් හා බලය පාවිච්චියෙන් සිද්ධ වෙන ආකාරයයි.

ග්‍රීසියේ ජනරජවල දකින්ට ලැබුණු ආකාර දෙකක් විය. එකක් ස්පාර්ටාවයි. එහි යුද හමුදා පාලනයක් තිබුණි. අනෙක ඇතැන්ස්ය. එහි වානිජ්‍යය කේන්ද්‍ර කරගත් පාලනයක් තිබුණි. පළමුවැන්නෙහි පුරවැසියන් නිකම් සිටීම අගය කළහ. දෙවැන්නෙහි පුරවැසියන් ශ්‍රමය වෙහෙසීම අගය කළහ.

මේ නීති සම්පාදකයන්ගේ අපූර්ව බුද්ධිය විමසා බලන්න: සද්ගුණය පිළිබඳ තිබුණු සාම්ප්‍රදායික සිරිත් කළතා ඔවුන් ඒවා පහත් යැයි සැලකූහ. තමන්ගේ ප්‍රඥාව ලෝකයා අගය කරනු ඇතැයි ඔවුන් කල් තියාම දැන සිටියහ.

තම නගරය වූ ස්පාර්ටාවට ලයිකගරස් විසින් ස්ථාවරත්වය ගෙනාවේ යුක්තියේ නාමයෙන් කුඩා සොරකම්වලට ඉඩදීමෙන්. වඩාත්ම අන්තවාදී වූ නිදහස සමඟ වඩාත්ම සම්පූර්ණ වූ බන්ධනය එකතු කරමින්. සිතාගත නොහැකි තරම් විකෘති වූ විශ්වාසයන් සමඟ ශ්‍රේෂ්ඨ වූ මැදපිළිවෙතක් එකතු කරමින්. කලා, වානිජ්‍ය, මුදල් හා ආරක්ෂාව යනාදී සියල්ලක්ම තම නගරයට අහිමි කරවන ආකාරයෙන් ඔහු පෙනී සිටියේය. භෞතික ශුභඵලයක

බලාපොරොත්තු නොමැතිවී ස්පාර්ටාවේ අභිලාෂයන් තුරන්වී ගියේය. ස්වභාවික දයාවට ඉඩකඩක් නොලැබුණි. මිනිසෙක් පුතෙක් නොවීය, සැමියෙක් නොවීය, පියෙක් නොවීය. පතිවත යන්න ආරක්ෂා කරගත යුත්තක් නොවීය. ස්පාර්ටාව එහි ශ්‍රේෂ්ඨත්වයට හා කීර්තියට ලයිකගරස් විසින් ගෙන ගියේ මේ මාර්ගයේය.

ග්‍රීසියේ දකින්නට ලැබුණු මේ උද්ධච්ච හැදියාව නූතන අපේ සමාජයේ පිරිහීම හා දූෂණය මැද නැවත ක්‍රියාවට නංවා ඇත.

එක් අවංක වූ ව්‍යවස්ථාදායකෙයක්, අපේ ජනතාව අතර අවංකත්වය නැවත පිහිටුවා ඇත්තේ ස්පාර්ටාවේ ජනතාව අතර එඩිතර බව පිහිටුවන ලද ආකාරයෙනි.

උදාහරණයක් හැටියට විලියම් පෙන් මහතා සත්‍ය ලයිකගරස් කෙනෙකි. පෙන් මහතාගේ ඉලක්කය සාමය සේ පෙනී සිටියද, -ලයිකගරස්ගේ ඉලක්කය වූයේ යුද්ධයයි- ඔවුන් එක හා සමාන වූහ. නිදහස් මිනිසුන්ට වඩා ඉහළ මට්ටමකින් සද්ගුණවත් බව ඇතැයි කියා, පුරවැසියන් විසින් තමන් වැරදි යැයි අල්ලාගෙන සිටි මත අත්හැර, ආශාව දමනය කරගෙන, ඔවුන් දෙදෙනා විසින් තීරණය කරන ලද මාර්ගයක ඔවුන්ගේ ජනතා කොට්ඨාශය ගෙනයන්නට ඔවුන් දෙදෙනා සමත් වූහ.

ඔවුන්ගේ යහපත පිණිස ඔවුන්ගේ නීති සම්පාදකයන් විසින් අනාතනා හැඩගස්වන ලද ජනතාවක් ගැන පැරගුවේ රට අපිට තවත් ආදර්ශයක් ගෙනැවිත් දෙයි: අණ දෙන්නට ඇති කැමැත්ත ජීවිතයේ ශ්‍රේෂ්ඨතම සතුට යැයි අයෙක් සලකන්නේ නම්, එම පුද්ගලයා විසින් සමාජයට එරෙහිව අපරාධයක් කරන්නට පසුබට නොවෙනු ඇතැයි යන්න සත්‍යයකි. එහෙත් හැම අවස්ථාවක දී ම රටේ පුරවැසියන් සතුටු කරන අන්දමින් ආණ්ඩු කිරීම යනු උතුම් වූ පරමාදර්ශයකි.

මේ හා සමාන ආණ්ඩු පිහිටුවා ගන්නට රිසිවූවන්ට කළ යුතු වූ පිළිවෙතක් මෙසේ නිර්දේශ කර ඇත: දේපල පොදුවේ පාවිච්චියට හැකිවන පරිදි ප්ලේටෝගේ ජනරජයේ කියා ඇති විදියට පිළිවෙතක් හදා ගැනීම; ප්ලේටෝ කියා ඇති විදියට ජනතාව ලවා දෙවියන්ට ගරු

කිරීම; සම්ප්‍රදාය ආරක්ෂා කරගැනීම උදෙසා විදේශිකයන්ට පුරවැසියන් අතර ගැවසීමට ඉඩක් නොතැබීම; වානිජ්‍ය කටයුතු පුරවැසියන් අතින් නොව ආණ්ඩුව විසින් කරගෙන යෑම. සුඛෝපභෝගී භාණ්ඩ වෙනුවට නීති සම්පාදකයන් විසින් කලා කටයුතුවලට ඉඩකඩ සැපයිය යුතුය. ඒවා ආශාවන් නොව උවමනාවන් තෘප්තිමත් කරනු නැත.

# බියකරු අදහසක්

අසභ්‍ය වූ සම්මෝහනයට අසුවෙන අය මෙසේ කියනු ඇත: "මොන්ටෙස්කියු මෙය කිව්වා! ඉතින් ඒ නිසා එය මහේශාක්‍යයයි! එය අති උදාරයි!" ඒත් මට, මට තියෙනවා මගේ මතය කියන්නට තරම් එඩිතරකමක්. මම අහනවා: මොකක් කිව්වා! ඔබට ලැජ්ජාවක් නැද්ද එය සුදුසු යැයි කියන්නට? එය බියකරුයි! එය තුච්ඡයි! ඉහත අහඹු ලෙසකින් උපුටා දැක්වූ මොන්ටෙස්කියු ලියූ ඡේද තුලින් පෙනෙන්නේ ඔහු පුද්ගලයන්, නිදහස, දේපල -මුළු මිනිස් සංහතියම- ව්‍යවස්ථාදායකයන්ට තම ප්‍රඥාව විමසා බලන වෑයමක යෙදෙනු සඳහා පරිනමන ලද භෞතික අමුද්‍රව්‍ය සමූහයක් පමණක් කියාය.

# ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ නායකයා

මේ විෂය ගැන රූසෝ කියා ඇත්තේ මොනවාදැයි විමසා බලමු. මහජන කටයුතු ගැන ලියා ඇති ඔහු ප්‍රජාතන්ත්‍රවාදය ගැන වැඩියෙන්ම තතු දන්නා පුද්ගලයාද වෙයි. සමාජ ව්‍යුහය ජනතාවගේ අභිමතය මත පදනම් කළද, ඔහු අනෙක් සියල්ලන්ටම වඩා, නීති සම්පාදකයන් ඉදිරියේ මිනිස් සංහතියේ අකර්මණ්‍යත්වය සම්පූර්ණයෙන්ම පිළිගෙන ඇත්තේය: "ශ්‍රේෂ්ඨ කුමාරයෙක් යන්න දුලභ වූ සත්‍යයක් නම්, එහෙනම් ඉතින් ශ්‍රේෂ්ඨ ව්‍යවස්ථාදායකයෙක් යන්න ඊටත් වඩා දුලභ වූවෙක් නොවන්නේද? කුමාරයෙක්ට අනුගමනය කරන්නට සිද්ධ වෙන්නේ නීති සම්පාදකයන් විසින් සැලසුම් කරන ලද ආදර්ශයක් පමනි. මැෂිම නිර්මාණය කරන කාර්මිකයා වනාහී ව්‍යවස්ථාදායකයාය; කුමාරයා යනු එය ක්‍රියාවට නංවන ශ්‍රමිකයා පමණකි.

“ඉතින් මේ සියල්ලේ දි ජනතාව රඟන්නේ කුමන චරිතයක්ද? ඔවුන් ක්‍රියාවට නංවා ඇති මැෂිම පමණි. ඇත්ත වශයෙන්ම, ඔවුන් මැෂිම හදන්නට යොදාගත් අමුද්‍රව්‍ය පමණක් වනවා නොවේද?”

මේ විදියට සලකද්දී ව්‍යවස්ථාදායකයා සහ කුමාරයා අතර ඇති සබඳතාවය හා සමාන වූවක් කෘෂිකාර්මික විශේෂඥයා සහ ගොවියා අතර ඇත. එසේම කුමාරයා සහ ඔහුගේ පුරවැසියන් අතර ඇත්තේ ගොවියා සහ ඔහුගේ ගොවිබිම අතර ඇති සම්බන්ධය වැන්නකි. ඉතින් මේ රචකයා තමාව මිනිස් සංහතියට ඉතා ඉහළ උසස්වූ ස්ථානයකට ගෙන ගොස් එහි තබා ඇත. රූසෝ ව්‍යවස්ථාදායකයන්ටත් ඉහළින් සිටින්නෙකි. ඔහු ඔවුනට උදාරම් වදනින් මෙවැනි නීති සම්පාදනය උගන්වයි: “ඔබ ආණ්ඩුවට ස්ථාවර බවක් ගෙනෙනවාද? එහෙම නම් අන්තවාදයන් හැකි තරමින් අඩු කරගන්න උත්සාහ කරන්න. ධනවත් අයව හෝ හිඟන්නන්ව ඉවසා සිටින්න එපා.”

“පස නිසරු හෝ මුඩු නම්, රට එහි වැසියන්ට කුඩා නම්, එහෙම නම් කලාව සහ කර්මාන්තයට යොමුවෙන්න. ඔබට අවශ්‍ය ආහාර සඳහා මෙසේ නිෂ්පාදනයේ සහ වෙළඳාමේ යෙදෙන්න... සරු පසක් ඇත්නම් - වැසියන් මදි නම්- ඔබේ සම්පූර්ණ අවධානය කෘෂිකර්මයට යොමු කරන්න. මන්ද මෙය ජනගහණය වර්ධනය කරන්නකි. ඒ නිසා කලාව අතුරුදහන්වී යයි. කලාව ඉටුකරන්නේ රටක ජනගහණයක් අඩු කිරීම පමණයි.”

“ඔබට පහසුවෙන් ළඟාවිය හැකි වෙරළබඩ පෙදෙස් වැඩි නම්, එහෙම නම් මුහුද වෙළඳ නැව්වලින් පුරවන්න. ඔබට දීප්තිමත් එහෙත් කෙටි වූ පැවැත්මක් තිබෙනු ඇත. ඔබේ මුහුද වදින්නේ උස කඳුවැටිවල නම් ජනතාවට මිලේච්ඡයන් වී මාළු කන්නට අවසර දෙන්න. ඔවුන් නිහඬව ජීවත්වනු ඇත. -එය වඩා හොඳ වෙනු ඇත- සහතිකයෙන්ම ඔවුන් වඩා සතුටින් ජීවත්වෙනු ඇත.”

“කෙටියෙන් කිව්වොත්, සියල්ලන්ටම බලපාන ආප්තෝපදේශ වලට අමතරව, සෑම ජනතාවකටම තමන්ට විශේෂ වූ ඒ ඒ අවස්ථා ඇත.

මේ කාරණාව පමණක් ඒ ඒ අවස්ථා අනුව සරිලන පරිදි නීති සම්පාදනය කරන්නට හේතු වෙයි.”

“මේ හේතුව තමයි යුදෙව්වන් මුලින් -මෑතක දී අරාබි වැසියන්- තම ප්‍රධාන අරමුණ ලෙසින් ආගම තබාගත්තෙ. ඇතීනියානුවන්ගේ අරමුණ වූයේ සාහිත්‍යයයි. කාතේජ් සහ ටයෙරේ හි අරමුණ වූයේ වානිජ්‍යයයි. රෝඩ්ස් හි නාවුක කටයුතු අරමුණ විය. ස්පාර්ටාවේ අරමුණ යුද්ධයයි. රෝමයේ අරමුණ වූයේ සද්ගුණයයි. නීතියේ ජවය නම් කෘතියේ රචකයා විසින් පෙන්වා දී ඇත්තේ නීති සම්පාදකයන් විසින් මේවායෙන් මොන කටයුතුවලට තම අවධානය යොමු කරන්නේද යන්න තීරණය කරනුයේ කලාව විසිනි ... ඒත් නීති සම්පාදකයෙකුට අරමුණ නිසි සේ වටහා ගැනීමට බැරිව වැරැද්දක් සිද්ධ වුවහොත්, මෙසේ ස්වභාවයෙන් පවතිනවා යැයි පෙන්වන විදියට වෙනස් වූ සිද්ධාන්තයක් අනුගමනය කළහොත් කුමක්වේද? එවැනි විශේෂ වූ සිද්ධාන්තයක් සමහර අවස්ථාවක දී තෝරාගන්නේ වහල්ක්‍රමය, සමහර අවස්ථාවක දී නිදහස, සමහර අවස්ථාවක දී ධනය, සමහර අවස්ථාවක දී ජනගහණය, සමහර අවස්ථාවක දී සාමය, සමහර අවස්ථාවක දී ආක්‍රමණය වුවහොත්? අරමුණ කුමක්දැයි සොයා ගැනීමේ දී ඇතිවන ව්‍යාකූලතාවය නිසා ක්‍රමයෙන් නීතිය දුර්වල වී ව්‍යවස්ථාව අඩපණ කරනු ඇත. අරමුණ වෙනස් කරන තෙක් හෝ ඉවත් කර දමන තෙක් හෝ පරාජය කළ නොහැකි ස්වභාව ධර්මය නැවත රජයන තෙක් නොනැවතී කෙරෙන විප්ලව වලට රටට මුහුණ දෙන්නට සිද්ධ වෙයි.”

ඉතින් ස්වභාව ධර්මය යනු පරාජය කළ නොහැකි ලෙසකින් රට අල්ලා ගන්නට සමත් වෙන්නේ නම්, ව්‍යවස්ථාදායකයන්ගේ අවශ්‍යතාවයක් නැතැයි කියා ඇයි රූසෝ ඒක මුලින්ම කියන්නේ නැත්තේ? මිනිසුන් සරු පස දැක්කාම සිය සිහිබුද්ධියට අවනතවී වගාබිම් පටන් ගන්නට ස්වභාවයෙන්ම පෙළඹෙයි කියා ඇයි ඔහු දකින්නේ නැත්තේ? පහසුවෙන් පිවිසිය හැකි වෙරළබඩ පෙදෙස් වැඩියෙන් ඇත්නම් ඔවුන් වානිජ්‍යයේ නිරත වෙනු ඇතැයි දකින්නේ නැත්තේ? පහසුවෙන් වැරදීම් සිද්ධ වෙනු ඇතැයි කියන රූසෝ, සොලොන් හෝ ලයිකගරස් වැන්නෙක් නැතිව ඇයි මිනිසුන්ට ඒ තීරණ තනිවම ගන්නට නොහැකි යයි සිතන්නේ?

# සමාජවාදීන්ට අවශ්‍ය බලහත්කාරයෙන් අනුකූලතාවය පැතිරවීමටයි

එය එසේ තිබියදී, රූසෝ විසින් නිර්මාණකරුවන්ට, සංවිධායකයන්ට, අධ්‍යක්ෂකවරුන්ට, ව්‍යවස්ථාදායකයන්ට සහ නියාමකයන්ට බලවත් වගකීමක් පවරයි. ඒ නිසා ඔහු ඔවුන්ට අනුශාසනා කරද්දී වඩා පැහැදිලිව ලියයි:

"දේශපාලන නිර්මාණයක් ජනතාව වෙනුවෙන් බිහිකරන්නට ඉදිරිපත් වෙන්නා, තමන් විසින් තමාට එය කළහැකි යැයි විශ්වාස කළ යුතුය. එක විදියකින් කියද්දී, එය මනුෂ්‍ය ස්වභාවය වෙනසකට භාජනය කරන උත්සාහයකි; සෑම ඒකීය පුද්ගලයෙක්ම කටයුතු කරන ආකාරය වෙනස් කිරීම; -ඔහු ඒකකයක් හැටියට ගත්තාම හුදකලා වූ පරිපූර්ණ වූ සම්පූර්ණයකි- ඔහුව වඩා විශාල සම්පූර්ණයක එක කොටසක් පමණක් බවට හැරවීම, එයින් පමණක් එතැන් පටන් ඔහුට තම පැවැත්ම හා ජීවිතය ලැබෙන පරිදි සැකසීම. ඉතින් මේ දේශපාලන නිර්මාණයක් ජනතාව වෙනුවෙන් නිර්මාණය කරද්දී එයට ඉදිරිපත් වෙන්නා මිනිසාගේ හැදියාව වෙනස් කිරීම තමනට හැකි යැයි විශ්වාස කළ යුතුයි. එය ශක්තිමත් කරත හැකි යැයි විශ්වාස කළ යුතුයි. ස්වභාව ධර්මයෙන් ලැබෙන භෞතික සහ ස්වාධීන පැවැත්ම වෙනුවට කොටසක් පමණක් වූ සදාචාර පැවැත්මක් ආදේශ කරන්නට සූදානමින් සිටිය යුතුය. කෙටියෙන් කිවහොත්, දේශපාලන මිනිසා නිර්මාණය කරන්නට යන මිනිසා තුල වූ ඔහුගේ බලය ඉවත්කර ඔහුට ස්වභාවයෙන්ම නුහුරු වූ වෙනත් දේවල් ප්‍රදානයට හැකි විය යුතුය."

අහෝ මිනිස් ස්වභාවය! රූසෝගේ අනුගාමිකයන්ට බාරදුන්නොත් මිනිසාගේ උදාරත්වයට කුමක්වේද?

# මිනිස් සංහතිය අනා තනා හැඩගස්වන්නට ව්‍යවස්ථාදායකයා කැමැත්තේය

ව්‍යවස්ථාදායකයන් විසින් මිනිස් සංහතිය අනා තනා හැඩගස්වන විෂය ගැන රෙනාල් කියා ඇත්තේ මොනවාදැයි විමසා බලමු:

"ව්‍යවස්ථාදායකයෙක් පළමුව පරිසරය, වායුව සහ පස ගැන සිතා බැලිය යුතුය. ඔහුගේ යුතුකම් මොනවාදැයි තීරණය කරන්නේ ඔහු ඉදිරියේ ඇති සම්පත් වෙති. ඔහු පළමුවෙන්ම තමා සිටින ස්ථානය ගැන විමසිය යුතුය. සාමුද්‍රීය වෙරළබඩ ජීවත්වෙන ජනගහණයක් සඳහා යාන්ත්‍රණ නීති සම්පාදනය කළ යුතුය. රට ඇතුලත පදිංචිකරුවන් සඳහා පස්වල ස්වභාවය සහ සරුබව සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කළ යුතුය..."

"ව්‍යවස්ථාදායකයෙක් ප්‍රාඥයෙක් දැයි පෙන්වන්නේ ඔහු ගෙනෙන දේපල බෙදා හැරීමේ ක්‍රමවේදය අනුවයි. සාමාන්‍ය රීතියක් හැටියට, ඕනෑම රටක නව උපනිවේෂයක් ස්ථාපිත කරද්දී, හැම පුරුෂයෙකුටම තම පවුලට කන්නට දෙන්න ප්‍රමාණවත් පරිදි ඉඩම් ප්‍රමාණයක් ලබාදිය යුතුය..."

"වගා නොකළ බිමක ඔබ දරුවන් ඇති දැඩි කරන විට, ඔබට වෙනත් කිසිවක් නොව අවශ්‍ය වන්නේ සත්‍යයේ බීජ සමඟ විචාර බුද්ධියේ වර්ධනයයි... ඒත් ඔබ අතීතයක් ඇති මිනිසුන් අලුතින් භූමියක නැවත පදිංචි කරද්දී, එවිට ව්‍යවස්ථාදායකයා සතු කුසලතාවය නම් හිංසාකාරී වූ මතයන් හෝ චාරිත්‍ර වාරිත්‍ර වලට ඉඩ නොදෙන, ඒවා හැකි තරමින් මුලිනුපුටා දමන සහ නිවැරදි කරන නීති පනත්ය. මේ හිංසාකාරී වූ අදහස් හා හැසිරීම් වලට ඉඩක් නොදෙන්නට ඔබ සමත් වුවහොත්, එවිට දෙවැනි පරම්පරාව වෙද්දී දරුවන්ට දෙන මහජන අධ්‍යාපනයකින් ඔබට ඒ අඩුපාඩු මකා දමන්නට හැකිය. තරුණ අයට උගන්වන්නට හැකි ප්‍රඥාවන්ත මිනිසුන් කැටුව නොයන්නේ නම් කුමාරයෙක් හෝ ව්‍යවස්ථාදායකයෙක් කිසිම අවස්ථාවක උපනිවේෂයක් පිහිටුවන්නට යා නොයුතුය..."

"නව උපනිවේෂයක සුපරීක්ෂාකාරී නීති සම්පාදකයෙකුට තම ජනතාවගේ චාරිත්‍ර හැදියාවන් යහපතට වෙනස් කරන්නට ඇති තරම් අවස්ථා විවෘතව ඇත. ඔහුට සද්ගුණය හා ප්‍රඥාව ඇත්නම්, භූමිය හා ජනතාව ඇත්නම්, සමාජයක් හදන්න සැලැස්මක් ඔහුගේ සිතට ගලා

එනු ඇත. රචකයෙකුට ඒ සැලැස්ම කලින් සූදානම් කරදිය හැක්කේ රළු ආකාරයෙන් පමණි. මන්ද සියලු අවස්ථාවන්ට සරිලන සේ හිතන්නට අවස්ථාවන් සියල්ල මොනවාදැයි පැහැදිලි කරගන්නට නොහැකි නිසාය. ගැටළුවක විවිධ පැතිකඩ ඇත. ඒ සියල්ල කළින් දැනගත නොහැකියාව නිසා සියල්ලට උපදෙස් දිය නොහැකිය."

# නීති සම්පාදකයන් කියාදුන්නේ මිනිසා කළමනාකරණය කරන්නේ කෙසේද කියාය

මිනිසුන් කළමනාකරණය කරන්නේ කෙසේදැයි කියාදුන් රෙනාල්ගේ උපදෙස් කෘෂිකාර්මික මහාචාර්යවරයෙක් තම සිසුන්ට කරන දේශනයක් හා සම කළ හැකිය: "පරිසරය තමයි ගොවියෙකුට බලපාන පළමු රීතිය. ඔහු සතු සම්පත් ඔහුගේ ක්‍රියාවලිය කුමක්දැයි තීරණය කරනු ඇත. ඔහු මුලින්ම තම පරිසරය තීරණය කළ යුතුය. ඔහුගේ පස් මැටි නම්, ඔහු මේ මේ විදියට කළ යුතුයි. ඔහුගේ පස් වැලි නම්, ඔහු තවත් විදියකට කටයුතු කළ යුතුයි. තමන් සතු භූමිය සුද්ද කර එහි පස් ගුණාත්මක බවෙන් වැඩිකරගන්නට කැමති ගොවියාට හැම පහසුකමක්ම ඔහු ඉදිරියේ ඇත. ඔහු කුසලතාවයෙන් යුතු වූයේ නම්, ඔහුට ලබාගත හැකි පොහොර වලින් ඔහුට සැලැස්මක් ඉඟිකරනු ඇත. මහාචාර්යවරයෙකුට මේ සැලැස්ම කළින් කියා දිය හැකියාව ඇත්තේ රළු වශයෙන් පමණි. සියලු අවස්ථාවලට සරිලන සේ සිතන්නට ගොවියා ඉදිරියේ නොයෙක් ආකාරයෙන් මතුවෙන ගැටළු ගැන කළින් උපකල්පනය කළ නොහැකිය."

අහෝ මෙවැනි අති උදාර රචකයන්! කරුණාකරලා මතක තියාගන්න මේ මැටි, මේ වැලි, සහ මේ පොහොර ඔබ ඉතා ඉක්මණින් හිතුමතයේ සැලසුම්වලට යොදාගන්නා වූ දේවල් යනු මිනිසුන් බව! ඔවුන් ඔබ හා සමාන වූ අයම බව! ඔවුන් ඔබ හා සමාන වූ බුද්ධිමත් හා නිදහස් මිනිසුන් බව! ඔබ වෙත වගේම ඔවුන්ට ද දෙවියන් වෙතින් ලැබී තියෙනවා නිරීක්ෂණයට, කලින් සැලසුම් කරන්නට, හිතන්නට, තීරණයක් ගන්නට උපකාර කරන ඉන්ද්‍රියයන්!

# තාවකාලික ආඥාදායකයන්

නීතිය හා ව්‍යවස්ථාදායකයා පිළිබඳව පහත උපුටන වගන්තියට කළින් මැබ්ලි ලියා ඇත්තේ, ආරක්ෂාව නැතිකමෙන් නීති යල්පැන ගිහින් ඇතැයි කියාය. ඉතින් ඔහු පාඨකයාව මෙසේ අමතයි:

"මේ තත්වය යටතේ, ආණ්ඩුවේ දුනු කම්බි දුර්වල වෙලා. ඊට ඇලුත් ඇදීමේ ශක්තියක් ලබාදෙන්න, එවිට සියලු දුෂ්ටකම් සමනය වේවි.. වරදට දඬුවම් කරන එක ගැන අඩුවෙන් හිතන්න, ඔබට අවශ්‍ය වූව වර්ධනය කරගැනීම සඳහා පාරිතෝෂිකයන් දීමයි වැඩියෙන් උවමනා. මේ ආකාරයෙන් ඔබේ ජනරජයේ තරුණ ජවය නැවත ස්ථාපිත කරන්නට ඔබට පුළුවනි. මේ ක්‍රමය ගැන නිදහස් මිනිසුන් නොදන්නා නිසා, ඔවුනට ඔවුන්ගේ නිදහස නැතිවෙලා! ඒත් කුරිරු ස්වභාවයන් කොතරම් හිස ඔසවලා ද කියතොත් සාමාන්‍ය ආණ්ඩු ප්‍රතිපත්ති වලින් මේක සමනය කරන්නට බැහැ. ඉතින් කෙටි කාලයකට පමණක් වඩා දරුණු වූ නීති ක්‍රියාත්මක කළ හැකි මණ්ඩල, වැඩි බලයක් දීලා පත්කරන්න. පුරවැසියන්ගේ සිතුවිලි සහ කල්පනාවලට දැඩි පහරක් දිය යුතුයි."

මේ ආකාරයෙන් මැබ්ලි වෙළුම් විස්සක් පුරා පැහැදිලි කරගෙන යන්නේය.

-සම්භව්‍ය අධ්‍යාපනයෙන් එන- මෙවැනි ඉගැන්වීම්වල බලපෑමෙන් එළඹෙන්නේ සියල්ලන් විසින්ම මිනිස් සංහතියට ඉහළින් තමන්ව තබාගෙන තමන්ගේ විදියට හැඩගස්වන, සංවිධානය කරන, රෙගුලාසි හදන්නට ඇති කැමැත්ත පැතිරෙන කාලයකි.

# සමාජවාදීන්ට අවශ්‍ය වස්තු සමානාත්මතාවයයි

ව්‍යවස්ථාදයකයන් සහ මිනිස් සංහතිය පිළිබඳව මේ විෂය ගැන කොන්ඩිලැක් කියන්නේ කුමක්දැයි ඊළඟට විමසමු.

“මගේ සාමිවරයාණෙනි, සොලොන් ගේ හෝ ලයිකගරස් ගේ හෝ චරිතය අභ්‍යුපගමනය කර බලන්න. මේ රචනාව කියවා අවසන් කරන්නට පෙර, ඇමෙරිකාවේ හෝ අප්‍රිකාවේ වාසය කරන ම්ලේච්ඡයන්ට නීති ප්‍රදානය කර ප්‍රීති වන්න. මේ තැනින් තැන සැරිසරන අයව ස්ථිර පදිංචියකට සීමා කරවන්න. ඔවුනට සත්ව පාලනය කියා දෙන්න... ස්වභාව ධර්මය විසින් ඔවුනට දී ඇති සමාජ බුද්ධිය වර්ධනය කරන්නට උත්සාහ කරන්න... මිනිස් සංහතිය වෙනුවෙන් යුතුකම් ඔවුන් ලවා බලහත්කාරයෙන් ඉටු කරවීම පටන් ගන්න... ඉන්ද්‍රීය වින්ඳනයන් අප්‍රිය වෙන තෙක් ඔවුනට දඬුවම් දී ඔවුන් වෙනස් කරගන්න. එවිට ඔබට පෙනී යන්නේ ඔබේ ව්‍යවස්ථාවල හැම අවස්ථාවක දී ම මේ ම්ලේච්ඡයන්ට දුසිරිතක් නැති කරගන්නට හැකිවී සද්ගුණයක් වඩවා ගන්නට හැකිවෙන බවයි.”

“සෑම ජනතාවකටම නීති ඇත. එහෙත් සුළු පිරිසක් පමණක් සතුටින් සිටිති. ඇයි මේ? මොකද නීති සම්පාදකයන් බහුතර සෑම අවස්ථාවක දී ම සමාජයේ අදියස කුමක්ද යන්න ගැන නොදන්නාකමින් සිටි නිසයි. සමාජයේ අදියස නම් පොදු යහපත සඳහා පවුල් එකට එකතු කිරීමයි.”

“නීතියේ දී අපක්ෂපාතීත්වය ගැනීම කාරණා දෙකකින් යුක්ත වෙයි: සමානාත්මතාවය පිහිටුවීම සහ පුරවැසියන්ගේ උදාරත්වය සමානාත්මතාවයෙන් පිහිටුවීම... නීති වලින් වඩා වැඩියෙන් සමානාත්මතාවයක් පිහිටුවද්දී, ඒවා හැම පුරවැසියෙකුටම වඩා වැඩි අවදානමකින් යුතුවෙයි... වස්තුවෙන් සහ උදාරත්වයෙන් සෑම මිනිසෙක්ම එක හා සමාන වෙද්දී -මේ සමානාත්මතාවය අවුල් කරන්නට කිසිම ඉඩක් නොලැබෙන සේ නීති හදා ඇතිවිට- එවිට ගිජුබව, අභිප්‍රාය, අකමැත්ත, කුසීතකම, ද්වේෂය, කුහකකම යනාදීන් මුල්කරගෙන මිනිසුන් උද්ඝෝෂණ කරන්නේ කෙසේද?”

“ඔබ ස්පාටා ජනරජය ගැන උගත් දැයින් ඉහත ප්‍රශ්නය ගැන දැනුමක් ලබා සිටිය යුතුය. සාමාන්‍ය ස්වභාවය හෙවත් සමානාත්මතාවය ස්ථාපිතය සඳහා වෙනත් කිසිම රටක් එසේ නීති පනවා නැත.”

# සමාජවාදී රචකයන්ගේ භ්‍රමය (වැරදීම)

සත්‍යයෙන්ම, 17 වැනි සහ 18 වැනි සියවස්වල දී ශ්‍රේෂ්ඨ කුමාරයෙක් හෝ ශ්‍රේෂ්ඨ නීති සම්පාදකයෙක් හෝ ශ්‍රේෂ්ඨ ප්‍රඥාවන්තයෙක් විසින් මිනිස් සංහතිය යනු -හැඩයෙන්, මුහුණින්, ජවයෙන්, චලනයෙන්. ජීවයෙන්- සියල්ලට මුහුණ දෙන්නට සූදානමින් සිටි අකර්මන්‍ය අංශූ ලෙසින් සැලකිල්ලට ගැනීම අරුම වූ කාරණයක් නොවේ. ඒ ශතක පෝෂණය වූයේ පුරාතනය ගැන ඉගෙනීමෙනි. ඉතින් පුරාතනය ගැන වූ අධ්‍යයනයේ -ඊජිප්තුවේ, පර්සියාවේ, ග්‍රීසියේ, රෝමයේ- යන සියල්ලන්ගේම දකින්නට ලැබුනේ මිනිසුන් කිහිප දෙනෙකුට ප්‍රෝඩාව සහ බලය පාවිච්චියෙන් ලැබුන කීර්තියට පින් සිද්ධ වන්නට, තම හිතුමතයට අනුව මිනිස් සංහතිය අනා තනා හැඩගස්සවන්නට හැකි වූ අපූර්ව දර්ශනයයි. එහෙත් එයින් කියන්නේ මේ තත්වය කැමැත්තෙන් බාරගන්නා වූවක් කියා නොවේ. එයින් ඔප්පු කරන්නේ මිනිසා සහ සමාජය යනු තම තත්වය දියුණු කරගත හැකියාවෙන් වූ නිසා, භ්‍රමය, නොදන්නාකම, දුෂ්ට පාලනය, වහල් ක්‍රමය සහ මිථ්‍යා ඇදහිලි යනාදිය ස්වභාවයෙන්ම මිනිස් ඉතිහාසයේ මුල් කාලයේ දී වැඩියෙන්ම පැවති බවයි.

ඉහත කියන රචකයන් මේ පුරාතන සංස්ථාවන් ඒ ආකාරයෙන් දැකිම භ්‍රමයක් නොවේ. එහෙත් ඔවුනට වැරදුන තැන නම් ඔවුන් ඒවා අනාගත පරම්පරා සඳහා පිළිපැදිය යුතු, අගය කළ යුතු දේ හැටියට පිරිනැමීමයි. අතාර්කික වූ අඳබාලයන් ලෙසින් හැසිරුන ආකාරය ඔවුන් වටහා ගත්තේ පුරාතන ලෝකයේ ආශ්චර්යය කියාය. ඔවුන්ගේ වැරදීම ඒ කෘතිම වූ සමාජ තුල වූයේ සද්ගුණය, සතුට, සහ උදාරත්වය යැයි වරදවා වටහා ගැනීමය. ඔවුන්ට වටහාගත නොහැකි වූයේ කාලයාගේ ඇවෑමෙන් බුද්ධිය වර්ධනය වී ගිය ආකාරයයි. මේ බුද්ධිමය වර්ධනයේ ප්‍රමාණත්වය අනුව, බලය විසින් අයිතියේ පැත්ත ගන්නා බවයි. සමාජයට බලයේ අයිතිය යළි ලැබෙන බවයි.

# නිදහස යනු කුමක්ද?

අපි දකින මේ දේශපාලන අරගලය කුමක්ද? සියලුම ජනතාව විසින් නිදහස උදෙසා කරන සහජ අරගලයයි. නම ඇහෙද්දීම හදවත වේගයෙන් ස්පන්දනය කරන්නට හැකි වූ, ලෝකය හොලවන්නට හැකි වූ, මේ නිදහස යනු කුමක්ද? එය සියලු නිදහස්වල එකතුව නොවේද? එනම් සිහිබුද්ධියට, අධ්‍යාපනයට, සබඳතා, මාධ්‍ය, සංචාරයට, ශ්‍රමයට, වෙළඳාමට, කෙටියෙන් කිවහොත් නිදහස යනු සෑම පුද්ගලයෙකුටම, වෙනත් කිසිවෙකුට උපද්‍රවයක් නොකර, තම ඉන්ද්‍රියයන් වලින් සම්පූර්ණ ප්‍රයෝජන ගන්නට ලැබෙන නිදහස නොවේද? නිදහස යනු සියලු යටත්භාවයන් විනාශ කර දැමීම නොවේද? නිදහස තුල නීතියෙන් පැනෙන යටත්භාව අඩංගු වෙනවා නොවේද? අවසානයේ දී, නිදහස යනු ඒකීය පුද්ගලයන්ගේ අයිතීන් ඔවුන්ගේ ස්ව ආරක්ෂාව සඳහාත්, අයුක්තියට දඬුවම් දීම සඳහාත්, සංවිධානය කරන්නට පමණක් හැකිවන ලෙසින් නීතිය සීමා කිරීම නොවේද?

ඉතින් පිළිගන්න වෙනවා, නිදහස කරා දුවන මිනිසාගේ ස්වභාවික උත්සාහය දැවැන්ත ලෙසින් මර්ධනය, විශේෂයෙන්ම ප්‍රංශයේ, සිද්ධ වෙන බව. මෙසේ සිද්ධ වෙනුයේ පුරාතන අධ්‍යයනයෙන් ඉගෙනගත්තා වූ මාරක අභිප්‍රායක් ඇති අපේ මහජන කටයුතු ගැන ලියන රචකයන් නිසායි. ඔවුනට ඕනෑ තමන්ව මිනිස් සංහතියෙන් ඉහළ තැනක තබාගෙන තම හිතුමතය අනුව අනුන් හැඩගසා, සංවිධානය කර විධිමත් කරන්නටයි.

# පුණ්‍යාධාර නාමයෙන් කරන කෲර පාලනය

සමාජය නිදහස කරා යන අරගලයේ දී, මේ සුප්‍රසිද්ධ වූ පුද්ගලයන් තමන්ව ඒ ගමනේ ඉස්සරහින්ම තියාගෙන හිටියත් ඔවුන්ගේ හදවත් පිරී ඇත්තේ 17 වැනි 18 වැනි සියවස්හි ජවයෙනි. ඔවුන් හිතන්නේ ඔවුන්ගේ පුණ්‍යාධාර නාමයෙන් කරන කෲර පාලනයේ දී බිහිවන සමාජ නවෝත්පාදන තුල මිනිස් සංහතිය යටත්කර තියන්නට පමණි. රූසෝට මෙන්, ඔවුන් ද රිසි වන්නේ, ඔවුන්ගේ අදහස් වලින් පමණක් සිහින මවන ලද මේ මහජන සුබසාධනයේ බරෙන්, විරෝධතාවයක් දක්වන්නට නොහැකි ලෙසකින් බලය පාවිච්චිකර, මිනිසා හිරකර තබන්නටය.

1789 දී මෙය විශේෂයෙන්ම සත්‍යයක් විය. පරණ ආණ්ඩුව විනාශකර දැමූ විගසින් සමාජයට අත්විඳින්නට ලැබුනේ ඊටත් වඩා කෘතිම වූ සැලසුම් අනුව හැඩගැසෙන්නටය. ඒ සියල්ලම පටන්ගත්තේ එකම මූලයකිනි: නීතියේ සර්වබලධාරීත්වයෙනි.

ඒ යුගයේ දේශපාලනඥයන් සහ රචකයන් කිහිප දෙනෙකුට සවන් දී බලන්න:

සාන්ත-ජස්ට්: "නීති සම්පාදකයා අනාගතයේ නියමුවෙකි. මිනිස් සංහතියේ යහපත තීරණය කිරීම ඔහුගේ කාර්යයි. ඔහුගේ කැමැත්ත කුමක්ද, මිනිසුන් එසේ හැඩගැසීම ඔහුට අයිති වූ කාර්යභාරයකි."

රොබෙස්පියෙර්: "ආණ්ඩුවේ කාර්ය භාරය නම් ජාතියේ ශාරීරික හා මානසික බලය සමූහාණ්ඩුවේ පරමාර්ථය වෙනුවෙන් යොදා ගැනීමයි."

බිලෝඩ්-වැරෙන්ස්: "නිදහස යළි ලබාගන්නා මිනිස්සු අලුතින් හදන්නට ඕනෑය. පරණ පක්ෂපාතීකම්, පරණ සිරිත් විරිත්, නොලැබෙන සෙනෙහස නිවරද කරන්නට, අනවශ්‍ය උවමනා එපා කරවන්නට, ස්වභාවයෙන් පිහිටන දුසිරිත් විනාශ කරදමන්නට, ශක්තිමත් බලය සහ ජවයෙන් පිරි ක්‍රියා පාවිච්චියට ගැනීම අත්‍යාවශ්‍යයය... පුරවැසියෙනි, ස්පාටාවේ ශක්තිමත් පදනමක් ගොඩනඟන්නට ලයිකගරස්ගේ වෙනස් කරන්නට ඉඩක් නොමැති කර්කශ ප්‍රතිපත්ති සහාය විය. සොලොන්ගේ දුර්වල සහ විශ්වාසනීය වූ හැදියාව නිසා ඇතැන්ස් නගරය වහල්ක්‍රමයට කඩා වැටුණි. මෙය සමව පිළිගැනිම ආණ්ඩුවේ සම්පූර්ණ වූ විද්‍යාවයි."

ල පෙලෙටියෙර්: "මනුෂ්‍යයා පිරිහී ගිහින් ඇති සැටි බැලුවාම, මට විශ්වාසයි සම්පූර්ණයෙන්ම නැවත ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය යැයි කියා. ඉතින් මට කියන්නට ඉඩදෙන්නේ නම්, නව ජනතාවක් නිර්මාණය කළ යුතුයි කියන්නෙමි."

# සමාජවාදීන්ට අවශ්‍ය ඒකාධිපතියෙකි

ඔවුන් නැවත නැවතත් කියන්නේ මිනිසා යනු අමුද්‍රව්‍යයක් පමණක් බවයි. මිනිසා විසින් තම තම අභිප්‍රායයන් සොයා දියුණුව කරා යා යුතු නොවේ කියායි. මිනිසුන්ට එය කරත නොහැකි බවයි. සාන්ත-ජස්ට අනුව, මෙය කරන්නට සමත්වෙන්නා නීති සම්පාදකයා පමණි. පුද්ගලයා යනු, අභිප්‍රායයන් මොන ආකාරයෙන් තිබිය යුත්තන්දැයි කියා ව්‍යවස්ථාදායකය විසින් තීරණය වෙන අය පමණකි.

රූසෝව වචනානුසාරයෙන් කොපිකරන රොබෙස්පියෙර්ට අනුව, ව්‍යවස්ථාදයකයා පටන්ගන්නේ සමූහාණ්ඩුවේ පරමාර්ථය කුමක්විය යුතුදැයි යන අභිප්‍රායෙනි. සමූහාණ්ඩුවේ පරමාර්ථය කුමක්වීදැයි නිර්ණය කරගත් පසුව, ජාතියේ ශාරීරික හා මානසික බලය යෙදවිය යුත්තේ ඒ පරමාර්ථය සාක්ෂාත් කරගැනීම උදෙසාය. මේ අතරතුර ජාතියේ වැසියන් කිසිත් විරෝධයක් නොපා සිටිය යුතුය.

බිලෝඩ්-වැරෙන්ස් ඉගැන්වූ ආකාරයට ජනතාවට කිසිදු පක්ෂපාතීකමක් ගැනීමට නොහැකිය. ලැදියාවක් පෙන්විය නොහැකිය. ව්‍යවස්ථාදායකයා නිර්දේශ නොකරන ආශාවන් හැරෙන්නට වෙනත් ආශා වලට ඉඩක් නොමැත. ඔහු තව දුරටත් කියන්නේ ගැලවෙන්නට නොහැකි කර්කශ ලෙසින් ජීවත්වෙන එක මිනිසෙක් නිසා ජනරජයේ පදනම ගොඩනැඟෙන බවයි.

සාමාන්‍ය ආණ්ඩු ක්‍රියාපටිපාටියෙන් නිවාරණය කරත නොහැකි යැයි චෝදනා ලබා ඇති දුෂ්ටකම් කොතරම් දැවැන්තදැයි කියන මැබ්ලි, ඒවා ඉදිරියේ දී සද්ගුණය වෙනුවෙන් ඒකාධිපතිවාදය ගෙනෙන්නට අවශ්‍ය යැයි නිර්දේශ කරයි: “පිවිසෙන්න,” ඔහු කියයි, “කෙටි කලක් සඳහා පමණක්, සුවිශේෂී වූ බලතල ඇති විනිශ්චය සභා වලට. පුරවැසියන්ට සතියි හැකි අදහස්වලට දැඩි පහරක් දෙන්න ඕන.” මේ දහම අමතක වී නැත.

අහන්න රොබෙස්පියෙර්ගේ ප්‍රකාශය: “ජනරජ ආණ්ඩු ක්‍රමයක මූල ධර්මය සද්ගුණයයි. මේ සද්ගුණය ස්ථාපිතය සඳහා අපි යා යුතු මග

භීෂණයයි. අපේ රටේ අපි කැමැත්තේ ස්වාර්ථකාමය වෙනුවෙන් ආචාර ධර්ම; නම්බුව වෙනුවෙන් අවංකත්වය; චාරිත්‍ර වාරිත්‍ර වෙනුවෙන් මූල ධර්ම; ආචාරශීලීත්වය වෙනුවෙන් යුතුකම්; විලාසිතා පීඩනය වෙනුවෙන් විචාරයේ ආධිපත්‍යය; දරිද්‍රතාවයට ඇති පිළිකුල වෙනුවට දුසිරිතට ඇති පිළිකුල; අහංකාරකම වෙනුවට ආඩම්බරය; ගර්වය වෙනුවට ආත්මයේ ශ්‍රේෂ්ඨත්වය; මුදල් වලට ඇති ආදරය වෙනුවට කීර්තියට ඇති ආදරය; හොඳ හිත මිතුරන් වෙනුවට හොඳ ජනතාව; කුතුහලය වෙනුවට යෝග්‍යතාවය; හුරු බුහුටි ලෙසින් තැනට සුදුසු වූවක් කීමට හැකියාව වෙනුවට ප්‍රඥාව; බැබළෙන්නට හැකිවීම වෙනුවට සත්‍යය; සතුටින් පැත්තකට වී බලාසිටීම වෙනුවට සිත් ඇදගන්නා බවෙන් ඇතිවන සතුට; මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය වෙනුවට ශ්‍රේෂ්ඨත්වයේ කුඩා බවට; සතුටු ස්වභාවයෙන් ඉන්න නිස්සාර අවමන් ජනතාව වෙනුවට නිර්ලෝභී ශක්තිමත් සතුටු ජනතාව යනාදී වශයෙන් ආදේශ කරගන්නටය. කෙටියෙන් කිවහොත්, රාජාණ්ඩුවක ඇති සියලුම දුසිරිත් සහ හාස්‍යජනක වූ දේවල් වෙනුවට අපිට ඕනෑ ජනරජයේ ආශ්චර්යය හා සියලු සද්ගුණයන් ආදේශ කරගන්නටය.”

# ආඥාදායක වූ අහංකාරය

රොබෙස්පියෙර් තමාව තබාගෙන ඇත්තේ සෙසු මිනිස් සංහතිය වෙතින් ඈත් වූ කොතරම් අති ඉහළ මට්ටමකින්ද!

ඔහු කතා කරන අහංකාර ස්වරය දිහා සිත් යොමුකරන්න. මිනිස් ස්ප්‍රීතුවේ ශ්‍රේෂ්ඨ පිබිදීමක් වෙනුවෙන් යාඥා කිරීමෙන් පමණක් ඔහු සෑහීමකට පත් නොවෙයි. හොඳින් වැඩ කෙරෙන ආණ්ඩුවකින් වුවද එවැනි ප්‍රතිඵලයක් ඔහු බලාපොරොත්තු නොවෙයි. නැත, ඔහු, තමන් විසින්, මිනිස් සංහතිය නැවත හදනු ඇත. එයට භීෂණය යොදාගනු ඇත.

මේ පරස්පර ලෙසින් දක්වන පල් පව වගන්ති උපුටාගත්තේ රොබෙස්පියෙර් විසින් විප්ලවකාරී ආණ්ඩුවකට මාර්ගෝපදේශකයක් ලෙසින් පාවිච්චි කළ යුතු ආචාර ධාර්මික සිද්ධාන්ත විස්තර කරන ලද දේශනයකිනි. මේ රොබෙස්පියෙර් විසින් ආඥාදායකයෙක් යෝජනා

කරන අරමුණ වනාහී විදේශ ආක්‍රමණයක උවදුරු නිසා හෝ විරුද්ධ වූ කල්ලියක නැඟී ඒම නිසා නොවන බවට අවධානය යොමු කරන්න. ඔහුට අවශ්‍ය ඔහු විසින් ආචාර ධර්ම සිද්ධාන්ත යැයි සලකන ඔහුගේ අදහස් භීෂණයෙන් හෝ රටේ ක්‍රියාත්මක කරන්නට හැකි ආඥාදායක අවසරයයි. තව ව්‍යවස්ථාවකට පෙර කෙටි කාලීන වූ සැලසුමක් හැටියට ඔහු මෙය යෝජනා කරයි. එහෙත් යථාර්ථය නම් ප්‍රංශයේ ස්වාර්ථකාමය, නම්බුව, චාරිත්‍ර වාරිත්‍ර, ආචාරශීලීත්වය, විලාසිතා, ගර්වය, මුදලට ඇති ආදරය, හොඳ හිත මිතුරන්, කුතුහලය, හුරු බුහුටි තැනට සුදුසු වූවක් කීමට හැකියාව, සිත් ඇදගන්නා බවෙන් ඇති සතුට, දරිද්‍රතාවය යනාදී සියල්ලම මුලිනුපුටා දමන්නට අවසරය ඉල්ලා සිටීමයි. ඔහු, රොබෙස්පියෙර් නමින් සිටින්නා, මේ සියලු ආශ්චර්යයන් අත්පත් කරදුන්නාට පසු, ඔහු ඒවා හඳුන්වන්නේ නිවැරදි වූ සද්ගුණයන් සේ එයාකාරයෙනි, එවිට ඔහු නැවතත් නීතියට රජයන්නට අවසර දෙනු ඇත.

**මෙහි දී බැස්ටියාට් ලෝකයේ සිටින අනුන්ගේ යහපත වෙනුවෙන් පෙනී සිටින සියල්ලන්වම අමතයි.

ආහ්.. දොම්නසින් ඉන්නා සත්වයෙනි! ඉතා ශ්‍රේෂ්ඨ යැයි සිතාගෙන ඉන්නා ඔබ! මිනිස් සංහතිය ඉතා පහත් වූ ලෙසකින් සලකන ඔබ! ඇයි ඔබ තමන්වම ප්‍රතිසංස්කරණය කරගන්නේ නැත්තේ? ඒ වැයම පමණක් සෑහෙන්නට ප්‍රමාණවත්ය.

# පරම බලධාරී පාලකයා වන්නට ගන්නා අනියම් මාර්ගය

සාමාන්‍යයෙන්, මේ මහත්වරුන් -ප්‍රතිසංස්කරණවාදීන්, නීති සම්පාදකයන්, මහජන කටයුතු ගැන ලියන රචකයන්- මිනිස් සංහතියේ පරම සර්වබලධාරී පාලකයා වන්නට සෘජු මාර්ග වලින් යන්නට කැමැත්තක් නැත. අපොයි නැහැ, එවැනි සෘජු මාර්ගයකට පිවිසෙනවාට වඩා ඔවුන් මැද පිළිවෙත අනුගමනය කරන, පුණ්‍ය කටයුතු අගයන අයයි. ඉතින් ඔවුන් පරම වූ, සර්වබලධාරී වූ,

ආඥාදායක පාලකයා වීම සඳහා හැරෙන්නේ නීතිය වෙතටයි. ඔවුන්ට රිසි වනුයේ නීති හදන්නට පමණි.

ප්‍රංශයේ මේ අරුම අදහස කොතරම් පැතිර ඇත්තේදැයි පෙන්වන්නට, මට මැබ්ලි, රෙනාල්, රූසෝ සහ ෆෙනලන්ගේ සම්පූර්ණ කෘති කොපි කරන්නට වෙනවා පමණක් නොව ඒ අතරට බූසොට් සහ මොන්ටෙස්ක්‍යූ යනාදීන්ගේ ලියැවිලි වලින් කරුණු උපුටන්නට ද, සමුළුවේ සම්පූර්ණ පටිපාටිකරය උපුටා දක්වන්නට ද සිද්ධ වෙන්නේය. මම එසේ නොකරමි. පාඨකයාව ඒ වෙත යොමු කිරීම පමණක් කරමි.

## නැපෝලියන්ට අවශ්‍ය වූයේද අකර්මණ්‍ය මිනිස් සංහතියකි

ඉතින්, එය පුදුමයක් නොවේ. මේ අදහස එලෙසින්ම නැපෝලියන්ගේ සිත් ඇදගත්තක් වීම. ඔහු එය උත්සුක ලෙසින් බදාගෙන ඕජසින් යුතුව පාවිච්චියට ගත්තේය. රසඥයෙක් මෙන් නැපෝලියන් ද කල්පනා කර බැලුවේ මුළු මහත් යුරෝපයම තම අත්හදා බැලීමට සුදුසු වූ අමුද්‍රව්‍යයක් ලෙසිනි. එහෙත් කාලයාගේ ඇවෑමෙන් මේ අමුද්‍රව්‍ය ඔහුට එරෙහි ලෙසින් ප්‍රතික්‍රියා කරන ලදි.

සාන්ත හෙලේනා හි දී නැපෝලියන් මෙය තම සිතේ පවත්නා දැඩි සි මුලාවක් යැයි පසක් කරගෙන මිනිස් සංහතියේ යම් අභිලාෂ ඇතැයි හඳුනාගත් බව පෙනේ. මේ වැටහීම නිසා ඔහු නිදහසට සතුරුවීම මඳක් අඩු කළේය. එසේ වුවත්, මේ පාඩම තම අන්තිම කැමති පත්‍රයෙන් තම පුතුට ලියා තබා යන්නට ඔහු අමතක නොකළේය: “ආණ්ඩු කරනවා කියන්නේ සද්ගුණය, අධ්‍යාපනය, සහ සතුට වැඩිකර හැම අත පතුරුවාලීමය.”

මේ සියල්ලෙන්ම අනතුරුව, ඉතින් මේ අදහස්ම යළි මොරෙලි, බැබෆ්, ඔවන්, සාන්ත-සයිමන්, සහ ෆුරියර් වෙතින් උපුටා දැක්වීම අනවශ්‍ය වූවකි. එහෙත් මෙන්න ලුවි බ්ලාන් ගේ පොතකින් ශ්‍රමය සංවිධානය

පිළිබඳව අදහසක්: "අපේ සැලැස්ම අනුව සමාජයක් ඊට අවශ්‍ය තල්ලුව ලබන්නේ බලය පාවිච්චියෙන්."

ඉතින් මේ ගැන කල්පනා කරන්න: මේ තල්ලුවට පිටුපසින් ඇති වේගය සපයන්නේ ලුවි බ්ලාන් හදන සැලැස්මෙන්. එනම් බලහත්කාරයෙන් සමාජයට ගෙනෙන්නේ ඔහුගේ සැලැස්මයි. සමාජය යැයි ඔහු පෙන්වන්නේ මිනිස් සහනුහරයයි. ඉතින් මිනිස් සනුහරය එහි වේගය ලබාගන්නේ ලුවිස් බ්ලාන් වෙතින්.

මිනිසුන්ට ලුවි බ්ලාන්ගේ සැලැස්ම පිළිගන්නට හෝ ප්‍රතික්ෂේපයට අවසර ඇතැයි කියා ඉතින් එහි දී කියනු ඇත. තමන් රිසි පරදි ඕනෑම අයෙකුගේ සැලැස්මක් පිළිගන්නට හෝ ප්‍රතික්ෂේප කරන්නට මිනිසුන් නිදහස් වෙති. ඒත් ඒ විදියට නෙමෙයි ලුවි බ්ලාන් මහතා මේ කාරණය වටහාගෙන තියෙන්නේ. ඔහු අපේක්ෂා කරන්නේ ඔහුගේ සැලැස්ම නීතිගත වේයැයි කියාය. ඒ අනුව නීතියේ බලය පාවිච්චියෙන් මෙය බලහත්කාරයෙන් ජනතාව වෙත නියම වෙනු ඇත.

"අපේ සැලැස්ම අනුව, රජයට ඇත්තේ ශ්‍රමය ගැන නීති (වෙන නීති නැත්ද?) සම්මත කිරීම පමණි. එමඟින් සම්පූර්ණ නිදහස තුල කාර්මික දියුණුව ඉදිරි ගමන් යනු ඇත. ආණ්ඩුවක් කරන්නේ සමාජයක් කන්දක් ඉදිරියට ගෙන යෑම පමණයි. (එය පමණයි ද?) අනතුරුව දැනට පිහිටුවන ලද ප්‍රතිපත්ති අනුව වැඩ කළහොත් ස්වභාවයෙන්ම සිද්ධවෙන ක්‍රියාවලියක බලයෙන් සමාජය මේ කන්දෙන් පහලට ඇද හැලෙනු ඇත."

ලුවි බ්ලාන් විසින් ඉඟිකරන මේ කන්ද යනු කුමක්ද? ඒ කන්ද උඩටම ගිහින් අනතුරුව අගාධයකට වැටෙන්නක් ද? (නැහැ එය සතුට කරා යන්නක්). ඒත් මෙහෙම නම්, ඇයි ජනතාවට තමන්ට තෝරා ගන්නට බලයක් දෙන්නේ නැත්තේ? (සමාජය දන්නෙ නැහැ කුමක් සොයා යා යුතුදැයි කියා; ඒ නිසා තල්ලුවක් අවශ්‍යයයි.) කුමක් විසින් ද තල්ලුව දෙන්නේ? (බලයෙන්.) මේ බලය සපයන්නේ කවුද? (ඇයි, ඒ මැෂිමේ නවෝත්පාදකයා මිස වෙන කවුද -මෙහි දී එයා තමයි ලුවි බ්ලාන්.)

**වරහන් ඇතුලත ඇත්තෙ බැස්ටියාට්ගේ සටහන්.

# සමාජයේ විෂම චක්‍රය

අපි මේ විෂම චක්‍රයෙන් කවරදාක වත් ගැලවෙන්නේ නැත: අකර්මණ්‍ය මිනිසා නම් වූ අදහස සහ ශ්‍රේෂ්ඨ මිනිසෙකු විසින් නීතියේ ඇති බලය යොදාගෙන ජනතාව තල්ලු කරගෙන යෑම.

ඉතින් මේ කන්ද නඟිද්දී, සමාජය යම් නිදහසක් භුක්ති විඳිනවා ද? (සහතිකයෙන්ම.) ඉතින් කියන්න කුමක් ද මේ නිදහස, ලුවි බ්ලාන්?

අන්තිම වතාවට නැවතත් කියන්නම්, නිදහස යනු අයෙකුට ලබාදෙන අයිතියක් පමණක් නොවෙයි; නීතියෙන් ලැබෙන ආරක්ෂාව යටතේ තම ඉන්ද්‍රියයන් තමාට රිසි සේ පාවිච්චියටත් වර්ධනයටත් හැකියාව යනු නිදහසයි.

මෙය කිසිත් වැදගැම්මකට නැති පැහැදිලි කිරීමක් නොවේ. එහි අර්ථය ගැඹුරුයි. එහි ඵලවිපාක නීර්ණය කිරීම අපහසුයි. එහෙත් හැමෝම එකඟවී ඇත්තේ සත්‍යයෙන්ම නිදහස් වූ පුද්ගලයෙක් වන්නට නම් පුද්ගලයාට තම ඉන්ද්‍රීයයන් පාවිච්චියටත් වර්ධනයටත් තමනට රිසි සේ හැකියාව තිබීම නිදහස යැයි කියාය. එයින් කියැවෙන්නේ ස්වයං වර්ධනය සඳහා අධ්‍යාපනයක් ලබා දීම සමාජයෙන් අපේක්ෂා කරන්නට සෑම මිනිසෙක්ටම අයිතියක් ඇතැයි කියාය. එතැනින්ම කියැවෙන්නේ ද, සෑම පුද්ගලයෙක්ටම නිෂ්පාදන උපකරණ ලබාදීම සමාජයෙන් අපේක්ෂා කරන්නට සෑම මිනිසෙක්ටම අයිතියක් ඇතැයි කියාය. මන්ද මේවා නැතිව මිනිස් ක්‍රියාකාරකම් වලින් සම්පූර්ණයෙන් ඵලදාවක් ලැබිය නොහැකියි.

ඉතින් මේවා ලබා දීම රජයේ පියවර නොවන්නේ නම් වෙන කුමන ක්‍රියාමාර්ග වලින් ද සමාජයක සෑම මිනිසෙකුටම අත්‍යාවශ්‍ය වූ අධ්‍යාපනය සහ නිෂ්පාදන උපකරණ ලබාදිය හැකියාව ඇත්තේ?

නැවතත්, නිදහස යනු බලයයි. මේ බලයේ අඩංගු දෑ මොනවාද? (අධ්‍යාපනය ලබාගත හැකියාව සහ නිෂ්පාදන උපකරණ ලබාගත හැකියාව.) කවුද මේ අධ්‍යාපනය සහ නිෂ්පාදන උපකරණ දිය

යුත්තේ? (එය හැමෝටම ලබාදිය යුත්තේ සමාජයයි.) මොන ක්‍රියාවකින් ද සමාජය මේ අධ්‍යාපනය නැති වූවන්නට සහ නිෂ්පාදන උපකරණ නැති වූවන්ට එය ලබාදෙන්නේ? (ඇයි, රජයේ ක්‍රියාමාර්ගයකින්.) ඉතින් එහෙනම් කාගෙන් ද රජය මේවා ගන්නේ?

පාඨකයාට ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න යැයි කියමු. එය අපිව කොතැනට කැඳවාගෙන යනවාදැයි එවිට සොයා බලමු.

# ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ධර්මය

උපන්‍යාස තුනක් මත ගොඩනැඟෙන මේ ධර්මය අපේ මුනුපුරු පරම්පරාව සමහර විට පුදුමයට පත්කරන අපේ යුගයේ විද්‍යාමාන වන අපූරු ප්‍රපංචයකි: මිනිස් සංහතියේ සම්පූර්ණ අකර්මන්‍යභාවය, නීතියේ සර්වබලධාරීත්වය, සහ කිසිවිටෙක නොවැරදෙන සේ කටයුතු කරන්නට දන්නා ව්‍යවස්ථාදායකයා. මේ අදහස් තුනෙන් නිමැවෙන්නේ තමන් ප්‍රජාතන්ත්‍රවාදී යැයි කියාගන්නා අයගේ පූජනීය සංකේතයකි.

මේ අදහස් වෙනුවෙන් පෙනී සිටින අය සමාජශීලීත්වයට කැමති යැයි කියන අය ද වෙති. ප්‍රජාතන්ත්‍රවාදී වෙන තරමට ඔවුන් මිනිස් සංහතිය ගැන සීමාරහිත විශ්වාසයක් තබා ඇත. සමාජශීලී වෙන තරමට ඔවුන් මිනිස් සංහතිය යනු මඩ වලට වඩා වැඩියෙන් හොඳ සේ සලකති. ඉතින් මේ වෙනස ගැන තව දුරටත් විභාග කරමු.

දේශපාලන අයිති ගැන කතා කරද්දී මේ ප්‍රජාතන්ත්‍රවාදියාගේ ගති ස්වභාවය කුමක්ද? ව්‍යවස්ථාදායකයෙක් තෝරා ගැනීම ගැන කතාබහේ දී ඔහු ජනතාව සලකන්නේ කුමන ආකාරයකට ද? ආහ්, අන්න එතැන දී ජනතාවට සහජ බුද්ධියක් ඇතැයි කියයි; ඔවුන් සුවිශේෂී වූ විනිවිද දකින නුවණකින් යුතු යැයි කියයි; ඔවුන්ගේ අභිප්‍රායයන් නිතරම නිවැරදි යයි කියයි; සාමාන්‍ය අභිප්‍රාය වරද විය නොහැකි යැයි කියයි; චන්ද අයිතියේ සර්වබලධාරී ස්වභාවය පුළුල් වැඩි යැයි කියත නොහැකි බව කියයි.

ඉතින් චන්දය ප්‍රකාශ කරන කාලය පැමිණියාම, චන්දය අයිතිකරුවාට තමනට බුද්ධියක් ඇතැයි සහතික කර පෙන්වන්නට කියා ඉල්ලන්නේ නැත. බුද්ධිමත් ලෙසින් තෝරාගැනීමට ඔහුට ඇති අභිප්‍රාය සහ හැකියාව විමසීමකින් තොරව බාරගෙන ඇත. ජනතාවට වැරදීමක් සිද්ධ වෙන්න පුළුවන්ද? ඇයි අපි ජීවත්වෙන්නේ බුද්ධිමය විචාරයේ යුගයක නොවේද? කුමක් කිව්වා! ජනතාව දම්වැල් දමා බැඳලා තියන්න ඕනෑ කියල හැම තිස්සෙම? ඔවුන් සිය අයිතීන්, කැපවීම් හා මහත් උත්සාහයෙන් දිනාගෙන නැත්ද? ඔවුන්ගේ බුද්ධිය සහ ප්‍රඥාව ගැන ඇති පදම් සාක්කි පෙන්වා නැතිද? ඔවුන් වෙනුවෙන් තීන්දුවක් දෙන්නට ඔවුන් සමත් නැතිද? ඔවුන් වැඩිහිටියන් නොවේද? තමන්ට හොඳ මොනවාදැයි ඔවුන් දන්නේ නැතිද? මිනිසුන්ට වඩා ඉහළකින් තමන්ව තබාගෙන ඔවුන් වෙනුවෙන් විනිශ්චයකරුවෙක් සහ තීරණ ගන්නා අයෙක් ලෙසින් කටයුතු කරන්නට යම් මිනිසෙක් හෝ යම් පංතියක් බිය සැක නැතිවේවිද? නැහැ, නැහැ, ජනතාව නිදහස්. ඔවුන් නිදහස් විය යුතුමයි. ඔවුන් කැමති ඔවුන්ගේ කටයුතු ඔවුන් විසින් කරගෙන යන්නටයි. ඒක ඔවුන් කරගෙන යාවි.

ඒත් අනතුරුව ව්‍යවස්ථාදායකයාව තෝරා පත්කර ගැනුනු පසුව? ආහ්! අන්න එවිටයි ඔහුගේ ස්වරය රැඩිකල් විපර්යාසයකට පත්වෙන්නේ. ජනතාව නැවතත් අකර්මණ්‍ය, කරකියාගත නොහැකි, සිහි බුද්ධියෙන් නොයුතු වූවන් යැයි සැලකෙන මට්ටමට පත්වෙනු ඇත. ව්‍යවස්ථාදායකයා සර්වබලධාරියා වෙයි. දැන් ඔහුට බාරයි මුලපුරන්නට, මඟපෙන්වන්නට, තල්ලු කරන්නට, සංවිධානයට. මිනිස් සංහතියට කරන්න ඇත්තේ යටත්වීම පමණයි. පරම බලධාරීත්වයේ පැය උදාවී ඇත. අපි දැන් මේ මාරක අදහස නිරීක්ෂණය කරමු. චන්ද කාලයේ දී හරිම ආචාර ධාර්මිකයි. හරිම සම්පූර්ණයි, හරිම බුද්ධිමයත් යැයි සැලකිල්ලට පාත්‍ර වූ ජනතාවට දැන් කිසිම අභිප්‍රායක් නැත. එහෙම නැත්නම් ඔවුනට යම් අභිප්‍රායක් ඇත්නම් එය ඔවුන්ව අගතියට අවමානයට ඇදගෙන යන්නා වූ අභිප්‍රායයකි.

# නිදහස යන්නේ සමාජවාදී සංකල්පය

ඒත් ඉතින් ජනතාවට ටිකක් හෝ නිදහසක් දිය යුතු නොවේද?

ඒත් කන්සිඩරන්ට් මහතා විසින් අපිට සහතික වූයේ නිදහස අනිවාර්යෙන්ම මොනොපොලිය කරා යාවි කියායි!

අපිට වැටහෙන්නෙ නිදහස යනු තරඟය කියායි. ඒත් ලුවි බ්ලාන් මහතාට අනුව, තරඟය කියන්නෙ ව්‍යාපාරිකයන් බංකොළොත් කරන සහ ජනතාව වඳ කරන සැලසුම් පද්ධතියක්. ඒ හේතුව නිසා තමයි නිදහස් ජනතාව තමනට ඇති නිදහසේ ප්‍රමාණය අනුව බංකොළොත්භාවයට ගිහින් වඳවෙලා යන්නෙ. (සමහර විට ලුවි බ්ලාන් මහතා තරඟයේ උදාහරණ හැටියට ස්විට්සර්ලන්තය, ඕලන්දය, එංගලන්තය සහ එක්සත් ජනපදය යනාදිය නිරීක්ෂණය කර බැලිය යුතුයි.)

තරඟය යන්නේ මොනොපොලියක් වෙත යැයි ලුවි බ්ලාන් මහතා අපිට තව දුරටත් කියයි. ඒ තර්කයෙන්ම ඔහු අපිට කියා සිටින්නේ අඩු මිල නිසා මිල ඉහළ යනවා කියාය; තරඟය විසින් නිෂ්පාදනය විනාශකාරී ක්‍රියාවන්ට යොමුකරනවා කියාය; තරඟය නිසා මිල දී ගත හැකියාව ඇති මූලාශ්‍ර හිඳී යනවා කියාය; තරඟය නිසා නිෂ්පාදන වැඩිවෙන අතර එයින්ම පරිභෝජනය ද අඩුකරනවා කියාය. මෙයින් කියැවෙන්නේ, නිදහස් ජනතාව නිෂ්පාදනය කළ යුත්තේ පරිභෝජනයට නොවේය යන්නයි. නිදහස යනු පීඩිත බව යන්නයි. නිදහස යනු ජනතාව අතර පවතින උන්මාදයක් යන්නයි. ඒ නිසා වහාම ලුවි බ්ලාන් මහතා මැදිහත්විය යුතුය කියායි.

# සමාජවාදීන් සෑම නිදහසකටම බිය වෙති

ඉතින්, ව්‍යවස්ථාදායකයා විසින් ජනතාවට තියාගන්නට ඉඩක් දෙන්නේ මොන නිදහස ද? හෘදය සාක්ෂියට ඇති නිදහස? (ඒත් මේකට නිදහස දුන්නොත් අපිට දකින්න පුළුවන් මිනිස්සු ඔක්කොම ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන අදේවවාදීන් වෙයි කියායි.)

එහෙනම්, අධ්‍යාපනයට නිදහස? (ඒත් එතකොට තම දරුවන්ට දුසිරිත සහ බොරු උගන්වන්නට දෙමව්පියන් ආචාර්යවරුන්ට මුදල් ගෙවයි;

අනික, තියෙර්ස් මහතාට අනුව, ජාතික නිදහස් අධ්‍යාපනයට ඉඩ දුන්නොත් එය තව දුරටත් ජාතික නොවේවි. අපි අපේ දරුවන්ට එතකොට තුර්කි සහ හින්දු අයගේ අදහස් කියා දේවි. මොකද දැන් අධ්‍යාපනයට තියෙන නීතිමය පරම සර්වබලධාරීත්වයට ස්තූති වෙන්නට අපිට හොඳ වාසනාව උදාවෙලා තියෙනවා දරුවන්ට රෝමානුවන්ගේ උතුම් අදහස් කියාදෙන්නට.)

එහෙනම්, ශ්‍රමයට නිදහස? (ඒත් ඒකෙන් ඇතිවෙන්නෙ තරඟයයි. එයින් යන්නෙ පරිභෝජනය නොකරන ලද නිෂ්පාදනයට. බංකොළොත් ව්‍යාපාරිකයන් බිහිවීමට. වඳවී යන ජනතාවට.)

සමහර විට, වෙළඳාමට නිදහස? (ඒත් හැමෝම දන්නවා වෙළඳාමට නිදහසක් දුන්නොත් එහි නියැළෙන හැම අයෙක්ම බංකොළොත් වෙන බව. මේක ආරක්ෂිත තීරු බදු වෙනුවෙන් පෙනී සිටින අය නැවත නැවතත් කොයි තරම් වතාවක් ඔප්පු කර ඇත්ද? ඉතින් වෙළඳාමට ඇති නිදහස යටපත් කරන්න අවශ්‍යයයි සෞභාග්‍ය උදාකරගන්නට නම්.

එහෙනම්, සබඳතාවයන් පවත්වන්නට නිදහස ලබාගන්නට හැකිද? (ඒත් සමාජවාදී දහමට අනුව, සත්‍ය නිදහස සහ ස්වේච්ඡාවෙන් පවත්වන සබඳතා යනු එකිනෙකට පරස්පර විරෝධී වූවන්. ඉතින් සමාජවාදීන්ගේ අරමුණ තමයි සබඳතා වලට ඇති නිදහස යටපත් කර බලහත්කාරයෙන් ජනතාවට සබඳතා පවත්වන්න අණ දී සත්‍ය නිදහස ගෙන ඒම.)

පැහැදිලිව එහෙනම්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට හෘදය සාක්ෂියට එකඟවෙලා ජනතාවට කිසිම නිදහසක් දෙන්න නොහැකියි. මන්ද, ඔවුන් විශ්වාස කරනුයේ මිනිස් සංහතියේ ස්වභාවය යනු සෑම විටෙකම අගතිය සහ විනාශය කරා යන හැදියවක් යනුවෙනි. ඉතින් ඔවුන්ව ඔවුන් වෙතින්ම බේරාගැනීම පිණිස අනිවාර්යෙන්ම නීති සම්පාදකයන් ජනතාව වෙනුවෙන් සැලසුම් හැදීම අවශ්‍යයයි.

මේ ආකාරයෙන් කරන විචාරය අපිව ගෙන එන්නේ මේ අභියෝගාත්මක ප්‍රශ්නයටයි: ඉතින් ජනතාව කරකියා ගන්නට

අපොහොසත් වූ අය නම්, ඔවුන් දුසිරිත් වලින් යුතු අය නම්, දේශපාලනඥයන් පෙන්වන තරමට නූගත් වූවන් නම්, එහෙනම් ඇයි මේ අයගේ චන්ද අයිතිය ඔය තරම් දැඩිසේ තහවුරු කරමින් ආරක්ෂා කර දෙන්නේ?

# සුපිරි මිනිසා අදහස

මේ මිනිස් සනුහරය සංවිධානය කරන අයගේ සුදුසුකම් ගැන මම නිතර තවත් ප්‍රශ්නයක් නඟා ඇත. එයට මා දන්නා තරමින් තවමත් කිසිවෙක් උත්තර නම් දී නැත.

මිනිස් සනුහරයේ ස්වභාවික අභිප්‍රායයන් ඔය තරම් නරක වේ නම්, ඒ නිසා මිනිසාට නිදහසේ කටයුතු කරන්නට ඉඩ දීම නිසා ආරක්ෂාව නැති වී යන්නේ නම්, එහෙනම් කොහොමද මේ සංවිධාකයන්ගේ අභිප්‍රායයන් හැම විටම හොඳ වෙන්නේ?

ව්‍යවස්ථාදායකයන් ද, ඔවුන් විසින් පත්කරගන්නා ඒජන්තවරුන් ද, මිනිස් සනුහරයට අයිති වූවන් නොවන්නේ ද?

එහෙම නැත්නම්, ඔවුන් හිතන්නේ මිනිස් සංහතිය හැදූ මැටි වලට වඩා අනගි මැටියෙන් ඔවුන් නිමැවී ඇත්දැයි කියාද?

සංවිධායකයන් කියා සිටින්නේ, මාර්ගය කියා නොදුන්නොත්, ජනතාවගේ සහජ ආශයන් අගතියෙන් පිරී ඇති නිසා සමාජයක් එහි වැළැක්විය නොහැකි විනාශය කරා යනවා කියායි. ව්‍යවස්ථාදායකයන් කියන්නේ මේ සියදිවිනසා ගන්නා මාර්ගයේ යෑම නවතා ජනතාවට ඊට වඩා යුක්ති සහගත වූ මාර්ගයක් ඔවුන් හදා දෙනවා කියාය. ඉතින් එහෙම නම්, ව්‍යවස්ථාදායකයන්ට සහ සංවිධායකයන්ට සෙසු මිනිස් සංහතියට වඩා වැඩි ඉහළ තැනක ඉන්නට දිව්‍යලෝකයෙන් බුද්ධියක් සහ සද්ගුණයක් ලැබී තිබෙනවා වෙන්නට පුළුවන; එහෙම නම්, මේ සුපිරි තත්වය කුමක්දැයි දැනගන්නට අපිට එහි නම කුමක්දැයි කියන්න.

අපි එවිට බැටළුවන් වෙති. ව්‍යවස්ථාදායකයන් අපිව බලාගන්නා එඬේරන් වෙති. එවැනි සැලැස්මකින් කියැවෙන්නේ ඔවුන් ස්වභාවයෙන්ම අපිට වඩා සුපිරි වූවන් කියාය. ඉතින් එහෙම නම් අපිට ව්‍යවස්ථාදායකයන් සහ සංවිධායකයන් වෙතින් ඉල්ලා සිටිය හැකියි ඔවුනට පමණක් මේ ස්වභාවයෙන් ලැබුණු සුපිරි තත්වය කුමක්දැයි පැහැදිලි කර පෙන්විය යුතුයි කියා.

# සමාජවාදීන් නිදහස් තෝරාගැනීම් ප්‍රතික්ෂේප කරයි

සමාජ සංකරණ නවෝත්පාදනයට, ඒවාට දැන්වීම් දාන්නට, ඒවා වෙනුවෙන් පෙනී සිටින්නට, ඒවා තමන් වෙනුවෙන් අත්හදා බලන්නට, ඔවුන්ගේ වියදමෙන් හා ඔවුන්ගේ අවදානමෙන්, ඔවුනට ඇති අයිතිය නැතැයි කියා මා වාද නොකරන බව කරුණාකර වටහා ගන්න. ඒත් මම විරෝධය පාන්නේ නීතිය -සහ බලය පාවිච්චියෙන්- ඒ සැලසුම් අප වෙත නියම කරන්නට එන විටයි. ඒවාට අපේ බදු වලින් ගෙවන්නට යැයි කියන විටයි.

පෘඨොනිස්ට්, කැබෙටිස්ට්, ෆූරියෙරිස්ට්, යුනිවසිටාරිස්ට්, ප්‍රොටෙක්ෂනිස්ට් යනාදී මේ අයගේ සහාකයන් ඒ අනේක වූ අදහස් අත්හරින්නට උවමනා යැයි කියා මම ඉල්ලා සිටින්නේ නැත. මා ඉල්ලා සිටින්නේ ඔවුන් තුලින් දැකිය හැකි මේ පොදු වූ අදහස පමණක් අත්හරින්නට කියාය: ඔවුන් අත්හැරිය යුත්තේ අපිව ඔවුන්ගේ කණ්ඩායටම බලහත්කාරයෙන් බඳවාගන්නට තියෙන අදහසයි. ඔවුන්ගේ සමාජවාදී ව්‍යාපෘතිවලට අපිව ඈඳා ගැනීමයි. ඔවුන්ගේ ණය-පොලී නොමැති බැංකු, ග්‍රීක-රෝම සදාචාර සංකල්ප, ඔවුන්ගේ වෙළඳ රෙගුලාසි. මම ඉල්ලා සිටින්නේ අපි වෙනුවෙන් මේ සැලසුම් හදන තීරණ ගන්නට ඔවුනට ඉඩදෙන්න කියාය. ඒවා අනුගමනය කරන්න යැයි සෘජුව හෝ අනියම් ලෙසකින් අපට බලහත්කාරයෙන් නියම කරන්න එපා කියායි. ඒවා අපේ හෘදය සාක්ෂිය අනුව අපේ යහපත පිණිස වේ ද නොවේද යන්න තීරණයට අවසරය අපිට දෙන්න.

ඒත් මේ සංවිධාන කැමැත්තේ බදු අරමුදලට අත පොවන්නටයි. ඒ සැලසුම් ක්‍රියාත්මක කරන්නට අවසර දෙන නීතියේ බලය අල්ලා ගන්නටයි. පීඩක සහ අයුක්ති සහගත බවට අමතරව මේ කැමැත්ත පෙන්වන්නේ සංවිධායකයා ද වැරදෙන ගතියෙන් වූවෙක් සහ මිනිස් සංහතිය කරකියා ගන්නට නොහැකි වූවන් යන නියතයයි. ඉතින් එහෙම නම්, මිනිසුන්ට තමන් වෙනුවෙන් හොඳ නරක තෝරාගන්නට හැකියාවක් නැත්නම්, ඇයි අපි මේ සර්වජන චන්දයක් ගැන කතා කරන්නේ?

# ප්‍රංශ විප්ලව වලට හේතුව

ප්‍රංශයේ වූ සිදුවීම් දිහා බලද්දී තර්කානුකූල වූවත් අවාසනාවන්ත ලෙසින් පෙනී යන්නේ මේ අදහස්වල ඇති පරස්පර විරෝධතාවයන්ය. උදාහරණයක් ලෙස, ප්‍රංශ ජනතාව මුල් තැන ගෙන මුළු මහත් යුරෝපයම ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් වදින්නට ගෙන ගියහ. එහෙත් එය අපිව වඩාත්ම ආණ්ඩු වෙත, වඩාත්ම රෙගුලාසි වලට යටත් වූ, වඩාත්ම පීඩනයකින් සිටින, වඩාත්ම බැඳ තබා ලද්දා වූ, වඩාත්ම සූරාකෑමට ලක්වූ යුරෝපීය ජනතාවට බවට පත්වීමෙන් ගලවාගෙන නැත. නිතරම විප්ලවයක් ඇතිවේ යැයි කියත හැකි රටක් ලෙසින් ප්‍රංශය අනිත් රටවල් සියල්ලන්ටම ඉදිරියෙන් සිටියි. මේ තත්වය යටතේ එය එසේ වීම ස්වභාවිකය.

"සමාජයක් එහි තල්ලුව ලබන්නේ බලයෙන්" යැයි ඉතා පැහැදිලිව ලුවි බ්ලාන් මහතා කියූ අදහස අපේ දේශපාලනඥයන් පිළිගන්නා වූවක් හැටියට පවතින තාක් කල් ඉහත තත්වය ප්‍රංශයේ වෙනස් නොවී මෙසේම පවතිනු ඇත. හැඟීම් ඇති මිනිසුන් අකර්මණ්‍ය ලෙසින් කල්ගෙවනා තාක් කාලයක් එය එසේම පවතිනු ඇත. සිය බුද්ධියෙන් සහ සිය උනන්දුවෙන් තම අභිවෘද්ධිය සහ සතුට සලසාගන්නට නොහැකි යැයි මිනිසුන් සිතන තාක් කල් එය එසේම පවතිනු ඇත. සියලු දැයක්ම නීතිය විසින් කරදෙන තෙක් බලා සිටින තාක් කල් එය එසේම පවතිනු ඇත. කෙටියෙන් කිවහොත්, ඔවුන් සහ ආණ්ඩුව අතර

ඇති සම්බන්ධය බැටළු රැලක් සහ එඬේරෙක් අතර ඇති සම්බන්ධය වැනි යැයි සිතන තාක් කාලයක් එය එසේම පවතිනු ඇත.

# ආණ්ඩුවේ අසීමාන්තික බලය

මේ අදහස් පවතින තාක් කල්, ආණ්ඩුවේ වගකීම් ඉතා දැවැන්ත බව පැහැදිලිය. වාසනාව හා අවාසනාව, වස්තුව හා හිඟනකම, සමාන හා අසමානතාවය, සද්ගුණය හා දුසිරිත, යනාදී සියල්ලම දේශපාලන පරිපාලනය මත රඳා පවතින්නකි. ආණ්ඩුව මත සියලු බර පැටවී ඇත. එය සියල්ල ඉටුකරන්නට බාරගෙනය. එය සියල්ල කරමින් සිටියි. ඒ නිසා එය සියල්ලට වගකිව යුතුය.

අපි වාසනාවන්ත වූයේ නම්, එහෙනම් අපේ ස්තූතියට අයිතියක් කියන්නට ආණ්ඩුවට ඉඩ ලැබේ. ඒත් අපි අවාසනාවන්ත වූයේ නම්, එහෙනම් එවිට අපිට ආණ්ඩුවට අවලාද කිය හැකිය. සියලු මිනිසුන් හා සියලු දේපල පිළිබඳව දැන් ආණ්ඩුවේ හිතුමතය යටතේ කටයුතු කෙරෙන්නට ඉඩ දී නැතිද? නීතිය දැන් සර්වබලධාරී නොවේද?

අධ්‍යාපනයට මොනොපොලියක් නිර්මාණය කරන ලදින්, නිදහස නොමැතිවී ගිය පවුල්වල පියවරුන්ට ආණ්ඩුව විසින් වගකිව යුතුය. ඔවුන්ගේ අභිප්‍රායයන් බිඳී ගියේ නම් එය වෙන කාගේ වැරැද්දක්ද?

කර්මාන්තවලට රෙගුලාසි පැනවීමෙන් ආණ්ඩුව කීවේ ඒවා සමෘද්ධිමත් වෙනවා කියාය. එසේ නොවන්නේ නම් කර්මාන්තවලට ඔවුන්ගේ නිදහස නැතිකර දැමීම විහිළුවක් වෙයි. ඉතින් කර්මාන්ත දැන් පිරිහී ඇත්නම් එය වෙන කාගේ වරදක්ද?

තීරු බදු සමඟ සෙල්ලම් කළ නිසා වෙළඳාමේ අඩුපාඩු නැතිවේ යැයි කියූ ආණ්ඩුව ඒවායෙන් සමෘද්ධිය නොව විනාශය දකින්නේ නම්, එය වෙන කාගේ වරදක්ද?

කර්මාන්තවලට නිදහස නොදී ඒවාට ආරක්ෂාව දීම නිසා ආණ්ඩුව කීවේ ඒවා ලාබ උපයනවා කියාය. ඒවා බදු ගෙවන ජනතාවට බරක්වී ඇත්නම්, එය වෙන කාගේ වරදක්ද?

ඉතින් මෙහෙම බලද්දී, ආණ්ඩුව ස්වේච්ඡාවෙන්ම වගකීම් බාරගත් බැවින් ආණ්ඩුව සෘජුව වගකිව යුතු වූ පැමිණිලි හැරෙන්නට රටේ වෙනත් කිසිම පැමිණිල්ලක් නැත. ඉතින් පුදුමයක් ද එහෙනම්, හැම අසාර්ථක වූ වෑයමක්ම දැන් ප්‍රංශයේ තවත් විප්ලවයක් කැඳවන අවදානමක් ගෙනෙනවා යැයි කීම.

ඉතින් මෙයට යෝජනා කරන පිළියම කුමක්ද? නීතියේ රාජ විෂය අසීමාන්තික ලෙසින් ප්‍රසරණය කිරීමද? ඒත් එය ද රජයේ වගකීම වෙයි.

ආණ්ඩුව වේතන පාලනය සහ ඉහළ දැමීම බාරගෙන එය කරගත නොහැකි විට දී, දුප්පත් සියල්ලන්වම බලා කියාගත නොහැකි විට දී, රැකියා නැති සියලු අයට රැකියා දෙන්නට නොහැකි විට දී, සියලු ණයගත්තවුන්ට පොලී නැති ණය දීගත නොහැකි විට දී, අපිට කියන්නට කණගාටු සිතෙන මෙවැනි වදන් ද ලැමාටින් මහතාගේ පෑනෙන් ගිලිහී ගියේය: "සියලු වැසියන්ගේ ස්ප්‍රීතුව පූජනීය කර, ආගමික සෙනෙහස වඩවා, ශක්තිමත් කර, විසල් කර, වර්ධනය කර, බුද්ධිය ලබාදීමේ මෙහෙය ආණ්ඩුව සලකන්නේ එහි අරමුණ කියාය." ඉතින් ආණ්ඩුවට මේ සියල්ල කරගත නොහැකි කල, එවිට කුමක්වේද? සෑම අසාර්ථක ආණ්ඩුවක් පසුපසින්ම -මෙය නොවැළැක්විය හැකිවීම කණගාටුදායකය- එවිට නොවේද එවැනිම නොවැළැක්විය හැකි වූ විප්ලවයක් හඹා එන්නේ?

# දේශපාලනය සහ අර්ථශාස්ත්‍රය

දැන් අපි හැරෙමු මේ නිබන්ධනය ආරම්භයේ දී කෙටියෙන් සඳහන් කරන ලද්දා වූ විෂයයකට. දේශපාලනය සහ අර්ථශාස්ත්‍රය -නොහොත් දේශපාලන අර්ථශාස්ත්‍රයට.

**බැස්ටියාට් විසින් පහත සඳහන් මුල් වාක්‍ය තුනේ අදහස් තව පැහැදිලි කිරීම පිණිස පොත් 3 ක් ද, ලියැවිලි ගණනාවක් ද සපයා ඇත.

දේශපාලන ශාස්ත්‍රයක් හදන්නට පෙර අර්ථශාස්ත්‍රයක් හදාගත යුතුයි. ඉඳුරා කියතොත්, මිනිස් උවමනාවන් නිසා සමගිය ඇතිවෙන්නේ ද නැත්නම් අසමගිය ඇතිවෙන්නේ ද යන්න පැහැදිලිවම තීරණය කරන්නා වූව අර්ථශාස්ත්‍රයයි. ආණ්ඩුවේ නිවැරදි ක්‍රියාකලාපය තීරණය කරනු සඳහා දේශපාලන ශාස්ත්‍රයක් ගොඩනඟන්නට පෙර ඉහත කාරණය සොයා පැහැදිලි කරගත යුතුවේ.

අර්ථශාස්ත්‍රයක් හදාගත් වහාම, දේශපාලන ශාස්ත්‍රයක් ආරම්භයේ දී ම, මේ ඉතා වැදගත් ප්‍රශ්නයට පිළිතුර සොයාගත යුතුවේ: නීතිය නම් කුමක්ද? එය කුමක් විය යුතුද? එහි විෂය ප්‍රමාණය කුමක්ද? එහි සීමාවන් මොනවාද? තර්කානුකූලව, නීති සම්පාදකයන්ගේ යුක්ති සහගත බලය නවතින්නේ කොතැනක දී ද?

මීට පිළිතුරු දෙන්නට මම පසුබට නැත: නීතිය නම් අයුක්තියට එරෙහිව පනවන බාධකයක් ලෙසින් සංවිධානාත්මක ලෙසින් පාවිච්චි කරන පොදු බලයකි. කෙටියෙන් කිවහොත් නීතිය නම් යුක්තියයි.

# නීති සම්පාදනයේ නිසි කාර්යය

අපේ ජීවිතයට සහ දේපලවලට බලපාන අන්දමකින් පරම සර්වබලධාරීත්වයක් ව්‍යවස්ථාදායකයාට ඇතැයි කීම සත්‍යයක් නොවන්නේද? පුද්ගල ජීවිතය සහ දේපල හි පැවැත්ම ව්‍යවස්ථාදායකයාට කළින් පැවති දේවල් වෙති. ඔහුගේ කාර්යය වූයේ මේවායේ ආරක්ෂාව සහතික කිරීම පමණි.

අපගේ සිහිබුද්ධියට, අපේ අදහස්වලට, අපේ අභිප්‍රායයන්ට, අපේ අධ්‍යාපනයට, අපේ මතවාදයන්ට, අපේ රැකියාවලට, අපේ වෙළඳාමට, අපේ කුසලතා වලට, අපේ ප්‍රීතියට යනාදීන්ට රෙගුලාසි පැනවීම නීතියේ කාර්යය යැයි කීම වැරදියි. නීතියේ කාර්යය නම් මේ අයිතීන්

ක්‍රියාත්මක කරන්නට ඇති නිදහස ආරක්ෂා කිරීමයි. මේ අයිතීන් ක්‍රියාත්මක කරන්නට ඇති නිදහසට බාධා පමුණුවන ඕනෑම අයෙකුට එයට ඉඩක් නොදීමයි.

ඉතින් බලය පාවිච්චිය නීතියට අත්‍යාවශ්‍ය වූවක් නිසා, එහි නීත්‍යානුකූල විෂය පථය වන්නේ බලය පාවිච්චිය අත්‍යාවශ්‍ය වූ පරිශ්‍රයන්හි දී පමණි. යුක්තිය යනු එයයි.

නීත්‍යානුකූල ආත්මාරක්ෂාව සඳහා සෑම පුද්ගලයෙකුටම බලය පාවිච්චියට අයිතියක් ඇත. ඉතින් මේ හේතුව නිසා පමණක් සාමූහික බලය -එනම් ඒකීය බලයේ සංවිධානාත්මක වූ සංයෝජනය- නීත්‍යානුකූලව එම අරමුණ සඳහාම යොදාගත හැකිය; එසේම එය වෙනත් කිසිම අරමුණක් සඳහා නීත්‍යානුකූලව යොදාගත නොහැකිය.

## නීතිය සහ පුණ්‍යාධාර යන්න එකම දෙය නොවේ

නීතියේ පරමාර්ථය යනු පුද්ගලයන් පීඩනයට පත්කරමින්, එය ත්‍යාගශීලී චේතනාවකින් යුතුව කරන ලද ක්‍රියාවක් වුවද, ඔවුන්ගේ දේපල කොල්ලකෑම නොවේ. නීතියේ පරමාර්ථය නම් පුද්ගලයන් සහ දේපල ආරක්ෂා කිරීමයි.

තව දුරටත් පැහැදිලි කරන්නේ නම්, පුද්ගලයන් පීඩනයට පත් නොකරන්නේ සහ ඔවුන්ගේ දේපල කොල්ලකන්නේ නැත්නම් නීතියේ පුණ්‍ය චේතනාවක් ඇත්තේ කියා ද කිව නොයුතුයි. එය එවිට පරස්පර විරෝධී වූ කියමනක් වෙයි. පුද්ගලයන්ට සහ දේපල වලට යම් බලපෑමක් කිරීමෙන් වැළකී සිටින්නට නීතියට නොහැකිය. ඉතින් නීතිය ඒවා ආරක්ෂා කරනවා වෙනුවට වෙනත් ඕනෑම ලෙසකින් කටයුතු කරන්නේ නම් එවිට එම ක්‍රියා යනු පුද්ගලයන්ට සහ දේපල වලට ඇති ඔවුන්ගේ අයිතිය අත්‍යාවශ්‍යයෙන්ම කඩාකප්පල් කිරීමකි.

නීතිය යනු යුක්තියයි. එය සරල වූ ද, පැහැදිලි වූ ද, නියත වූ ද, සීමිත වූ ද වෙයි.

සෑම ඇසකටම එය දැකිය හැකියි. සෑම මනසකටම එය වටහාගත හැකියි. යුක්තිය යනු මැන බැලිය හැකි වූවකි. අවිකාර්ය හෙවත් වෙනස්කළ නොහැකි වූවකි. වෙනස්වන සුළු ද නොවන්නකි. යුක්තිය යනු මීට වඩා වැඩි වූ හෝ මීට වඩා අඩු වූ හෝ දෙයක් නොවේ.

ඔබ එහි නිසි සීමාව ඉක්මවා ගියොත් -නීතිය ආගමික කරන්නට, සහෝදරත්වයෙන් වූවක් කරන්නට, සමානාත්මතාවයෙන් වූවක් කරන්නට, පුණ්‍ය ආකාරයකින් වූවක් කරන්නට, කාර්මික හෝ සාහිත්‍ය හෝ කලාත්මක බැවින් හෝ වූවක් කරන්නට,- එවිට ඔබ නොමිනු සංදර්භයක, එනම් අවිනිශ්චිත සහ අපැහැදිලි වූ, බලහත්කාරයෙන් දෙන උතෝපියාවක, එහෙම නැත්නම්, තවත් අයහපත් වූ, නීතිය අල්ලාගෙන එය ඔබ වෙත පාවිච්චි කර්නට වෑයම් ගන්නා බහුවිධ උතෝපියාවන්හි, අතරමං වෙනු ඇත. මෙය සත්‍යය වන්නේ යුක්තිය මෙන් නොව සහෝදරත්වය සහ පුණ්‍ය කටයුතු සඳහා නියත සීමාවක් යැයි කියා දෙයක් නොමැති නිසාය. පටන් ගත්විට, ඔබ නවතින්නේ කොතැනකින්ද? එවිට නීතිය එහි නවත්වාගන්නේ කොතැනකද?

# කොමියුනිස්ට්වාදයට ගමන් කරන ඉහළ පාර

ද සාන්ත-ක්‍රික් මහතා ඔහුගේ පුණ්‍යාධාර ඉදිරිපත් කරන්නේ සමහර කර්මාන්ත පිරිස්වලට පමණි. ඔහු නීතියෙන් ඉල්ලා සිටිනු ඇත්තේ නිෂ්පාදකයන්ට වාසි ලැබෙනු පිණිස පාරිභෝගිකයා පාලනය කරන්න කියාය.

කන්සිඩරන්ට් මහතා තම සහයෝගය දෙනු ඇත්තේ වෘත්තීය සංවිධාන වලටය. ඔහු නීතිය පාවිච්චි කරන්නේ ඔවුන් වෙනුවෙන් අවම ඇඳුම් පැළඳුම්, නිවාස, ආහාර සහ අනෙකුත් ජීවන අවශ්‍යතා සහතික කරනු පිණිසය.

ලුවි බ්ලාන් මහතා කියනු ඇත්තේ -හේතු සහිතව- සහෝදරත්වය සම්පූර්ණ කරනු පිණිස මේවා අවම සහතිකයන්හි ආරම්භය පමණක් කියාය. තව දුරටත් ඔහු කියනු ඇත්තේ නීතිය මඟින් සියලු වැඩ

කරන ජනතාවට නොමිලේ අධ්‍යාපනය සහ නිෂ්පාදන උපකරණ සපයන්නට අවශ්‍ය යැයි කියාය.

තවත් අයෙක් මේ සංවිධානය දිහා බලා, සමානාත්මතාවය තවත් වැඩි කිරීමට තවත් දේ කළ හැකි යැයි කියනු ඇත. නීතිය මඟින් සියල්ලන්ටම -කිසිවකුටත් යා නොහැකි කුඩා ගමටද- සුඛෝපභෝගී දේවල්, සාහිත්‍ය, කලා යනාදිය සැපයිය යුතු යැයි කියනු ඇත.

මේ සියලු යෝජනා කොමියුනිස්ට්වාදයට යන ඉහළ පාරයි. රෙගුලාසිකරණය යනු එවිට -සත්‍යයෙන්ම දැනටමත් එසේ පැනවී ඇත- සියල්ලන් විසින්ම ගිජුකමෙන් හා සිහින මවන අන්දම අනුව සටන් වදින යුද පිටියක් වෙයි.

# ස්ථාවර ආණ්ඩුවක පදනම

නීතිය යනු යුක්තියයි. මේ ප්‍රමේයය ඇතුලත සරල වූ සහ චිරස්ථායී වූ ආණ්ඩුවක් පිහිටුවා ගත හැකිය. අයුක්තිය යටපත් කරන්නට පමණක් සීමාවූ සංවිධානාත්මක බලයක් පමණක් ඇති රටක, විප්ලවයක්, කැරලි කෝලාහලයක්, යාන්තමකට හෝ උද්ඝෝෂණයක් ඇතිවෙන්නේ කෙසේදැයි පෙන්වා දෙන්නට මම ඕනෑම කෙනෙකුට අභියෝග කරමි.

එවැනි ආණ්ඩුවක් යටතේ, වඩාත්ම සවිසිරියෙන් පිරි තත්වයක්ද පවතිනු ඇත. එසේම එය වඩාත්ම සමානාත්මතාවය පැතිරෙන ලෙසින් බෙදී ගොස් තිබෙනු ද දැකිය හැකිය. මිනිස් ස්වභාවයෙන් වෙන්කළ නොහැකි දුක ගැන සලකද්දී, කිසිම කෙනෙක් ඒ ගැන ආණ්ඩුවට දොස් කියනු නැත. මෙය සත්‍යයක් වන්නේ, ආණ්ඩුවේ බලය අයුක්තිය යටපත් කරන්නට පමණක් යොදා ගැනෙන නිසා, එවිට මෙවැනි ශෝචනීය අවස්ථා ඉදිරියේ ආණ්ඩුව අහිංසක වෙයි. හරියට කාලගුණික වෙනස්කම් වලට ආණ්ඩුවට චෝදනා කරන්නට නොහැකි ලෙසින්මයි.

මෙම ප්‍රස්තුතයේ සත්‍යතාවය පෙන්වන සාක්කියක් විදියට මේ ප්‍රශ්නය විමසන්න: වැඩි පඩි ඉල්ලා, නොමිලේ ණය ඉල්ලා, නිෂ්පාදන

උපකරණ ඉල්ලා, වාසිදායක තීරු බදු ඉල්ලා, ආණ්ඩුවෙන් රස්සාවල් ඉල්ලා කිසිම අයෙක් ඇපැල් උසාවියේ දී උද්ඝෝෂණ පවත්වා තියෙනවාද? සාම විනිසුරු කාර්යාලයකට පහර දී තියෙනවාද?

හැමෝම දන්නවා ඉහත සඳහන් කටයුතු සඳහා අධිකරණ බලයක් ඇත්තේ ඇපැල් උසාවියකට හෝ සාම විනිසුරුවෙකුට නොවන බව. ඉතින් ආණ්ඩුවක් එහි නිසි කාර්යයට සීමා වුවහොත්, සියල්ලන්ම වැඩි කලක් යන්නට පෙර, ඉහත සඳහන් කටයුතු සඳහා නීතිය තුල පවතින අධිකරණ බලයක් නැතැයි කියා ඉගෙන ගනීවි.

ඒත් සහෝදරත්වයේ නාමයෙන් නීති හදන්න ගියොත්, -සියලු හොඳ සහ සියලු නරක ඉෂ්ට වෙන්නේ නීතිය අනුව යැයි කියමින්; අපේ ඒකීය පුද්ගල වූ ශෝචනීය සිදුවීම් වලට වගකිව යුත්තා නීතිය යැයි කියා; අපේ සියලු සමාජ අසමානාත්මතා වලට වගකිව යුත්තේ නීතිය යැයි කියා- එහෙනම් එතකොට නොනැවතී ගලා එන පැමිණිලි, නොරිස්සුම්, කරදර සහ විප්ලවයන්ට දොර සදා විවෘතයි.

# යුක්තිය යනු සම අයිතීන් වෙති

නීතිය යනු යුක්තියයි. එයට වඩා වෙනස් වූවක් වන්නට නීතියට නිසි ලෙසින් හැකිනම් එය පුදුමයක් වනු ඇත! යුක්තිය නම් නිවැරදි වූව නොවන්නේද? අයිතීන් යනු සමානාත්මතාවයෙන් යුතු වූවක් නොවන්නේද? මිමරෙල් මහතා, ද මෙලුන් මහතා, තියෙර්ස් මහතා හෝ ලුවි බ්ලාන් මහතා නීතියෙන් ලැබෙන මොන අයිතියකින්ද මට ඔවුන්ගේ සමාජ සැලසුම්වලට අනුකූල වන්නට කියන්නේ? මෙය කරන්නට ආචාර ධාර්මික වූ අයිතියක් නීතියකට ඇත්නම්, එහෙනම් ඇයි නීතියට බැරි මේ මහත්වරුන්ට මගේ සැලැස්මට අනුකූල වෙන්න යැයි කියාත් කියන්නට? ස්වභාව ධර්මයා විසින් උතෝපියාවක් ගැන හැකි පමණින් සිහින මවන්නට මටත් ඇති පමණින් හැකියාවක් දී නැතැයි කියා තර්කානුකූලව කියත හැකිද? නීතිය විසින් බොහෝ ෆැන්ටසි අතරින් එකක් පමණක් තෝරාගෙන, එයට පමණක් ආණ්ඩුවේ සංවිධාන වූ බලය ලබාදිය යුතුද?

නීතිය යනු යුක්තියයි. මේ සංකල්පය යටතේ, -නිතරම අහන්නට ලැබෙන පරිදි- නීතිය අදේවවාදී වේයැයි කියා, ස්වාර්ථාවාදී වේයැයි කියා, හෘදය සාක්ෂියකින් තොරවේ යැයි කියා, නීතිය විසින් මිනිස් සංහතිය එහි ප්‍රතිබිම්බයෙන් තනනු ඇතැයි කියා, කියන්නට ඉඩ නොදෙන්න. එය අභූත වූ තීන්දුවකි. එය, නීතිය නම් මිනිස් සංහතිය යැයි කියමින් ආණ්ඩුවට වන්දනා මාන කරන අයට පමණක් සුදුසු වූවකි.

විලම්බීතයකි! ආණ්ඩුවට වන්දනා මාන කරන අය විශ්වාස කරනුයේ නිදහස් පුද්ගලයන් යනු ක්‍රියාවන් සියල්ල නවතා දමා ඇති අය කියාද? නීතියෙන් කිසිත් ජවයක් ලැබෙන්නේ නැත්නම් අපිට කිසිත් ජවයක් ලැබෙන්නේ නැතැයි කියා ගම්‍ය වෙනවාද? අපේ ඉන්ද්‍රියයන් නිදහස් ලෙසින් භාවිතා කරන්නට අපට අවසර ලැබුණ පමණින් අපට අපේ ඉන්ද්‍රියයන් භාවිතයට නොහැකි වෙනවා කියා ගම්‍ය වෙනවාද? සමහර ආගම්, සමහර සබඳතා, සමහර අධ්‍යාපන ක්‍රම, සමහර ශ්‍රම රෙගුලාසි, එහෙම නැත්නම් සමහර වෙළඳ රෙගුලාසි, සමහර පුණ්‍යාධාර කටයුතු කරන්නට නීතියෙන් අපට බලකරන්නේ නැත්නම් එයින් අදහස් වෙන්නේ අපි ඉතා කැමැත්තෙන් අදේවවාදයට, තපස්බවට, නූගත්කමට, දොම්නසට සහ ගිජු බවට පත්වෙනවා කියාද? අපි නිදහස් නම්, කොහෙන්ද කියැවෙන්නේ අපිට තව දුරටත් දෙවියන්ගේ බලය හෝ හොඳ හඳුනාගන්නට හැකියාව නැතිවෙනවා කියා? අනික් අය ඇසුරු නොකර, එකිනෙකාට උදව් නොකර, අපේ අවාසනාවන්ත සහෝදරයන්ට කරදරයක දී සහනයක් නොදී සිටිනවා හෝ ආදරය නොකර, ස්වභාව ධර්මයේ රහස් ඉගෙන නොගෙන, අපේ හැකියාවන් හැකි පමණින් දියුණු කරගන්නට උත්සාහයක් නොගෙන ඉන්නවා යැයි එයින් කියැවෙනවාද?

# උදාරත්වයට සහ ප්‍රගතියට යන මාර්ගය

නීතිය යනු යුක්තියයි. සෑම මනුෂ්‍යයෙක්ම තමන්ගේ සත්‍ය අගය සහ තම පැවැත්මේ සත්‍ය උදාරත්වය සාක්ෂාත් කරගන්නේ යුක්ති සහගත වූ නීතිය -අයිතීන් ප්‍රමුඛ වූ පාලනය; නිදහස, ආරක්ෂාව, චිරස්ථායී බව, සහ වගකීම- යටතේය. යුක්තිය සාධනය කරන මේ නීතිය

යටතේ පමණක් -හෙමින් සිද්ධ වුවත් අනිවාර්යයෙන්ම සිද්ධ වෙන- දෙවියන්ගේ සැලැස්ම වූ ක්‍රමවත් බවින් යුතු සාමකාමී ප්‍රගතියක් මිනිස් සංහතියට සාක්ෂාත් කරගත හැකිය.

මෙය සැලකිල්ලට ගැනෙන කුමන විෂය පථයක දී වුවද, -එය ආගමික, දාර්ශනික, දේශපාලනික, හෝ ආර්ථික වුවද; එය සෞභාග්‍යය, සද්ගුණය, සමානාත්මතාවය, අයිතිය, යුක්තිය, ප්‍රගතිය, වගකීම, එකමුතුව, දේපල, ශ්‍රමය, වෙළඳාම, මූලධනය, වේතන, බදු, ජනගහණය, මුදල්, හෝ ආණ්ඩුව යනාදී ඕනෑම එකක්- මෙය සැලකිල්ලට ගැනෙන මගේ විද්‍යාත්මක ගවේෂණයේ කුමන අවස්ථාවක දී වුවද, මම එළඹෙන මේ නිගමනය නීත්‍යානුකූලව නිවැරදි යැයි මට පෙනී යයි. ඒ නිගමනය මෙයයි: නිදහස තුල මිනිස් සබඳතා අතර ගැටළු සඳහා විසඳුම සොයාගත හැකියාව ඇත.

# අදහසකින් පෙන්වන සාක්ෂි

ඒ කතාව මෙයින් ඔප්පු කරනවා නොවේද? මුළු ලෝකය දිහා බලන්න. වැඩියෙන් සාමකාමී, වැඩියෙන්ම සද්ගුණවත්, වැඩියෙන්ම සතුටින් ජනතාව ඉන්නේ මොන රටවල්වල ද? එවැනි ජනතාව සොයාගත හැකියාව ඇත්තේ පෞද්ගලික කටයුතු වලට අඩුවෙන්ම ඇඟිලි ගහන රටවල් වලින්; ආණ්ඩුවක් ඇතැයි අඩුවෙන්ම දැනෙන රටවල් වලින්; ඒකීය පුද්ගලයෙකුට වැඩියෙන්ම අවකාශයක් ඇති ඇති රටවල් වලින්, නිදහස් මතයක ඉන්නට වැඩියෙන්ම බලයක් ලැබෙන රටවල් වලින්; වඩාත්ම සරල වූ සහ රාජ්‍ය පරිපාලන කටයුතු අඩුවෙන්ම සිද්ධ වෙන රටවල් වලින්, බදු ඉතාමත් අඩු සහ හැමෝගෙන්ම එක හා සමාන ලෙසින් අය කෙරෙන රටවල් වලින්; පොදු අප්‍රසාදය ගැන වැඩි උනන්දුවක් නැති එය යුක්ති සහගත යැයි නොකියන රටවල් වලින්; ඒකීය පුද්ගලයන් සහ කණ්ඩායම් තම වගකීම් ක්‍රියාශීලී ලෙස බාරගන්නා රටවල් වලින්, ඉතින් ඒ නිසා, අසම්පූර්ණ යැයි පිළිගන්නා මිනිසුන්ගේ සද්ගුණයන් නිතරම දකින්නේ දියුණු රටවල් වලින්; වෙළඳාමට, ජනතාවට එකතුව ගැවසීමට, සහ සංවිධාන ඇති කරගන්නට අවසරයට බාධා ඉතාමත් අඩුවෙන් ඇති රටවල් වලින්; ශ්‍රමය, මූලධනය, සහ ජනගහණය විස්ථාපනයෙන් දුක්

ගැහැට විඳීම වඩාත්ම අඩුවෙන් ඉඩකඩ ඇති රටවල් වලින්; මිනිසා සිය සහජ අභිප්‍රායයන් සොයා යන්නට වැඩියෙන්ම උත්සාහයක් ගන්නා රටවල් වලින්; මිනිසාගේ නවෝත්පාදන දෙවියන්ගේ නීති සමඟ වඩාත්ම සුසංවාදී ලෙසකින් සිද්ධ වෙන රටවල් වලින්; කෙටියෙන් කියතොත්, වඩාත්ම සතුටින් ඉන්න, වඩාත්ම ගුණ ගරුක වූ, වඩාත්ම සාමකාමී වූ ජනතාව නම් මේ සිද්ධාන්තය නිතරම පාහේ අනුගමනය කරන අයයි: මිනිසා සර්ව සම්පූර්ණ නැති වුවත්, තවමත්, සියලු බලාපොරොත්තු රඳන්නේ අයිතීන් නම් වූ සීමාව තුල පුද්ගලයන්ට නිදහසේ සහ සිය කැමැත්ත අනුව ක්‍රියාකරන්නට ඉඩක් ලැබෙද්දීය. නීතිය හෝ බලය යොදාගත යුත්තේ වෙන කිසිවකට නොවේ. සර්ව යුක්තිය පරිපාලනයට පමණකි.

# අනුන්ව පාලනය කරගෙන සිටීමේ කැමැත්ත

මෙය කිව යුතුය: "ශ්‍රේෂ්ඨ" මිනිසුන් ලොව පමණට වඩා සිටිති. නීති සම්පාදකයන්, සංවිධාකයන්, හොඳ හිතැති අථ්‍යය යථාරූපී නොවූ දානපතියන්, ජනතා නායකයන්, ජාතියේ පියවරුන්, මෙහෙම මෙහෙම යැයි කියාගන්නා අය. අවශ්‍ය පමණට වඩා වැඩි පිරිසක් තමන්ව මිනිස් සංහතියට වඩා ඉහළින් තබා ගනිති. ඔවුන් ඒ සඳහා කරන සංවිධානය, තමන්ගේ හා වැයමේ ලොකුකම් කියා පෑම, අනුන් පාලනය යනාදිය තම වෘත්තිය කරගනිති.

ඉතින් අයෙක් කියනු ඇත: "ඔබත් කරන්නේ එයම නොවේද?"

සත්‍යයකි. එහෙත් මම ක්‍රියාකරන්නේ සම්පූර්ණයෙන්ම වෙනත් හැඟීමකින් බව කිව යුතුය. මම ප්‍රතිසංස්කරණවාදීන් යැයි කියාගන්නවුන් අතරටම එක්වී ඇත්තෙමි. එහෙත් ඒ එකම අරමුණක් සඳහා පමණි. වැනකෝසන් විසින් තම යාන්ත්‍රීකරණය දිහා බැලූ අන්දමින් මම ජනතාව දිහා බලන්නේ නැත. කායික විද්‍යාඥයෙක් මිනිස් සිරුර ඇති ආකාරයෙන් බාරගන්නා විදියට, මම බාරගන්නේද මිනිසුන් ඔවුන් සිටින ආකාරයෙන්මය. මගේ කැමැත්ත ඔවුන් අධ්‍යයනය කරන්නට සහ ඔවුන් අගය කරන්නට පමණි.

සියලු ජනතාව ගැන මගේ ගති ස්වභාවය, ප්‍රශංසාවට පත්වී ඇති දේශාටකයෙකුගේ මේ කතන්දරය ගෙනහැර පා පහදන්නම්: ඔහු දවසක් පිවිසියේ අලුත උපන් දරුවෙක් ඉන්නා මිලේච්ඡ ගෝත්‍රික කණ්ඩායමක් මැද්දටය. අනාවැකි කියන්නෝ, මැජික් සංදර්ශන දක්වන්නෝ, හොර වෙද්දු: -වළලු, මුදු, කොකු සහ ලණු ඇතිව- දරුවා වටකරගෙන සිටියහ.

"මේ දරුවා කිසිදා සාම-පයිප්පයක සුවඳ නොදනීවි, මම ඔහුගේ නාස්පුඩු දික්කළේ නැත්නම්," යැයි අයෙක් කීය.

"ඔහුගේ කන් ඔහුගේ උරහිස දක්වා දිගට මම ඇද්දේ නැත්නම් ඔහුට කිසිවක් ඇහෙන්නේ නැතිවේවි," තවත් අයෙක් කීය.

"මම ඔහුගේ ඇස් හැදුවේ නැත්නම් ඔහු කිසිදාක සූර්යයාලෝකය දකින්නේ නැතිවේවි," තුන්වැන්නා කීය.

"මම ඔහුගේ කකුල් නැව්වේ නැත්නම් ඔහු කිසිම දවසක කෙළින් හිටගන්නේ නැතිවේවි," හතරවැන්නා කීය.

"මම ඔහුගේ ඔළුකට්ට සමතලා කළේ නැත්නම් ඔහු කිසිම දවසක හිතන්න දන්නේ නැතිවේවි," පස්වැනියා කීය.

"නවතින්න," දේශාටකයා කෑ ගැසීය. "දෙයියො හදපු ටික හොඳට හදලා ඇත්තෙ. ඔහුට වඩා දන්නවා යැයි කියන්න එපා. මේ දුර්වල සත්වයාට දෙයියෝ විසින් ඉන්ද්‍රියයන් දීලා තියෙන්නෙ; ඒවාට ව්‍යායාම වලින්, පාවිච්චියෙන්, අත්දැකීම් වලින් සහ නිදහසෙන් වැඩි වර්ධනය වෙලා ශක්තිමත් වෙන්නට ඉඩදෙන්න."

# ඉතින් දැන් අපි නිදහසට උත්සාහයක් ගනිමු

දෙවියන් විසින් මිනිසාට තම ඉරණම සපුරාගන්නට අවශ්‍ය සියල්ල ලබා දී ඇත. මිනිස් ස්වභාවයක් මෙන්ම සමාජ ස්වභාවයක් ද දායාද කර ඇත. නිදහසේ පිරිසිදු වායුවෙන් පුද්ගලයාගේ මේ සමාජ

ඉන්ද්‍රියයන් සුසංයෝගීව වැඩෙන්නට හැකි පරිද්දෙන් ඒවා නිර්මාණය වී ඇත. එහෙනම් යවන්න අහකට මේ හොර වෙද්දු සහ සංවිධාකයන්ව! දාන්න අහකට මේ අයගේ මුදු, මාල, කොකු සහ ඩැහි අඬු! දාන්න අහකට ඔවුන්ගේ කෘතිම සැලසුම්! දාන්න අහකට රාජ්‍ය පරිපාලකයන්ගේ හිතුමතයට කරන වැඩ, ඔවුන්ගේ සමාජවාදී ව්‍යාපෘති, ඔවුන්ගේ මධ්‍යගත සැලසුම්, ඔවුන්ගේ තීරු බදු, ඔවුන්ගේ රජයේ පාසැල්, ඔවුන්ගේ රජයේ ආගම්, ඔවුන්ගේ නොමිලේ දෙන ණය, ඔවුන්ගේ බැංකු මොනොපොලි, ඔවුන්ගේ රෙගුලාසි, ඔවුන්ගේ සීමාබාධක, ඔවුන්ගේ බදු ක්‍රමයෙන් කරනවා යැයි කියන සමානාත්මතාවය, සහ ඔවුන්ගේ උදාර චේතනා ගැන පාරට්ටු බෑම!

ඉතින් දැන් ව්‍යවස්ථාදායකයන් සහ හොඳ හිතැති අතථ්‍ය යථාරූපී නොවූ දානපතියන් අසාර්ථක ලෙසින් සමාජයට කොතරම් ප්‍රමාණයක් සැලසුම් හදා තිබුණද, අවසානයේ දී, ඔවුන් පටන් ගත යුතු තැනින් ඔවුන් නැවතේවා: සියලු සැලසුම් ඔවුන් අතින් ප්‍රතික්ෂේප වී නිදහසට අවස්ථාවක් ලැබේවා; නිදහස යනු දෙවියන් සහ දෙවියන්ගේ ක්‍රියා කලාපය පිළිදැනුමයි.

www.arunishapiro.wordpress.com